NCE Sri Lanka — Voice of the Exporter

Verité Research — Strategic Analysis for Asia

Lanka Fruit & Vegetable Producers, Processors & Exporters Association



# ඉන්දියාව සමග වෙළඳාම වැඩිදියුණු කිරීම සඳහා

## අනුකූලතා තක්සේරුව අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම

# ඉන්දියාව සමඟ වෙළෙඳාම වැඩි දියුණු කිරීම සඳහා

## අනුකූලතා තක්සේරුව අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම

2016 පෙබරවාරි

ලංකා පලතුරු හා එළවළු නිෂ්පාදකයින්ගේ, සැකසුම්කරුවන්ගේ හා අපනයනකරුවන්ගේ සංගමයේ (Lanka Fruit and Vegetables, Producers, Processors and Exporters (LFVPPEA)) සහ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලයේ (NCE) උපකාරය ඇතිව මේ තත්ත්ව පත්‍රිකාව සකස් කරන ලදී. පර්යේෂණයේදී මාර්ගෝපදේශ සැපයීමෙන්, සම්මුඛ සාකච්ඡා සඳහා පහසුකම් සැපයීමෙන් හා සාකච්ඡා අවස්ථාවලට සහභාගි වීමෙන් මේ කාර්යයේදී ලබා දෙන ලද තාක්ෂණික උපදේශනය වෙනුවෙන් Verité Research (VR), LFVPPEA සහ NCE ආයතනවලට ස්තුතිය පළ කරයි.

Verité Research ආර්ථික පර්යේෂණ කණ්ඩායම මේ අධ්‍යයනය සිදු කළේය. සුභාෂිණී අබේසිංහ (ආර්ථික පර්යේෂණ ප්‍රධානි), මාලතී නයිට් යන දෙදෙනාගේ සමස්ත පර්යේෂණ සහ අධීක්ෂණ සහාය ඇතිව විද්‍යා නැතැනියෙල් සහ හස්නා මුනාස් යන අය මෙම පර්යේෂණය සිදු කරන ලදී.

පිටකවරයේ සැකැස්ම (www.paullachine.com)

කලාපය තුළ සමාජ සංවර්ධනය උදෙසා සංවාදය හා අධ්‍යාපනය ද ප්‍රවර්ධනය කරන අතර ආසියාවේ සාකච්ඡා හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු හා විශ්ලේෂණය ලබා දීමේ ප්‍රමුඛයකු බවට පත්වීම Verité Research හි ඉලක්කය වේ. ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලනය, නීතිය සහ මාධ්‍යය යන ක්ෂේත්‍ර තුළ පර්යේෂණය හා සංවාදය උදෙසා ක්‍රියාකාරී ලෙස දායක වන සමාගම දත්ත රැස් කිරීම, තොරතුරු සැපයීම, උපාය මාර්ග සංවර්ධනය සහ තීරණ විශ්ලේෂණය යන සේවා සපයයි.

විද්‍යුත් තැපැල: publications@veriteresearch.org

හිමිකම් සහතිකය © 2015 Verité Research Pvt Ltd.

සියලු හිමිකම් ඇවිරිණි. ලැබිය යුතු අය සඳහා පමණක් වන අතර ඪැරසළුඞී සෑැ්රජය පෞද්ගලික සමාගමේ අවසරයකින් තොරව වැඩිදුර බෙදාහැරීම සඳහා නොවේ.

# පටුන


කෙටි යෙදුම් .......... 4

විධායක සම්පිණ්ඩනය .......... 6

ක්‍රමවේදය සහ සීමා .......... 9

හැඳින්වීම .......... 11

පළමු පරිච්ඡේදය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආහාර වෙළෙඳාම කෙරෙහි තීරුබදු නොවන බාධකවල - (NTBs) බලපෑම .......... 13

2.2. ඉන්දුවෙළෙඳාම කෙරෙහි වන බලපෑම : ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම- .......... 13

2.2. ප්‍රමිතීන් අවශ්‍ය ද? ඒවා වෙළෙඳාමට බාධක වන්නේ ද? .......... 14

2.2. ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට ආහාරපාන අපනයනය කරන්නන් : .......... 16

1..1. ඉන්දියාව සමඟ ආහාර අපනයන වෙළෙඳාම සමාලෝචනයක් : .......... 16

1..2. අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග (CAPs): ආහාර අපනයන සඳහා තීරුබදු නොවන බාධකයන් .......... 18

1.4. අනුකූලතාව පහසු කිරීම සඳහා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර දැනට පවතින ගිවිසුම් .......... 20

දෙවැනි පරිච්ඡේදය අනුකූලතාව හා බැඳුණු තීරුබදු නොව –න බාධක සම්බන්ධයෙන් යෝජිත විසඳුම් .......... 22

2.1. ප්‍රමිතීන් සුසංගත කිරීම් .......... 23

2.2. සමානතා ගිවිසුම් .......... 25

2.3. විදේශීය නිෂ්පාදකයා ප්‍රතීතනය කිරීම) බලය පැවරීම( .......... 26

2.4. අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල (CAPs) අන්‍යෝන්‍ය පිළිගැනීම .......... 27

තුන්වැනි පරිච්ඡේදය ඉදිරිමග - .......... 31

3.1. ඉන්දියාව සමඟ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) ‘හොඳමවිසඳුම වන්නේ ඇයි ‘? .......... 31

3.2. අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක වන්නේ කෙසේද? .......... 33

3.3. ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ .......... 34

3.3.1. යෝජිත CEPA ගිවිසුමෙන් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (MRA) වෙන් කිරීම .......... 34

3.3.2. ක්‍රියාත්මක කිරීම සඳහා අදියර වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රවේශයක් අනුගමනය කිරීම .......... 35

3.3.3. අපනයන පරීක්ෂණ යෝජනාක්‍රමයක් ස්ථාපනය කිරීම ‘මණ්ඩලයක් / .......... 39

නිගමනය .......... 42

විමර්ශන .......... 44

'අ'ඇමුණුම .......... 47

'ආ'ඇමුණුම .......... 48

'ඇ'ඇමුණුම .......... 50

'ඉ'ඇමුණුම .......... 52

# වගු ලැයිස්තුව

1 වන වගුව - ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදිත සඳහා අදාළ වන ප්‍රමිති සහ රෙගුලාසි....................................................38

2 වන වගුව - ඉන්දියාවේ ආහාර නිෂ්පාදිතවලට අදාළ ප්‍රමිති හා රෙගුලාසි....................................................................38

# රූපසටහන් ලැයිස්තුව

1 වැනි රූප සටහන : ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට යවන ලද අපනයන (2000 – 2014)........................................14

3 වැනි රූපසටහන : අඩුපාඩු මඟහැරීම සඳහා යෝජිත විසඳුම්වල ප්‍රබලතා හා දුර්වලතා ..................................30

4 වැනි රූප සටහන : ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමේ යෝජිත ව්‍යුහය..........................................................................................33

5 වැනි රූපසටහන : ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි සඳහා අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් සඳහා අදියර වශයෙන් වූ ප්‍රවේශය...........................................................................35

6 වැනි රූප සටහන : ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේ පියවරෙන් පියවර ක්‍රියාමාර්ගය ..........................................................................................36

7 වැනි රූප සටහන : වෙළෙඳාම සඳහා ප්‍රමුඛතා නිෂ්පාදිත තේරීමේ නිර්ණායක ..............................................37

8 වැනි රූප සටහන : අපනයන පරීක්ෂණ නියෝජිත ආයතන දෙකක් අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (EIC)පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) ක්‍රියාත්මක වීම........................................................40

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AFAS | ඕස්ට්‍රේලියානු ධූමායන ප්‍රතීතන යෝජනා ක්‍රමය |
| APEC | ආසියා ශාන්තිකර ආර්ථික සහයෝගිතාව |
| APLAC | ආසියා ශාන්තිකර රසායනාගාර ප්‍රතීතන සභාව |
| AQCS | සත්ත්ව නිරෝධායන සහ සහතික කිරීමේ සේවා |
| AQIS | ඕස්ට්‍රේලියානු නිරෝධායන සහ පරීක්ෂණ සේවය |
| AQSIQ | චීන මහජන සමූහාණ්ඩුවේ තත්ත්ව අධීක්ෂණය, පරීක්ෂාව හා නිරෝධායනය පිළිබඳ පොදු පරිපාලනය |
| ASEAN | අග්නිදිග ආසියා ජාතීන්ගේ සංගමය |
| BAFRA | භූතාන කෘෂිකර්ම හා ආහාර නියාමන අධිකාරිය |
| BIS | ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය |
| CAB | අනුකූලතා තක්සේරු ආයතනය |
| CAP | අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටිය |
| CECA | විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම |
| CEPA | විස්තීර්ණ ආර්ථික හවුල් ගිවිසුම |
| DAH | ඉන්දියානු රජයේ සත්ත්ව පාලන, කිරිපට්ටි හා ධීවර දෙපාර්තමේන්තුව |
| DAPH | ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| DPQS | ඉන්දියානු රජයේ ජාතික අධීක්ෂණ, නිරෝධායන හා ගබඩා කිරීමේ අධ්‍යක්ෂ කාර්යාංශය |
| EIA | අපනයන පරීක්ෂණ නියෝජිත ආයතනය |
| EDB | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය |
| EIC | ඉන්දියාවේ අපනයන පරීක්ෂණ සභාව |
| EMC | විද්යුත් චුම්බක අනුකූලතාව |
| EU | යුරෝපා සංගමය |
| FSSAI | ආහාර සුරක්ෂිතතා ප්‍රමිති අධිකාරී ආයතනය |
| FTA | නිදහස් වෙළෙඳ ගිවිසුම |
| IIS | අපනයන පරීක්ෂණ යෝජනා ක්‍රමය |
| ILAC | ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතාව |
| ISFTA | ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම |

| | |
|---|---|
| INR | ඉන්දියානු රුපියල් |
| ITI | කාර්මික තාක්ෂණ ආයතනය |
| JAS | ජපාන කෘෂිකාර්මික ප්‍රමිති |
| LFVPPEA | ලංකා පලතුරු හා එළවලු නිෂ්පාදකයින්ගේ, සැකසුම්කරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමය |
| MAFF | ජපාන රජයේ කෘෂිකර්ම, වන සහ ධීවර අමාත්‍යාංශය |
| MAPA | බ්‍රසීල ෆෙඩරල් ජනරජයේ කෘෂිකර්ම, පශු සම්පත් හා ආහාර සැපයුම් අමාත්‍යාංශය |
| MFN | වඩාත් ම අනුග්‍රහලාභී ජාතිය |
| MoU | අවබෝධතා ගිවිසුම |
| MRA | අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම |
| NAB | ජාතික ප්‍රතීතන මණ්ඩලය |
| NABL | ඉන්දියානු රජයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර සඳහා වන ජාතික ප්‍රතීතන මණ්ඩලය |
| NOP | ජාතික කාබනික වැඩසටහන |
| NCE | අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය |
| NPQS | ශ්‍රී ලංකා ජාතික ශාක නිරෝධායන සේවය |
| NTB | තීරුබදු නොවන බාධක |
| OECD | ආර්ථික සහයෝගය සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය |
| RCA | අනාවරණය වූ තරගකාරී වාසිය |
| QI | ගුණාත්මක යටිතල ව්‍යුහය |
| RITP | සාපේක්ෂ හැඟවුම් වෙළෙඳ විභව්‍යතාව |
| SLAB | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය |
| SLSI | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| SPS | සනීපාරක්ෂාව සහ සත්ත්ව සනීපාරක්ෂාව |
| TBT | වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක |
| TI | තීරුබදු බලපෑම |
| USA | ඇමෙරිකා එක්සත් ජනපදය |
| USDA | එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| USFDA | එක්සත් ජනපද ආහාර හා ඖෂධ පරිපාලනය |
| WTO | ලෝක වෙළෙඳ ගිවිසුම |

# විධායක සම්පිණ්ඩනය

## හැඳින්වීම

පාරිභෝගිකයින්, පරිසරය, ශාක හා සත්ත්ව ජීවිතය ආරක්ෂා කිරීම වැනි නීත්‍යානුකූල පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා සියලුම රටවල් විසින් නිෂ්පාදන ප්‍රමිති හා නියාමනයන් පවත්වාගෙන යනු ලැබේ. අදාළ ප්‍රමිතිවලට හා නියාමනයන්ට අනුකූල වීම සනාථ කිරීම සඳහා නිෂ්පාදිත සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටීන් (CAPs) අනුගමනය කරනු ලැබේ. කෙසේ වුව ද, අනුකූලතා සනාථ කිරීම සඳහා වැය කරනු ලබන කාලය සහ පිරිවැය සාධාරණ නොවන්නේ නම් මේ ප්‍රමිති, නියාමන සහ අදාළ අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි වෙළෙඳාමට අනවශ්‍ය බාධකයක් විය හැකිය. එබැවින්, වෙළෙඳාම පහසු කරවීම උදෙසා එවැනි තීරුබදු නොවන බාධක (NTB) සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය ය.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමට හානිකර මූලික සාධකයක් වශයෙන් තීරුබදු නොවන බාධක වෙන්කොට හඳුනාගනු ලැබ තිබේ. එසේ වී ඇත්තේ 2000 වසරේ සිටම දෙරට අතර නිදහස් වෙළෙඳ ගිවිසුමක් (FTA) තිබියදී ය. තීරුබදු නොවන බාධක යනු පංගු සීමා කිරීම්, අපහසු සහ කාර්යක්ෂම නොවන දේශසීමා පටිපාටි, අවිධිමත් පරිදි ක්‍රියාත්මක වන රීති සහ රෙගුලාසි සහ විනිවිදභාවය හා වගවීම නොමැති වීම වැනි තීරු බදු නොවන අනෙකුත් සියලු ම ආකාරයේ වෙළඳ බාධකයන් ය. මෙවැනි තීරුබදු නොවන බාධක වෙළෙඳාමේ පිරිවැය ඉහළ නංවන අතර දේශීය නිෂ්පාදිත හා සැසඳීමේදී ආනයනික නිෂ්පාදිතවල තරඟකාරීත්වය පහළ දමයි. ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) බහුතරයක් වූ නිෂ්පාදිත සඳහා වන තීරු බද්ද ඉවත් කිරීමට කටයුතු කළ නමුත් තීරුබදු නොවන බාධක ඉවත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා විධිවිධාන ගිවිසුම තුළට අන්තර්ගත කර නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් තීරු බදු රහිත ප්‍රවේශයක් තිබුණ ද දෙරට අතර වෙළෙඳාම එය සතු විභව්‍යතාවට වඩා බෙහෙවින් පහළ මට්ටමක පවතී.

මේ වාර්තාවේදී අවධානය යොමු වනුයේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමට අවහිර ඇති කරන ප්‍රමිති සහ තාක්ෂණික රෙගුලාසිවලට අනුකූලතාව තහවුරු කිරීම හා බැඳුණු බාධක තේරුම් ගැනීමත්, එම ගැටලුවලට ඇති ප්‍රායෝගික විසඳුම් හඳුනාගැනීමත් කෙරෙහි ය.

## ගැටලුව

ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් පෙන්වා දෙනු ලැබ ඇති සැලකිය යුතු තීරුබදු නොවන බාධකයක් වී ඇත්තේ ඉන්දියාවට පිවිසෙන වරායේදී මුහුණ දෙනු ලබන ප්‍රමිති සහ තාක්ෂණික රෙගුලාසිවලට අනුකූලතාව තහවුරු කිරීම හා සම්බන්ධ ගැටලු ය. ගැටලුව පැන නඟින්නේ සමහර නිෂ්පාදන සම්බන්ධයෙන්, ඉන්දියාවෙන් පිටත පිහිටා ඇති අනුකූලතා තක්සේරු ආයතනවල (CABS) සහතික ඉන්දියාව පිළි නොගන්නා බැවිනි. ඉන්දියානු නිෂ්පාදන ප්‍රමිතිවලට සහ නියාමනයන්ට අනුකූල වීම පරීක්ෂා කිරීම සඳහා ඉන්දීය බලධාරීහු පිවිසුම් වරායේදී හැම භාණ්ඩ තොගයක් ම පරීක්ෂාවට ලක් කරති. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ප්‍රමාදයන්, අවිනිශ්චිතතාව සහ ගබඩා කිරීමේ පිරිවැය සහ ප්‍රමාද ගාස්තු පිරිවැය වැනි අනවශ්‍ය පිරිවැය ඉන්දියාව සමඟ සිදු කරනු ලබන වෙළෙඳාමට බාධකයක් වේ.

අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධකවල විවිධ පැති හඳුනාගැනීමට ප්‍රයෝජනවත් වන සිද්ධි අධ්‍යයනයක් වන්නේ ඉන්දියාවට යවනු ලබන සකස් කරන ලද ආහාර අපනයනයන් ය. ආහාර ආනයන

මත ඉන්දියාව විසින් පනවා ඇති සාමාන්‍ය තීරු බදු ප්‍රමාණයන් 30% ට වඩා ඉතා වැඩි ය. සමහර නිෂ්පාදන සඳහා වන තීරුබදු 100 - 150% තරම් ඉහළ විය හැකිය. මේ අනුව, HS කාණ්ඩ 16-21 යටතේ ඉන්දියාවට යවනු ලබන අපනයන සඳහා ශ්‍රී ලංකාවේ තීරුබදු රහිත ප්‍රවේශයට නිසා අනෙකුත් රටවලින් එන ආනයන සමග සැසඳීමේදී ශ්‍රී ලාංකික අපනයනවලට සැලකිය යුතු තරගකාරී වාසියක් ඉන්දියානු වෙළෙඳපොල තුළ පවතී.

මේ වාසි තිබුණත්, ඉන්දියාවට යවනු ලබන අපනයනවල මුලදී ගිවිසුම හේතුවෙන් ඇති වූ වර්ධනයේ ඉහළ යෑම තිරසාරව පවත්වාගෙන යෑම අභියෝගාත්මක වී තිබේ. උදහරණයක් වශයෙන්, ඉන්දියාවට යවන ලද සැකසූ ආහාර අපනයනයන් 2005 - 2011 කාලය තුළ ඇ. ඩොලර් මිලියනයේ සිට ඇ. ඩො. මිලියන 28 දක්වා ඉහළ ගියේය. කෙසේ වුව ද, එතැන් පටන් 2014 වන විට ආහාර අපනයන ඇ. ඩො. මිලියන 7 දක්වා පහත වැටුණි. මේ හා සැසඳීමේදී ලෝකයේ අනෙක් රටවලට යවන ලද සැකසූ ආහාර අපනයනයන් 2001 දී ඇ. ඩෙ. මිලියන 22.5 සිට 2011 දී ඇ. ඩො. මිලියන 178 දක්වා ස්ථාවරව වර්ධනය වී ඉන් පසු 2014 දී ඇ. ඩො. මිලියන 175 දක්වා මඳ වශයෙන් පහත වැටුණි. සැකසූ ආහාර අපනයනයන් ඉන්දියාවට යැවීමේදී පිවිසුම් වරායවලදී හැම භාණ්ඩ තොගයකින්ම නියැදුම් පරීක්ෂා කිරීම, ගබඩා කිරීමේ පිරිවැය සහ අනුකූලතා සහතික නිකුත් කිරීම ප්‍රමාද වීම් සැකසූ ආහාර අපනයනකරුවන් ඉන්දියාවට අපනයනයේදී මුහුණ දෙන බාධා වේ . එහි ප්‍රතිඵලයක් ලෙස කාලය හා පිරිවැය නිරවද්‍ය ලෙස පුරෝකථනය කිරීමේ නොහැකියාව නිසා ගැනුම්කරුවන් සොයා ගැනීම සහ රඳවා ගැනීම ද දුෂ්කර වී තිබේ.

අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි (CAPs) මගින් ඇතිවන තීරුබදු නොවන බාධක නිරවුල් කිරීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගිවිසුම් දෙකක් ඇතත් ඒ මගින් ගැටලුවට විසඳුමක් ලැබී නොමැත. 2002 දී ඉන්දියාවේ අපනයන පරීක්ෂණ සභාව (EIC) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) අතර වූ පළමු ගිවිසුමෙන්, EIC රසායනාගාර මගින් අදළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන ප්‍රමිතීන් අනුව පරීක්ෂා කරන ලද සහ සහතික කරන ලද ඉන්දියානු වෙළෙඳ භාණ්ඩ (ආහාර නිෂ්පාදන 50 ක් ඇතුළු) වැඩිදුර පරීක්ෂාවට ලක් නොකර ශ්‍රී ලාංකික වෙළෙඳපොළට ඇතුළු වීමට පහසුකම් සළසා දී තිබේ. එහෙත් ඉන්දියානු වෙළෙඳපොළට අවතීර්ණ වන ශ්‍රී ලාංකික නිෂ්පාදනවලට ඒ ප්‍රතිලාභය මෙම ගිවිසුම මගින් ලබා නොදෙයි. එබැවින් ගිවිසුමේ ප්‍රතිලාභ ලැබෙන්නේ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට අපනයනය කරන්නන්ට පමණි.

2006 දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය (BIS) අතර වූ ගිවිසුමකින් ආයතන දෙකේ ම ප්‍රමිතීන් අනුව සාම්පල පරීක්ෂා කිරීම හා සහතික කිරීම සඳහා අනෙක් පාර්ශ්වයේ හැකියාව පිළිගැනීමට විධිවිධාන සලසයි. මෙය ක්‍රියාත්මක කිරීමට රටවල් දෙකෙහි ප්‍රමිතීන් එකම තලයකට ගෙන ඒම (harmonisation) පූර්ව කොන්දේසියකි. මේ ගිවිසුමේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමක් දෙපාර්ශවයෙන්ම අද වන තෙක් සිදු වී නැත. එපමණක් නොව රටවල් දෙකක ප්‍රමිතීන් එකම තලයකට ගෙන ඒම අපහසු සහ දීර්ඝ ක්‍රියාවලියක් වීම මෙම ගිවිසුමේ ප්‍රායෝගික බව අඩු කරයි. තවත් සීමාවක් වන්නේ මේ ගිවිසුම් දෙකේ ම අවධානය යොමු වන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉන්දීය ප්‍රමිති කාර්යාංශය යටතට ගැනෙන නිෂ්පාදන ප්‍රමිතීන් සම්බන්ධයෙන් පැනනගින අනුකූලතාව හා සම්බන්ධ කරුණු කෙරෙහි පමණක් වීම ය. අපනයනකරුවන්ගේ අත්දැකීම පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයට හා ඉන්දීය ප්‍රමිති කාර්යාංශයට අමතරව අනෙකුත් රාජ්‍ය සංවිධානද වෙනත් විවිධ නියාමන ප්‍රමිතීන්ට සහ තාක්ෂණික රෙගුලාසිවලට නිෂ්පාදනවල අනුකූලතාව පරීක්ෂා කිරීමේ වගකීම පැවරෙන බව ය. එබැවින්, ප්‍රමිති කාර්යාංශයට අදළ සියලු ම ප්‍රමිති සහ තාක්ෂණික රෙගුලාසි ආවරණය කිරීමට හැකි ගිවිසුමක් තිබීම වැදගත් ය.

ආනයන සිදු කරන අවස්ථාවේදී ඇතිවන අනුකූලතාව හා සම්බන්ධ පිරිවැය හා ප්‍රමාදයන් ශ්‍රී ලංකාව පමණක් මුහුණ දෙන සුවිශේෂ ගැටලුවක් නොවේ. මෙය බොහෝ රටවල් මුහුණ දෙන ප්‍රමිතිය හා සම්බන්ධ පොදු බාධකයකි. මේ බාධක දුරලීම සඳහා, විවිධ රටවල් විසින් විවිධ වර්ගවල ගිවිසුම් යොදා ගෙන තිබේ.

## නිර්දේශ

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමට බාධක වන අනුකූලතාව හා සම්බන්ධ බාධක ඉවත් කිරීම සඳහා දිය හැකි වඩාත්ම ප්‍රයෝජනවත් හා ප්‍රායෝගික විසඳුම වන්නේ අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි (CAPs) පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට (MRA) එළඹීම බව මෙම විශ්ලේෂණයෙන් පෙනී ගොස් තිබේ. අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට අත්සන් කරන රටවල් දෙක ම තම තමන්ට ආවේණික ප්‍රමිතීන් පවත්වාගෙන යමින්, අනුකූලතා ක්‍රියා පටිපාටිය පමණක් පිළිබඳව අවධානය යොමු කරන බැවින් එය කෙටි කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කළ හැකි වේ. දෙරටම අනුගමනය කළ යුතු අවශ්‍යතාව වන්නේ අපනයනය කරන රටේ බලය සහිත හා ප්‍රතීතනය වූ (සහතික ලත්) අනුකූලතා තක්සේරු ආයතන (CAPs) විසින් නිකුත් කරනු ලබන අනුකූලතා සහතිකය පිළිගැනීමට එකඟ වීම පමණි. ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට සහ තාක්ෂණික රෙගුලාසිවලට නිෂ්පාදිතය අනුකූල වන්නේ ද යන වග ඒ සහතිකය සනාථ කරයි. අපනයනය කරන අවස්ථාවේ අනුකූලතාව තක්සේරු කිරීම හා සනාථ කිරීම සිදු වන නිසා, ආනයන අවස්ථාවේදී අනුකූලතාව සනාථ කිරීම නිසා වන ප්‍රමාදයන්ට සහ පිරිවැයට මුහුණ දීමට අපනයනකරුට සිදු නොවනු ඇත.

ගිවිසුමේ තවත් අමතර වාසියක් වන්නේ එය යෝජිත CEPA ගිවිසුමෙන් ඉවත් කොට, පළමුවෙන් ම වෙළෙඳ පාර්ශ්වකරුවන් අතර අනුකූලතා සහතික නිකුත් කිරීමට ශක්‍යතාව ඇති ප්‍රමුඛතා නිෂ්පාදන ආවරණය කරමින් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම අත්සන් කළ හැකි අතර අනතුරුව අනුකූලතා සහතික නිකුත් කිරීම පිළිබඳව විශ්වසනීයත්වය ගොඩ නැගීමට අවශ්‍ය වන කාලය පදනම් කරගෙන අනෙක් නිෂ්පානද ක්‍රමානුකූලව ආවරණය වන ආකාරයට එම ගිවිසුම අදියර වශයෙන් ව්‍යාප්ත කළ හැකි වීම ය.

අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම CEPA ගිවිසුමෙන් වෙන් කර ක්‍රියාත්මක කිරීම වඩා යෝග්‍ය ය. ඊට හේතුව එය CEPA මෙන් නොව වැඩි ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ හැකි සාපේක්ෂ වශයෙන් ඍජු ගිවිසුමක් වන නිසාය. ඊට අමතරව CEPA ගිවිසුමකින් ඇති වන දෙරට අතර වෙළෙඳාමේ හා ආයෝජනයේ වැඩිදුර ලිබරල්කරණයක් පිළිබඳව ශ්‍රී ලාංකික අපනයනකරුවෝ බොහෝ දෙනෙක් අතර ඇති අඩු විශ්වාසයකි. තීරුබදු නොවන බාධක මගහැරීම සඳහා ගනු ලබන අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් තුළින් ඉන්දු - ශ්‍රී ලංකා වෙළඳාමට ඇති තීරු බදු නොවන බාධක ඉවත් කිරීමට කටයුතු කිරීම මගින් නිදහස් වෙළෙඳ ගිවිසුමේ ප්‍රතිලාභ පිළිබඳව විශ්වාසය ගොඩ නැගීමටත්, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික වෙළෙඳ සබඳතා වැඩි දුරටත් පවත්වා ගෙන යෑමට වඩා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමටත් එය උපකාරී වනු ඇත. එබැවින්, අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම CEPA ගිවිසුමෙන් වෙන් කර ක්‍රියාත්මක කිරීම තුළින් එය ඉක්මණින් නැංවිය හැකි වනු ඇති අතර ඉන් දෙරටේ ම වෙළෙඳුන්ට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ද සැලසෙනු ඇත. අවසාන වශයෙන් අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) විධිමත් පරිදි ක්‍රියාත්මක වීමට පහසුකම් සලසන අපනයන පරීක්ෂණ යෝජනා ක්‍රමයක් /ආයතනයක් පිහිටුවීමේ වැදගත්කමද මේ පත්‍රිකාවෙන් නිර්දේශ කරනු ලැබේ.

# ක්‍රමවේදය සහ සීමා

## ක්‍රමවේදය

මේ වාර්තාව සකස් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය සමන්විත වන්නේ එම විෂයය පිළිබඳ ලියැවුණු සාහිත්‍ය විචාරයකින් සහ ප්‍රමුඛ පුද්ගල සම්මුඛ සාකච්ඡා මෙන්ම ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සිදු කරන ලද සාකච්ඡා යන අංගවල සංකලනයකිනි. සාහිත්‍ය විචාරයේ මූලික පරමාර්ථය වූයේ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පවත්නා තීරුබදු නොවන බාධක සහ විශේෂිත වශයෙන් දෙරට තුළ අනුගමනය කරනු ලබන අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ පොදුවේ අවබෝධයක් ලබා ගැනීම ය. සමාලෝචනයට ලක් කරන ලද ලේඛනගත කරුණුවලට ඇතුළත් වන්නේ වාර්තා, පුවත්පත් ලිපි සහ වෙළෙඳ කාර්යයන්හිදී පවත්වන ලද කතා ආදියය. ඊට අමතරව, ආනයන හා අපනයන පිළිබඳ ශ්‍රී ලාංකික සහ ඉන්දියානු නීති සම්පාදනයන් සහ අදාළ ලෝක වෙළෙඳ සංවිධාන ගිවිසුම් ද (උදා : SPS ගිවිසුම සහ වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුම් ද) සමාලෝචනයට භාජන කරන ලදී. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවත්නා වෙළෙඳ ගිවිසුම් මෙන් ම දෙරට විසින් පවත්වාගෙන යනු ලබන අනෙකුත් වෙළෙඳ ගිවිසුම් සහ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) සහ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් ද (MRAs) පර්යේෂකයින් විසින් අධ්‍යයනය කරන ලදී.

ආහාර අපනයනකරුවන් මුහුණ දෙන අනුකූලතා ගැටලු සම්බන්ධයෙන් ලේඛන සමාලෝචනයෙන් ලැබුණු ප්‍රතිඵල හරි වැරදි බැලීම සඳහා, සිද්ධි අධ්‍යයනයක් වශයෙන්, ශ්‍රී ලංකාවෙන් ආහාර අපනයනය කරන්නන් මුහුණ දෙන විශේෂිත ගැටලු කෙරෙහි මේ අධ්‍යයනය අවධානය යොමු කරයි. මේ අංශය තෝරා ගන්නා ලද්දේ මේ ගැටලුව විශේෂයෙන් ම ආහාර අංශය කෙරෙහි අහිතකර බලපෑම් සිදු කළ බව ලේඛන සමාලෝචනයේදී දක්නට ලැබුණු නිසාය. දෙරට අතර වෙළෙඳාම පිළිබඳ සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කිරීම මගින් මෙය වැඩිදුරටත් තහවුරු කරගන්නා ලදි. ලේඛන පදනම් කරගත් පර්යේෂණයේ නිගමනයන් ත්‍රෛපාර්ශවගත කිරීම සඳහා ආනයනකරුවන්, රජයේ බලධාරීන් සහ අනුකූලතා තක්සේරු සිදු කරන ස්ථානවල නිලධාරීන් සමග ප්‍රමුඛ පුද්ගල සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

පර්යේෂණයේ අතුරු ප්‍රතිඵල, නෛතික, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රවල විශේෂඥයින් වෙත සැසියකදී ඉදිරිපත් කරන ලදී. වර්තමාන පර්යේෂණයේදී හඳුනාගන්නා ලද හිඩැස් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම සහ යෝජිත විසඳුම්වල ශක්‍යතාව සාකච්ඡා කිරීම සඳහා මේ සැසිය උපයෝගී කරගන්නා ලදී. ඉන් පසුව, පර්යේෂණය තවදුරටත් විධිමත් පරිදි සකස් කරන ලදුව සංසදයන් දෙකකදී (LF&VPPEA සහ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය (NCE) විසින් සංවිධානය කරන ලද) පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරන ලදී.

## අධ්‍යයනයේ සීමා

**1) අධ්‍යයනයේ කේන්ද්‍රීය අවධානය**

අධ්‍යයනය සිදු කිරීමට තිබූ සීමාසහිත කාලය හා සම්පත් සලකා බැලීමේදී අධ්‍යයනයේ එක් සීමා කිරීමක් වූයේ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරන්නන් මුහුණ දෙන ප්‍රමිති අනුකූලතා ගැටලු කෙරෙහි පමණක් එහි අවධානය යොමු කිරීමට සිදු වීම ය. අනෙකුත් නිෂ්පාදනවලට වඩා ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් වන ප්‍රමිති අවශ්‍යතාවලට වැඩි නැඹුරුවක් පවතින නිසා අධ්‍යයනයේදී සිද්ධි අධ්‍යයනයක් වශයෙන් ආහාර අපනයනකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳව වැඩි අවධානයක් යොමු කරයි. කෙසේ වුව ද, 3.3.2 කොටසේ පැහැදිලි කර ඇති පරිදි යෝජිත විසඳුම එක් රටකට හෝ නිෂ්පාදනයකට පමණක් විශේෂිත වූවක් නොවේ. සමාන ආකාරයේ ගැටලු අවස්ථාවලදී වෙනත් කවර හෝ නිෂ්පාදනයක් සඳහා වුවද ශ්‍රී ලංකාව සහ වෙනත් වෙනයම් වෙළෙඳ හවුල්කාර රටක් අතර වෙළෙඳාම පහසු කරවීම සඳහා ද යෝජිත ගිවිසුම විසඳුමක් ලෙස භාවිත කළ හැකිය.

**2) පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සංඛ්‍යාව**

අපනයනකරුවන් සහ අනුකූලතා තක්සේරු ආයතන නිලධාරීන් සමග සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා සංඛ්‍යාව සීමාසහිත විය. අපනයනකරුවන් සමග සම්බන්ධීකරණය කිරීමේ දුෂ්කරතා නිසා, ලැබී තිබුණු කාලය තුළ පර්යේෂකයින්ට සිදු කළ හැකි වූයේ සීමාසහිත සම්මුඛ සාකච්ඡා සංඛ්‍යාවක් පමණි. ඒ හැරුණු විට, සම්මුඛ සාකච්ඡාවල පරමාර්ථය වූයේ ඉන්දියාවට අපනයනයන් කිරීමේදී මේ විශේෂිත තීරුබදු නොවන බාධකයකට භාජන වූ අපනයනකරුවන් පිළිබඳ පරිපූර්ණ සමීක්ෂණයක් පැවැත්වීම නොව, ආයතනික පර්යේෂණ අදියරේදී මතු වූ ගැටලු පැහැදිලි කර ගැනීම සහ ඒවා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමය.

# හැඳින්වීම

පාරිභෝගිකයින්, පරිසරය, ශාක හා සත්ත්ව ජීවිතය ආරක්ෂා කිරීම වැනි නීත්‍යානුකූල පොදු ප්‍රතිපත්ති අරමුණු සපුරා ගැනීම සඳහා සියලු ම රටවල් නිෂ්පාදන ප්‍රමිතීන් හා තාක්ෂණික රෙගුලාසි පවත්වාගෙන යයි. අපනයන කරනු ලබන නිෂ්පාදන ඒවා ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට හා තාක්ෂණික රෙගුලාසිවලට අනුකූල වන බවට සහතික වීමේ වගකීමක් අපනයනකරුවන්ට ද තිබේ. එවැනි ප්‍රමිතීන් හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට රටක් සතු අයිතිය ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්වලදී පිළිගැනීමට ලක්වන අතර ම,[1] ඒවා අනවශ්‍ය පරිදි ජාත්‍යන්තර වෙළෙඳාම සීමා නොකරන බවට ‑ උදා : වශයෙන් තීරුබදු නොවන බාධක (NTBs).[2] වශයෙන් ක්‍රියාත්මක නොවන බවට - වග බලා ගැනීමද ඒ රටවලින් අපේක්ෂා කරනු ලැබේ.

සෞඛ්‍යය, සුරක්ෂිතතාව සහ පාරිසරික අවදානම පිළිබඳව ඉහළ යන පාරිභෝගික සවිඥානකත්වයත් සමගම, සෞඛ්‍යාරක්ෂිත, සුරක්ෂිත සහ පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා වන ඉල්ලුම ඉහළ ගොස් තිබේ. ඊට ප්‍රතිචාරයක් වශයෙන් රටවල් විසින් පනවනු ලබන ප්‍රමිතීන් හා රෙගුලාසි ද වඩ වඩාත් දැඩි වෙමින් පවතී. එබැවින් නිෂ්පාදන මගින් අවශ්‍ය ප්‍රමිතීන් සපුරාලනු ලබන බවට සහතික වීම සඳහා දේශීය ආයතනවල ඇති ශක්‍යතාව වැඩි දියුණු කිරීම තුළින් අනුකූලතාව සනාථ කිරීම සඳහා වැය වන පිරිවැය සහ කාලය අඩු කිරීමත් අපනයන ප්‍රවර්ධනයට උපකාරී වනු ඇත.

වෙනත් බොහෝ රටවල් මෙන් ශ්‍රී ලංකාව ද මෙම ගැටළුව හඳුනාගෙන තිබේ. එහෙත් මෙයට විසඳුමක් ලෙස වර්තමාන ප්‍රතිපත්තියේ අවධානය සම්පූර්ණයෙන් ම වාගේ යොමු වී ඇත්තේ ආනයනය කරන රටවල ප්‍රමිතීන් සහ තාක්ෂණික රෙගුලාසි පිළිබඳව අපනයනකරුවන් අතර අවබෝධය ඇති කිරීමත්, ඒ ප්‍රමිතීන් සපුරාලීම සඳහා දේශීය ශක්‍යතාව වර්ධනය කිරීමත් කෙරෙහිය. මෙය නිසැකව ම වැදගත් ප්‍රවේශයක් වුවත්, විදේශ වෙළඳපොළට පිවිසෙන අවස්ථාවේදී ප්‍රමිති අනුකූලතා පිරික්සීමේ ක්‍රියාවලිය අකාර්යක්ෂම සහ විනිවිදභාවයක් නොමැති නිසා සිදු වන ප්‍රමාදයන් සහ ඉහළ පිරිවැය ආදී ගැටලු විසඳීමට මෙම ප්‍රවේශය ප්‍රයෝජනවත් නොවේ. ද්විපාර්ශ්වික/ කලාපීය ගිවිසුම් ඇති කර ගැනීම මෙවැනි ගැටලුවලට විසඳුමක් වශයෙන් විවිධ රටවල් භාවිත කරන සුලභ ක්‍රමවේදයකි. කෙසේ වුවද ශ්‍රී ලංකාව එවැනි ක්‍රියාමාර්ග ස්ථාපනය කර නැත. විශේෂයෙන් ම පහත දක්වෙන අවස්ථාවලදී වෙනත් රටවල් සමඟ වෙළෙඳාමේදී වැය වන පිරිවැය හා කාලය අඩු කිරීමට මෙවැනි ආකාරයේ ද්විපාර්ශ්වික / බහුපාර්ශ්වික ගිවිසුම් ප්‍රයෝජනවත් විය හැකිය:

1) වෙළෙඳාම පහසු කරවීම සඳහා රටවල් නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹීම නිසා තීරුබදු රහිතව අපනයනය කළ හැකි නමුත් හවුල්කාර රටේ ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම සඳහා වැය වන පිරිවැය හා කාලය නිසා තීරු බදු රහිත ප්‍රවේශයෙන් ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී තිබීම
2) සිය රටින් බැහැර පිහිටි නිපුණත්වය ඇති සහ ප්‍රතීතනය වූ අනුකූලතා තක්සේරු ආයතන (CABs), විසින් නිකුත් කරනු ලබන අනුකූලතා තක්සේරු වාර්තා ආනයනය කරන රට පිළිනොගැනීම
3) වැය වන පිරිවැය හා කාලය සැලකීමේදී අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි අසාධාරණ සහ අනවශ්‍ය ලෙස වෙළෙඳාමට බාධාවක් වීම

මේ අධ්‍යයනයේ අවධානය යොමු වන්නේ ඉන්දියාව සමග අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනුම් ගිවිසුමකට ːඑසෘ* එළඹීම මගින් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළෙඳාම පහසු

[1] SPS ගිවිසුම හෙවත් Sanitary සහ Phytosanitary ක්‍රියාමාර්ග භාවිත කිරීම පිළිබඳ ලෝක වෙළෙඳ සංවිධාන (WTO) ගිවිසුමේ 2.1 වගන්තිය
[2] SPS ගිවිසුමේ 2.2 සහ 2.3 වගන්ති සහ වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ලෝ. වෙ. සං. (WTO) ගිවිසුමේ (TBT ගිවිසුම) 5.1 සහ 5.2 වගන්ති.

කිරීම කෙරෙහිය. ගිවිසුමේ අරමුණ වන්නේතීරුබදු නොවන බාධක වශයෙන් ක්‍රියාත්මක වන ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූලවීමට වැය වන අනවශ්‍ය පිරිවැය හා කාලය අඩු කිරීමය. සිද්ධි අධ්‍යයනයක් වශයෙන්, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සැකසූ ආහාර වෙළෙඳාම මුහුණ දෙන අනුකූලතා පිළිබඳ ගැටළු දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන අතර මෙම ගැටළුවට විසඳුමක් ලෙස එවැනි ගිවිසුමක ඇති වැදගත්කම පෙන්වා දෙනු ලැබේ.

දෙරට අතර වෙළෙඳ බාධක ඉවත් කිරීම මගින් වෙළෙඳ සබඳතා ශක්තිමත් කිරීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව 1998 දී ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමට (ISFTA) එළඹුණි. ගිවිසුම 2000 වසරේ සිට ක්‍රියාත්මක විය. යම් කාලයක් තුළදී තීරුබදු බාධක ඉවත් කිරීමට ගිවිසුමෙන් එකඟතාවක් ඇති කරගත් නමුත් තීරුබදු නොවන බාධක (NTBs) සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව එකඟතාවක් නොවීය. තීරුබදු බාධක හැර වෙළෙඳාමට බාධක වශයෙන් ක්‍රියාත්මක වන අනෙකුත් සියලු ම ක්‍රියාමාර්ග තීරුබදු නොවන බාධක (NTBs) වශයෙන් සඳහන් කරනු ලැබේ. එනම් රීති, රෙගුලාසි, ප්‍රමිතීන්, ආනයන ක්‍රියාපටිපාටි ආදියයි. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් ප්‍රදානය කරනු ලබන තීරුබදු සහනවල ප්‍රතිලාභ ලබා ගැනීම වළක්වන තීරුබදු නොවන බාධක රාශියක් ම ශ්‍රී ලාංකික ආනයනකරුවන් හඳුනාගෙන තිබේ. මේ අතර ඇති එක් වැදගත් තීරුබදු නොවන බාධකයක් වන්නේ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටීන් (CAPs) හේතුවෙන් වන ප්‍රමාදය සහ අධික පිරිවැය වේ.

ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ දෘෂ්ටියෙන් බලන විට මේ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ආහාර වෙළෙඳාමට තීරුබදු නොවන බාධකයක් බවට පත්විය හැකි වන්නේ කෙසේද යන්න මේ වාර්තාව පෙන්වා දෙයි. කෙසේ වුව ද, යෝජිත නිර්දේශ එක් රටකට හෝ නිෂ්පාදනයකට සීමා නොවේ. ශ්‍රී ලංකාව තුළ එවැනි ගැටලුවලට මුහුණ දෙන ඉන්දීය අපනයනකරුවන්ට ද මෙම නිර්දේශය අදාළ වන අතර ම ශ්‍රී ලංකාව සහ වෙනත් ඕනෑ ම රටක් අතර ඇති මේ හා සමාන ගැටලුවලට මුහුණ දෙන නිෂ්පාදන වෙළෙඳාම පහසු කරවීමට ද උපකාරී වනු ඇත. චීනය වැනි වෙනත් වෙළෙඳ පාර්ශ්වකරුවන් සමග නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට එළඹීමට ශ්‍රී ලංකාව සූදානම්ව සිටින නිසා, ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට මේ ගිවිසුම්වලින් සැබෑ ලෙස ම ප්‍රතිලාභ ලද හැකි වීම සහතික කිරීමට සහ ප්‍රමිතීන් හා රෙගුලාසි වෙළෙඳාමට බාධක වශයෙන් ක්‍රියාත්මක නොවන බවට සහතික කිරීමට ද මේ පර්යේෂණයෙන් කරනු ලබන නිර්දේශ ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම වාර්තාව පරිච්ඡේද තුනකින් සමන්විත වේ. 1 වැන පරිච්ඡේදයෙන් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාම විශ්ලේෂණය කිරීමත්, දෙරට අතර වෙළෙඳාමට තීරුබදු නොවන බාධකවලින් ඇති විය හැකි බලපෑම සාකච්ඡා කිරීමත් සිදු කරනු ලැබේ. ප්‍රමිතීන්ට සහ රෙගුලාසිවලට අනුකූල වීම තීරුබදු නොවන බාධකයක් බවට පත් විය හැකි ආකාරයත් එය වෙළෙඳාමට අහිතකර ලෙස  බලපාන ආකාරයත් මේ පරිච්ඡේදයෙන් විමසා බලනු ලැබේ. ඒ හැරුණු විට, දෙරට අතර දනට පවත්නා ගිවිසුම් සාකච්ඡා කිරීමත් අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධකවලට විසඳුමක් ලෙස මේ ගිවිසුම් කොතරම් දුරට ප්‍රයෝජනවත්ද යන්න විශ්ලේෂණය කිරීමත් සිදු කරනු ලැබේ. දෙවැනි පරිච්ඡේදයෙන්, අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධකවලට විසඳුම් ලෙස උපයෝගී කරගත හැකි ක්‍රියාමාර්ග හතරක් ඉදිරිපත් කරනු ලබන අතර ඒ එක් එක් ක්‍රියාමාර්ගයේ ශක්‍යතාව ද ප්‍රායෝගික බව ද සාකච්ඡා කරනු ලැබේ. තෙවැනි පරිච්ඡේදයේදී අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධකවල ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳාමට ඇති වන අහිතකර බලපෑම අඩු කිරීම සඳහා වඩාත් ම ප්‍රායෝගික විසඳුම වශයෙන් අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනුම් ගිවිසුමක් (එඝ්* ඇති කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. දෙරට ම සඳහා ඉදිරිමග මේ කොටසින් ඉදිරිපත් වන අතර, මේ  සම්බන්ධයෙන්, අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනුම් ගිවිසුමක් උදෙසා ගත යුතු පියවර සාකච්ඡා කරනු ලැබේ.

# පළමු පරිච්ඡේදය - ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආහාර වෙළෙඳාම කෙරෙහි තීරුබදු නොවන බාධකවල (NTBs) බලපෑම

මෙම පරිච්ඡේදය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආහාර වෙළෙඳාමේදී අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධකවල බලපෑම කෙරෙහි අවධානය යොමු කරයි. එහිදී, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමේ දී තීරුබදු නොවන බාධකයක් වශයෙන් අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක විය හැක්කේ කෙසේද යන්න පෙන්වා දීමට, දෙරට අතර වන සැකසූ ආහාර වෙළෙඳාම, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් ලෙස ගනියි. පරිච්ඡේදය පළමුව, ප්‍රමිතීන් හා රෙගුලාසි වෙළෙඳාම අනවශ්‍ය ලෙස සීමා කරන්නේ කෙසේද යන්න පිළිබඳ පොදු සමාලෝචනයකට පිවිස, අනතුරුව ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සැකසූ ආහාර අපනයනය කරන්නන් මුහුණ දෙන ප්‍රමිතීන්ට සහ රෙගුලාසිවලට අදාළ විශේෂිත ගැටලු පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් වෙත යොමු වේ. ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ප්‍රමිති ආශ්‍රිත බාධක කෙරෙහි අවධානය යොමු කරන දැනට පවත්නා ගිවිසුම්, ශ්‍රී ලාංකික ආහාර අපනයනකරුවන්ගේ දුක්ගැනවිලි විසඳීමේ ලා අසාර්ථක වී ඇති ආකාරය මේ කොටසින් වැඩිදුරටත් පෙන්වා දෙනු ඇත.


මෙම පරිච්ඡේදය ආවරණය කරන ප්‍රමුඛ ක්ෂේත්‍රයන් මෙසේ යඃ

- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම - වෙළෙඳාම කෙරෙහි වන බලපෑම
- ප්‍රමිතීන් අවශ්‍ය ද? ඒ වෙළෙඳාමට බාධකයක් වන්නේ කෙසේ ද?
- ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයඃ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට ආහාර අපනයනය කිරීම කෙරෙහි වන අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල (CAPs) බලපෑම
    - ඉන්දියාව සමග ආහාර අපනයන වෙළෙඳාම ඃ සමාලෝචනයක්
    - අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි (CAPs):ආහාර අපනයනවලට තීරුබදු නොවන බාධකයක්
- අනුකූලතාව පහසු කිරීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දැනට පවත්නා ගිවිසුම්

## 1.1. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම : වෙළෙඳාම කෙරෙහි වන බලපෑම

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව 1998 දී ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුමකට (ISFTA) එළැඹුණු අතර වසර 2000දී එය ක්‍රියාත්මක තත්වයකට පත් විය. 1 වැනි රූප සටහනේ දැක්වෙන පරිදි, නිදහස් වෙළෙඳ ගිවිසුමේ පළමු පස්වසර තුළදී ශ්‍රී ලංකාවෙන් ඉන්දියාව වෙත සිදු කරන ලද අපනයනයන් ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. කෙසේ වුව ද, 2005 සිට අපනයන වර්ධනය සැලකිය යුතු ආකාරයකින් පහත වැටෙනු දක්නට ලැබිණ.

**1 වැනි රූප සටහන : ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට යවන ලද අපනයන (2000 – 2014)**




මූලය : ශ්‍රී ලංකා මහබැංකුවේ විවිධ වර්ෂවල වාර්ෂික වාර්තා

අපනයනකරුවන්ගේ සංගමය සමඟ සිදු කරන ලද මූලික සාකච්ඡාවලින් සහ විමර්ශන පාදක පර්යේෂණයෙන් අනාවරණය වූයේ තීරුබදු නොවන බාධක තවදුරටත් පවතින බවත්, ඉන්දියාවට අපනයන කිරීමේදී ඒවා සැලකිය යුතු බාධකයක් වන බවත් ය.

විමර්ශන පදනම් කරගත් පර්යේෂණවලින් සහ ඉන්දියාවට අපනයනය කරන්නන් සමඟ සිදු කරන ලද ප්‍රමුඛ පුද්ගල සම්මුඛ සාකච්ඡාවලින් හඳුනාගන්නා ලද තීරුබදු නොවන බාධකවලට, අනෙකුත් ඒවා අතර, ඇතුළත් වන්නේ ලේබල් කිරීමේ අවශ්‍යතා පිළිබඳ පැහැදිලිකමක් නොමැතිවීම; ප්‍රභව අවශ්‍යතා පිළිබඳ සීමාකාරී රීති : තීරුබදු අනුපාත පංගු : අනුකූල නොවන සහ ආයාසකර ආනයන ක්‍රියා පටිපාටි; ආනයන බලපත්‍ර අවශ්‍යතා, සහ ඉන්දීය ප්‍රමිතීන්ට සහ රෙගුලාසිවලට අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුගමනය කරනු ලබන පිරිවැය අධික සහ කාලය ගත වන අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටීන් (CAPs) යන කරුණු ය.

## 1.2. ප්‍රමිතීන් අවශ්‍ය ද? ඒවා වෙළෙඳාමට බාධක වන්නේ ද?

ප්‍රමිතීන්ගෙන් නියෝජනය වන්නේ වැදගත් පොදු ප්‍රතිපත්ති අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කිරීමේදී භාවිත කරනු ලබන අර්ධ නියාමන ක්‍රියාමාර්ගයන් ය. උදහරණයක් වශයෙන්, සිය රට තුළ නිෂ්පාදනය වන සහ රට තුළට ආනයනය කරනු ලබන නිෂ්පාදනවලින් පරිසරයට හෝ පාරිභෝගිකයන්ගේ ආරක්ෂාවට හා සෞඛ්‍යයට හෝ අහිතකර බලපෑමක් සිදු නොවන බවට වගබලා ගැනීම සඳහා සෑම රටක් ම ක්‍රියාමාර්ග ගනී.

ප්‍රමිතීන් සහ රෙගුලාසි පවත්වාගෙන යෑමට රටක් සතු අයිතිය ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ බහුපාර්ශවීය රීති මගින් පිළිගනු ලැබේ. මානව, සත්ත්ව හෝ ශාක ජීවිතය හෝ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අවශ්‍ය සනීපාරක්ෂක හා ශාක සනීපාරක්ෂක ක්‍රියාමාර්ග භාවිත කිරීමට රටවලට ඇති අයිතිය සනීපාරක්ෂක හා ශාක සනීපාරක්ෂක (Photosanitary) ක්‍රියාමාර්ග භාවිත කිරීම පිළිබඳ ලෝක වෙළෙඳ සංවිධාන ගිවිසුම (SPS ගිවිසුම) විසින් පිළිගනු ලබයි.[3] වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ලෝක වෙළෙඳ සංවිධාන

[3]සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක ක්‍රියාමාර්ග භාවිත කිරීම පිළිබඳ ගිවිසුමේ 2.1 වගන්තිය. 1995.

ගිවිසුම (TBT ගිවිසුම) සමඟ, ප්‍රමිතීන් හා රෙගුලාසි පැනවීම සඳහා රට සතු අයිතිය ආරක්ෂා කිරීම සඳහා මෙන් ම ඒ සමග ම එවැනි ප්‍රමිතීන්, රෙගුලාසි සහ අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි මගින් වෙනස් ආකාරයේ සැලකිලි දක්වීමක් සිදු නොවන බවටත්, වෙළෙඳාමට අනවශ්‍ය බාධක නිර්මාණය නොවන බවටත් සහතික වීමට ද එය ප්‍රයත්න දරයි.[4]

ජාත්‍යන්තර රීති පැවතියේ වුව ද, රටවල් විසින් නියම කරනු ලබන ප්‍රමිතීන් සහ රෙගුලාසි, වෙනස්කම් සිදු කරන ආකාරයෙන් සහ වෙළෙඳාමට සැඟවුණු සීමා කිරීමක් වශයෙන් ක්‍රියාත්මක වනු දැකිය හැකි අවස්ථා සුලබ ය. පහත දැක්වෙන අවස්ථාවලදී එවැනි ප්‍රමිතීන් සහ රෙගුලාසි තීරුබදු නොවන බාධකයක් ලෙස ක්‍රියාත්මක විය හැකිය :

(අ) එම ක්‍රියාමාර්ග ආනයනවලට පමණක් අදාළ වේ නම්

යම් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් වන යම් ප්‍රමිතියක අරමුණ වන්නේ පාරිභෝගිකයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම නම්, ඒ ප්‍රමිතිය දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩවලට මෙන් ම ආනයනික නිෂ්පාදනවලට ද එක සේ අදාළ විය යුතුය. ''තමන්ගේ ම භූමි ප්‍රදේශය සහ අනෙකුත් සාමාජිකයින්ගේ භූමි ප්‍රදේශය අතර පවත්නා සමාන තත්ත්වයන් ද ඇතුළුව එක ම ආකාරයේ සහ සමාන තත්ත්වයන් පවතින සාමාජිකයින් අතර අත්තනෝමතික ලෙස හෝ අසාධාරණ ලෙස වෙනස්කම් කිරීමට'' SPS ක්‍රියාමාර්ග කටයුතු නොකරන බවට සාමාජිකයින් සහතික විය යුතු බව SPS ගිවිසුමේ 2.3 වගන්තිය අවධාරණය කරයි. ඊට අමතරව, අනෙකුත් සාමාජික රාජ්‍යවලින් නිපදවනු ලබන නිෂ්පාදන සම්බන්ධයෙන් අනුකූලතා පරීක්ෂාව සඳහා යොදගනු ලබන අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි, ''ජාතික වශයෙන් උත්පාදනය වන ඒ හා සමාන නිෂ්පාදන සැපයුම්කරුවන් සම්බන්ධයෙන් අදාළ වන ඒවාට වඩා අඩු වාසියක් සැලස්විය නොයුතු'' බවට වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුමේ (TBT) 5.1.1 වගන්තිය අවධාරණය කරයි.

යොදගනු ලබන ක්‍රියාමාර්ග අදාළ වන්නේ දේශීය වශයෙන් නිෂ්පාදිත ඒවාට නොව ආනයනික නිෂ්පාදනවලට පමණක් නම් ඉන් පැහැදිලි වනුයේ ප්‍රමිතියේ අරමුණ පාරිභෝගිකයන් සෞඛ්‍යය ආරක්ෂා කිරීම මුවාවෙන් ආනයන අධෛර්යමත් කිරීම බව ය.

(ආ) ප්‍රමිතීන්, සහතික කිරීම සහ පරීක්ෂා කිරීමේ අවශ්‍යතා සම්බන්ධ යාවත්කාල හා විශ්වසනීය තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට නොමැති නම්

අනුකූලතාව සහතික කිරීම සඳහා ක්‍රියා කිරීමේ අරමුණ වන්නේ පාරිභෝගිකයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම නම්, ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු අදාළ නිෂ්පාදිතයේ දේශීය නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් යන දෙපාර්ශ්වයට ම නිදහසේ ලබා ගත හැකි වීමට සැලැස්වීම වැදගත් ය.

සුදුසු ජාත්‍යන්තර ප්‍රමිතියක් නොමැති අවස්ථාවලදී හෝ පවතින රෙගුලාසිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවන අවස්ථාවලදී, අනෙකුත් සාමාජිකයින්ගේ වෙළෙඳාමට සැලකිය යුතු බලපෑමක් සිදු කිරීමට ඊට හැකි නම්, කවර හෝ තාක්ෂණික රෙගුලාසියක් ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් සාමාජිකයින්ට සාමාජික රාජ්‍යයක් විසින් ප්‍රමාණවත් දැනුම්දීමක් කළ යුතු බවට වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුමේ :ඔඊඔ* 2ග9 වගන්තිය විධිවිධාන සලසා ඇත.

යාවත්කාල සහ විශ්වසනීය තොරතුරු ලබා ගත නොහැකි නම්, ආනයනය කරන රට විසින් නිෂ්පාදන ප්‍රතික්ෂේප කරනු ලැබීමේ ඉඩකඩ ඉහළ යන හෙයින් එය වෙළෙඳාමට බාධකයක් වශයෙන් සක්‍රීය ලෙස ක්‍රියාත්මක වනු ඇත.

[4] සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක ක්‍රියාමාර්ග භාවිත කිරීම පිළිබඳ ගිවිසුමේ 2.3 වගන්තිය සහ වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුමේ 5.1 සහ 5.2 වගන්ති

(ඇ) අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ගය කාලය නාස්ති කර දමන සහ අධික පිරිවැයක් සහිත එකක් නම්

අනුකූලතාව පරීක්ෂා කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය වෙහෙසකර හා අපැහැදිලි එකක් නම්, එය තීරුබදු නොවන බාධකයක් බවට පත් විය හැකිය. උදහරණයක් වශයෙන් ඇතැම් රටවල්, සිය රටින් බැහැරව පිහිටි රසායනාගාර විසින් නිකුත් කරනු ලබන අනුකූලතා සහතික සහ පරීක්ෂණ වාර්තා පිළිගැනීම ප්‍රතික්ෂේප කරන අතර සෑම නැව්බඩු තොගයක් සම්බන්ධයෙන් ම අනුකූලතා පරීක්ෂාව ආනයන ස්ථානයේදී ම සිදු කළ යුතු බවට බල කර සිටියි.

අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග ''හැකිතාක් කඩිනමින් සහ එවැනි ම ආකාරයේ දේශීය නිෂ්පාදනවලට වඩා වෙනත් සාමාජිකයින්ගේ භූමි ප්‍රදේශ තුළ උත්පාදනය වන නිෂ්පාදනවලට අඩුවෙන් වාසිදයක නොවන ආකාරයකට සිදු කරනු ලබන බවට'' සහතික වන ලෙස වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුමේ (TBT) 5.2.1. වගන්තිය රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී. එසේ ම, අනකූලතා තක්සේරු ක්‍රියාමාර්ගය ප්‍රකාශයට පත් කළ යුතු බවට හෝ ඉල්ලා සිටින අවස්ථාවල ඉල්ලුම්කරුට දනුම් දිය යුතු බවට මෙන්ම ඉල්ලුම්කරුට සියලුම ඌනතා පිළිබඳව තොරතුරු ලබා දිය යුතු බවටත් 5.2.2. වගන්තිය මගින් වැඩිදුරටත් විධිවිධාන සලසයි.[5]

ඊට අමතරව, පරීක්ෂණ වාර්තා ලබා දීමට ගත වන කාලය දීර්ඝ සහ අනවශ්‍ය ලෙස වියදම් අධික වූවක් නම්, එය වෙළෙඳාමට බාධකයක් වනු ඇත. ප්‍රමාදයට හේතු වශයෙන්, බලධාරීන් විසින් සපයනු ලබන තොරතුරු නොමැති වීම සහ දීර්ඝ හා වියදම් අධික අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග පැවතීම යන දෙකම එක් වූ විට එය තීරුබදු නොවන බාධකයක් විය හැකිය.

## 1.3. ප්‍රත්‍යෙක අධ්‍යයනය : ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට ආහාරපාන අපනයනය කරන්නන්

අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධකවල බලපෑම පැහැදිලි කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට ආහාර අපනයනය කරන්නන් සම්බන්ධ අවස්ථාව මේ අධ්‍යයනයේදී භාවිත කරනු ලැබේ.

### 1.3.1. ඉන්දියාව සමඟ ආහාර අපනයන වෙළෙඳාම : සමාලෝචනයක් [6]

ඉන්දියාව යනු ශ්‍රී ලංකාවට ආසන්නයෙන් පිහිටා ඇති වේගයෙන් වර්ධනය වන විශාල වෙළෙඳපොළකි. දෙරට අතර ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවටත්, ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවටත් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා තීරුබදු රහිත ප්‍රවේශයකට ඉඩ සලසා දෙයි.

විශේෂයෙන් ම, කෘෂිකාර්මික සහ ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් සැලකීමේදී ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට ලබා දී ඇති තීරුබදු රහිත ප්‍රවේශය, ඉන්දියාවට අපනයනයන් සිදු කරන වෙනත් රටවල අපනයනකරුවන්ට වඩා, වැඩි වාසියක් සලසා දී ඇත. සැකසූ ආහාර ආනයන සඳහා ඉන්දියාව පනවා ඇති වඩා අනුග්‍රහිත වර්ගයේ (MFN) තීරුබදු ඔරොත්තු නොදෙන තරම් අධික වීමේ ප්‍රවණතාවක් දක්වයි. සාමාන්‍ය තීරුබදු 30%කට වඩා බෙහෙවින් ඉහළ අගයක් ගන්නා අතර සමහර නිෂ්පාදන සම්බන්ධයෙන් තීරුබදු 100-150% තරම් අධික අගයක් කරා යා හැකිය. ශ්‍රී ලාංකික ආහාර අපනයනකරුවන්ට ඉන්දීය වෙළෙඳපොළ ඉලක්ක කිරීමට අවස්ථාවක් නිර්මාණය කරමින් නිදහස් වෙළෙඳ

[5] 1995 නිකුත් වූ වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුම.
[6] ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන ආහාර සඳහා තීරුබදු රහිත ප්‍රතිලාභ ලබා දී නැත. ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන ආහාර හා කෘෂිකාර්මක නිෂ්පාදිත බහුතරය ISFTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ 'සෘණ ලැයිස්තුව' යටතට වැටේ.


ගිවිසුම, ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සිදු කරනු ලබන අලුත් සහ සැකසූ ආහාර අපනයනයන් බහුතරයකට තීරුබදු බාධක ඉවත් කිරීමට හේතු සළසා දුනි.

ඉන්දියාව, පසුගිය දස වසර තුළදී, ආහාර හා කෘෂිකාර්මික නිෂ්පාදන එක්කෝ තීරුබදු ක්‍රමයෙන් අඩුවන ලැයිස්තුවේ (උද : දිගුකාලයක් තුළ තීරුබදු අඩු වන භාණ්ඩ) හෝ නැතහොත් සෘණ ලැයිස්තුවේ (උද : තීරුබදු අඩු කරනු නොලබන සංවේදී භාණ්ඩ) සඳහන් වන නව නිදහස් වෙළෙඳ ගිවිසුම් රාශියකට එළඹ තිබේ. ඒ හේතුවෙන්, සෙසු රටවලට වඩා ඉන්දියාවට භාණ්ඩ අපනයනයෙන් සන්සන්දනාත්මකව ශ්‍රී ලංකාවට වැඩි වාසි අත්වනු ඇත.

මේ වාසි පැවතියද, 2 වැනි රූපසටහනේ දක්වෙන පරිදි පසුගිය දශකය තුළ ඉන්දියාවට සිදු කරනු ලබන සමස්ත අපනයන කාර්යසාධනය අයහපත් වී තිබේ. වර්තමාන නිදහස් වෙළෙඳ ගිවිසුමේ තවත් ප්‍රමුඛ දුර්වලතාවක් වන්නේ තීරුබදු නොවන බාධක (NTBs) සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන නොමැතිවීම ය. මේ බාධක පැවතීම, නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ තීරුබදු රහිත ප්‍රවේශයෙන් පූර්ණ ප්‍රතිලාභ ලැබීමට ශ්‍රී ලාංකික අපනයනකරුවන් සතු හැකියාව පහත හෙළා ඇත.

ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරනු ලැබූ කෘෂිකාර්මික හා ආහාර නිෂ්පාදන වැඩි සංඛ්‍යාවක් ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ඉන්දියාවේ තීරුබදු ක්‍රමයෙන් අඩු වන ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ ලෙස පැවතිණ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2003 වසරේදී මේ නිෂ්පාදන සම්බන්ධයෙන් වූ තීරුබදු සම්පූර්ණයෙන් ම ඉවත් කරන ලද්දේ ය. ඉන්දියාව වෙත සිදු කරනු ලබන සැකසූ ආහාර අපනයනවල වර්ධනය මෙහි බලපෑම පැහැදිලිව පෙන්වන උදාහරණයකි (2 වැනි රූප සටහන බලන්න). HS කාණ්ඩය 16 - 21 යටතට වැටෙන සියලු ම ආහාර නිෂ්පාදන, එනම්, මාංශාහාර නිපැයුම්, සීනි අඩංගු රසකැවිලි වර්ග, සකස් කළ කොකෝවා නිෂ්පාදන, සකස් කළ ධාන්‍ය නිෂ්පාදන, සකස් කළ එළවලු සහ පලතුරු නිෂ්පාදන හා ආහාරයට ගත හැකි අනෙකුත් සකස් කළ නිෂ්පාදන සඳහා තීරුබදු රහිත ප්‍රවේශය දැන් ශ්‍රී ලංකාව සතු වේ. තීරුබදු ප්‍රවේශය ලැබීමත් සමගම ආරම්භයේදී මේ නිෂ්පාදන අපනයනවල වර්ධනයක් දක්නට ලැබුණි. එසේ වුවත්, පසුව මෙම වර්ධනය අභියෝගයට ලක් වූයේ 2011 දී ඇමරිකානු ඩොලර් මිලියන 28ක් වූ, ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සිදු කරන ලද අපනයනයන්හි වටිනාකම, 2014 වන විට ඇ. ඩො. මිලියන 7 දක්වා අඩු වීම හේතුවෙනි. උදහරණයක් වශයෙන්, සම්මුඛ සාකච්ඡාවට භාජන කරනු ලැබූ එක් අපනයනකරුවෙක් තීරුබදු නොවන බාධක නිසා සහ විශේෂයෙන් ම අනුකූලතාව සඳහා පරීක්ෂා කිරීම හේතුවෙන් වරායවලින් භාණ්ඩ නිෂ්කාශනය කර ගැනීමේදී වැය වන කාලය හා පිරිවැය සැලකිල්ලට ගෙන පළතුරු යුෂ හා ධාන්‍ය නිෂ්පාදන ඉන්දියාවට අපනයනය කිරීම නවතා දමා තිබිණ.

**2 වැනි රූපසටහන : ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සහ ලෝකයේ වෙනත් රටවලට සිදු කරන ලද සැකසූ ආහාර අපනයනයන්**



### 1.3.2. අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග (CAPs): ආහාර අපනයන සඳහා තීරුබදු නොවන බාධකයන් [7]

මේ අධ්‍යයනයේ දී, ඉන්දියාවට ආහාර අපනයනය කරන්නන් විසින් හඳුනාගන්නා ලද තීරුබදු නොවන බාධකවලින් එකක් වන්නේ ප්‍රවේශ ස්ථානයේදී ඉන්දියානු ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූල වීම සඳහා වැය වන කාලය සහ පිරිවැය ය. ප්‍රමිතීන් හා රෙගුලාසි අනවශ්‍ය ලෙස වෙළෙඳාම සීමා කිරීමට ඉවහල් විය හැකි ආකාරය පිළිබඳ කදිම නිදසුනක් ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට යැවෙන ආහාර අපනයන අපට සපයා දෙයි. ශ්‍රී ලංකාවෙන් සැකසූ ආහාර අපනයනය කරන්නන්ගේ අත්දැකීම පෙන්වා දෙන්නේ තීරුබදු බාධක ඉවත් කිරීම කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවන්නේ කෙසේද සහ මේ තීරුබදු නොවන බාධකය ඉවත් කිරීම වෙළෙඳාම පහසු කරවීමට එක හා සමාන ලෙස නැතහොත් ඊටත් වැඩියෙන් වැදගත් වන්නේ කෙසේද යන්නයි.

බොහෝ ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් සිය රටින් පිටත පිහිටි අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන විසින් නිකුත් කරනු ලැබූ සහතික ඉන්දීය බලධාරීහු පිළිනොගනිති. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපනයනයට පෙර ඉන්දීය රෙගුලාසිවලට හා ප්‍රමිතීන්ට අනුකූලතාව ප්‍රකාශ කරන සහතික ශ්‍රී ලාංකික අපනයනකරුවන් ලබාගෙන තිබුණ ද ඉන්දියානු වරායට ළඟා වීමෙන් පසු එහි බලධාරීන් විසින් නිෂ්පාදන නැවත පරීක්ෂා කරනු ලැබේ.

නිෂ්පාදන ඒවා ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූල වන බව සනාථ කිරීම වැදගත් වන අතර ම අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග සිදු කරනු ලබන ආකාරය සාධාරණ බව හා වෙළෙඳාමට අනවශ්‍ය බාධකයක් නොවන බව සහතික කිරීම ද එතරම් ම වැදගත් ය.

පහත සඳහන් හේතු නිසාවෙන් ඉන්දියාවේ ආනයනය ස්ථානයේදී සිදුවන අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග වෙළඳාම සඳහා බාධකයක් වශයෙන් ක්‍රියාත්මක වේ:

(අ) අනුකූලතාව සඳහා පිරිවැය:

සාහිත්‍ය විමර්ශනයේදී අනාවරණය වූයේ පරීක්ෂා කරන ලද සියළු නියැදි සඳහා පරීක්ෂා කිරීමේ පිරිවැය ඩොලර් 50 - 70 දක්වා පරාසයක පවතින බවයග[8] සමහර අවස්ථාවලදී, විවිධ ප්‍රමාණවල බෝතල්වල / ඇසුරුම්වල අසුරන ලද එක ම නිෂ්පාදනය සඳහා ද, වෙනම නියැදි ලබාගෙන, වෙන වෙන ම පරීක්ෂණ සිදු කළ යුතු බවට බලධාරීහු තදින් ඉල්ලා සිටිති.[9] ඉන් අපනයනරුවන්ට දැරීමට සිදුවන පරීක්ෂා කිරීමේ පිරිවැය තවත් ඉහළ යයි. සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට මේ පිරිවැය සැලකිය යුතු ගැටලුවක් විය හැකි අතර තොගයේ වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් අනුකූලතා පිරිවැය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පවතී. විශේෂයෙන් ම භාණ්ඩවල අගය ඉහළ නම් (උදා : විශේෂයෙන් ම ඉහළ වටිනාකමක් ඇති තේ) ලබා ගන්නා අධික නියැදි ප්‍රමාණය අමතර පිරිවැයක් විය හැකිය.

තව දුරටත්, සම්මුඛ සාකච්ඡාවට භාජන වූ ඉන්දියාවට භාණ්ඩ යවන සියලු ම අපනයනකරුවන්ට අනුව (අලුත් සහ සැකසූ ආහාර යන දෙවර්ගයම), බලධාරීන් විසින් පරීක්ෂණ වාර්තා නිකුත් කරනු

---

[7] ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් සිදු කරනු ලබන ආහාර හා කෘෂිකාර්මික නිෂ්පාදන බහුතරයක් ISFTA යටතේ ශ්‍රී ලංකාවේ ''සෘණ ලැයිස්තුවට'' වැටේ.

[8] ඩෙබ් පාල්, බී 'ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර තීරුබදු නොවන බාධක'' සමාජ හා ආර්ථික වෙනස් කිරීම සඳහා වන ආයතනය - 2015.

[9] -එම-

ලැබීමේදී සිදුවන ප්‍රමාදයන් නිසා නැව් භාණ්ඩ තොග වරායේ රඳවා ගැනේ. ඊට අමතරව, අපනයනකරුවෝ ප්‍රමාද ගාස්තු හා ගබඩා ගාස්තු ද ගෙවතිග

විශේෂයෙන් ම අපනයන පරිමාව කුඩා වන විට මේ අමතර වියදම්වලට මිල කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. පිරිවැය ඉහළ යෑම හේතුවෙන් භාණ්ඩවල මිල ඉහළ යා හැකි අතර එය අපනයනය කරනු ලබන නිෂ්පාදනයක මිල තරඟකාරිත්වය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරනු ඇත. සම්මුඛ සාකච්ඡාවට භාජනය කරනු ලැබූ අපනයනකරුවන් පිළිගත් පරිදි, ඉන්දියාව යනු බෙහෙවින් ම මිල තරගකාරී වෙළෙඳපොළක් වන නිසා, මේ තත්ත්වය, නිෂ්පාදනයේ අලෙවිය කෙරෙහි පෙරළා බලපෑම් ඇති කිරීමට හේතු වෙයි. උදාහරණයක් වශයෙන්, අඹ පල්පය සම්බන්ධයෙන් යල්පිනූ විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර ඒ සඳහා එක් භාණ්ඩ තොගයකට ඉන්දියානු රුපියල් 5000 - 6000 දක්වා මුදලක් වැය වේග[10] මේ වැය නිෂ්පාදන පිරිවැයට එකතු වන හෙයින්, එහි ප්‍රතිඵලයක් ලෙස, ඉන්දීය වෙළෙඳපොළට ඇතුළත් වන නිෂ්පාදන අධික මිලකින් යුතු වේ. මෙය සම්මුඛ සාකච්ඡාවට භාජන වූ, සකස් කළ මෙන් ම අලුත් ආහාර ඉන්දියාවට යවන ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහන් කළ අවස්ථාවකි.

(ආ) නිෂ්පාදන මුදාහැරීමේ ප්‍රමාදයන් ඃ

අදාළ වරාය අනුව පරීක්ෂණ සහතික නිකුත් කිරීමට ගතවන කාලය වෙනස් වේ. විමර්ශනයට ලක් කරන ලද ලේඛනවලින් අනාවරණය වන්නේ රසායනාගාර වාර්තා ලබා ගැනීමට දින 20-30 අතර කාලයක් ගත විය හැකි අතර රේගුවෙන් භාණ්ඩ මුදාහැරීම සඳහා සමස්තයක් වශයෙන් දින 30-40 අතර කාලයක් ගත වන බවයග[11] පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය වූයේ ස්ට්‍රෝබෙරි වැනි අලුත් පලතුරු සම්බන්ධයෙන් දින 5 ක් දක්වා කාලයක් භාණ්ඩ රඳවා ගෙන ඇති අතර කෝඩියල්, සෝස් හෝ ජෑම් වැනි සකස් කළ ආහාර සම්බන්ධයෙන් දින 14 සිට මාස 3 ක් දක්වා කාලයක් ඒ සඳහා ගත වී ඇති බව ය. සීමාසහිත කාලයක් පමණක් අලෙවියට තැබිය හැකි නිෂ්පාදන හමුවේ, සමහර අවස්ථාවලදී, මේ තත්ත්වය එකී නිෂ්පාදන වරායෙන් මුදාහැරීමට සූදානම් වන අවස්ථාව වන විටම පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත් කිරීමටත්, අනෙකුත් අවස්ථාවලට වඩා කෙටි කාලයක් තුළ විකිණීම සඳහා පීඩනයක් එල්ල කිරීමටත් හේතු විය හැකිය. ආහාර නිෂ්පාදන සාමාන්‍යයෙන් සීමාසහිත කාලසීමාවක් තුළ පරිභෝජනය කළ යුතු හෙයින් විශේෂයෙන්ම අලුත් ආහාර අපනයනකරුවන් හමුවේ මේ ගැටලුව වැඩි බලපෑමක් එල්ල කරන බව අනාවරණය විය.

ඒ හැරුණු විට සමහර නිෂ්පාදන හමුවේ, නිෂ්කාශන අවස්ථාව වන විට අලෙවියට තැබිය හැකි කාලය මාස 6කට වඩා අඩු වේ නම්, ඒ වෙළෙඳපොළට ඇතුළත් කිරීම සඳහා ඉන්දියාවේ විදේශ වෙළෙඳාම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයෙන් ඃඨඍ* අවසර නොලැබෙන බව පෙනේ.[12] පරීක්ෂණ වාර්තා ප්‍රමාදයන් හෝ අනුකූලතාව සම්බන්ධ ගැටලු නිසා හෝ නිෂ්පාදන වරායේ රඳවා ගැනෙන කාලසීමාව වැඩි වන කාල සීමාව අනුව එකී නිෂ්පාදන ඉන්දීය වෙළෙඳපොළේ අලෙවි කළ නොහැකි වීමේ අවදානමට අපනයනකරුවෝ මුහුණ දෙති.

(ඇ) අවිනිශ්චිතතාව

පරීක්ෂණ වාර්තාවලට සහ නැව් බඩු නිෂ්කාශනයට ගත වන කාලය භාණ්ඩ තොගයෙන් තොගයට සහ වරායෙන් වරායට වෙනස් විය හැකිය. සම්මුඛ සාකච්ඡාවට භාජන වූ අපනයනකරුවන්ගෙන්

---

10 -එම-

11 -එම-

12 ආහාර ආනයන නිෂ්කාශන ක්‍රමය පිළිබඳ උපදෙස් සංග්‍රහය (FICS), ඉන්දියාවේ ආහාර සුරක්ෂිතතා සහ ප්‍රමිති අධිකාරිය. 2013.

කෙනෙකු පෙන්වා දුන් පරිදි මෙය අලෙවිය සහ ගැනුම්කරුවන් සමඟ බෙදා හැරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම හමුවේ දුෂ්කරතා ඇති කරයි. මුදාහැරීමේ දිනය නොදන්නා නිසා අවශ්‍ය සිල්ලර රාක්ක ඉඩකඩ, ගුදම් ගබඩා පහසුකම් ආදිය ලබා ගැනීම, ඉන්දියානු ආනයනකරුවන්ට මෙන්ම ''බලාගෙන හිඳීමේ'' ප්‍රවේශයක් අනුගමනය කිරීමට සිදුව ඇති අපනයනකරුවන් හමුවේ ද මහත් සංකීර්ණතා ඇති කරයි.

ප්‍රමාදය හා පිරිවැය දන්නේ නම් සහ ඒකාකාරීව පවතින්නේ නම් අපනයනය කරන අවස්ථාවේදී ඒවා සැලකිල්ලට ගනිමින් ඒ අනුව සැලසුම් කිරීමට අපනයනකරුට හැකි වේ. කෙසේ වුවද, ප්‍රමාදයන් හා පිරිවැය නිතරම වෙනස් වන්නේ නම් ගැනුම්කරුවන් රඳවාගෙන අපනයන දිගටම කරගෙන යෑම බෙහෙවින්ම අභියෝගාත්මක කර්තව්‍යයක් බවට පත් වේ. අපනයනකරුගේ භාණ්ඩ තොගය මාස තුනක් තිස්සේ නිෂ්කාශනය කරනු නොලැබීම හේතුවෙන් උත්සව සහ නිවාඩු දින වැනි ඉහළ අලෙවි පවතින කාලවල නිසි වේලාවට භාණ්ඩ සැපයීමට නොහැකි වීම නිසා ගැනුම්කරුවන් අහිමි වීම පලතුරු යුෂ හා පලතුරු නිෂ්පාදන අපනයනය කළ ශ්‍රී ලාංකික අපනයනකරුවකුට මුහුණ පෑමට සිදු වූ, මෙයට සබැඳෙන, අවස්ථාවකි.

## 1.4. අනුකූලතාව පහසු කිරීම සඳහා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර දැනට පවතින ගිවිසුම්

1.3.2 කොටසේ සාකච්ඡා කළ පරිදි, රටෙන් පිටත පිහිටි බලයලත් සහ සහතිකලත් අනුකූලතා තක්සේරු ආයතන විසින් නිකුත් කරනු ලබන ප්‍රමිති අනුකූලතා සහතික ස්වේච්ඡාවෙන් පිළිගැනීමේ ක්‍රමයක් ශ්‍රී ලංකාව සතුය. මීට අමතරව, පහත වැඩිදුරටත් සාකච්ඡා කරනු ලබන, අනුකූලතාව පිළිගැනීම පහසු කිරීම සඳහා එකඟ වී ඇති වැඩිදුර ක්‍රියාමාර්ග ද වේ.:

(අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ආනයන පරීක්ෂණ ක්‍රමය වෙනුවෙන් ඉන්දියාවේ අපනයන පරීක්ෂණ සභාවේ අපනයන පරීක්ෂණ හා සහතික කිරීමේ පද්ධතිය පිළිගැනීම සඳහා වන ගිවිසුම (2002)

ඉන්දියාවේ අපනයන පරීක්ෂණ සභාව (EIC) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අතර ගිවිසුම, EIC විසින් විශේෂිත නිෂ්පාදන පිළිබඳ අපනයන පරීක්ෂණය හා අනුකූලතාව සහතික කිරීම පිළිගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට විධිවිධාන සලසයි.[13] මේ නිෂ්පාදිතයන් ශ්‍රී ලාංකික ප්‍රමිතීන්ට අනුකූල බවට ඉන්දියාවේ EIC විසින් සහතික කරන ලද නිසි බලය ඇති රසායනාගාරවලදී පරීක්ෂා කොට සහතික කරනු ලැබේ නම් ඒවා ශ්‍රී ලංකාවට පැමිණීමේදී පරීක්ෂා කිරීම අවශ්‍ය නොවේ. (නිෂ්පාදිතයන් අහඹු ලෙස ගෙන පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයට හැකි වුවද, අනුකූලතාව සඳහා එක් එක් භාණ්ඩ තොග ලෙස සියලු භාණ්ඩ පරීක්ෂා නොකරයි).[14]

---

[13] ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමිති ආයතනය වේ. 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනත යටතේ ස්ථාපිත කරන ලද එය මුලින් ක්‍රියාත්මක වූයේ ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය යන නමිනි. 1984දී 1964 පනත අහෝසි කොට ඒ වෙනුවට 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත නීතිගත කරනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ක්‍රියාත්මක වේ. තවද ශ්‍රී ලාංකික බලධාරීහු ඉන්දීය ප්‍රමිති කාර්යාංශය (BIS) වැනි ප්‍රතීතනය වූ හෝ පිළිගත් ජාතික හා ජාත්‍යන්තර අනුකූලතා තක්සේරු ආයතන (CABs) විසින් නිකුත් කරනු ලබන අනුකූලතා වාර්තා ස්වේච්ඡාවෙන් පිළිගනිති. බලධාරීන් ආනයන පිළිබඳ අහඹු පරීක්ෂාවන් සිදු කරන නමුත් සහතිකය නිසි පරිදි තිබේ නම් හැම භාණ්ඩ තොගයක් ම වෙන වෙනම පරීක්ෂා කරන්නේ නැත. තවද, 1.4 දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය තවදුරටත් විස්තරාත්මකව සාකච්ඡා කරනු ඇත.

[14] තවද, ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය (BIS) වැනි ප්‍රතීතනය වූ හෝ පිළිගත් ජාතික හා ජාත්‍යන්තර අනුකූලතා තක්සේරු ආයතන විසින් නිකුත් කරනු ලබන අනුකූලතා වාර්තා ශ්‍රී ලාංකික බලධාරීහු ස්වේච්ඡාවෙන්ම පිළිගනිති. බලධාරීන් ආනයන පිළිබඳ අහඹු පරීක්ෂණ සිදු කළත් සහතිකය විධිමත්ව තිබේ නම් හැම භාණ්ඩ තොගයක් ම වෙන වෙනම පරීක්ෂා කරන්නේ නැත.

ගිවිසුමට ඇතුළත් වන නිෂ්පාදන වන්නේ 2013 - ආනයන රෙගුලාසි (තත්ත්ව පාලන සහ ප්‍රමිතිකරණය) යටතේ විශේෂිතව දක්වා ඇති නිෂ්පාදනයන් යග [15] මේ රෙගුලාසි යටතේ ආහාර නිෂ්පාදන 50ක් සඳහන්ව ඇති අතර ඉන් 34ක් 2014 වන විට ඉන්දියාවෙන් අපනයනය කරනු ලැබ ඇතග[16]

ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය සඳහා මේ ගිවිසුම මගින් පහසුකම් සැලසෙන නමුත් ඉන්දියානු වෙළෙඳපොළට ඇතුළු වන ශ්‍රී ලාංකික නිෂ්පාදනවලට එම ප්‍රතිලාභය හිමි නොවේ. එබැවින් එය 'අන්‍යොන්‍ය' නොවන, නමුත් ඒ වෙනුවට 'ඒක පාර්ශ්වික' වන ගිවිසුමක් බවට පත් වේග

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය අතර වන ද්විපාර්ශ්වික සහයෝගිතා ගිවිසුම (2006)

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමිතිය පිළිබඳව වන ආයතනය) සහ ඉන්දියාවේ ජාතික ප්‍රමිති ආයතනය (ඉන්දියාවේ ජාතික ප්‍රමිතිය පිළිබඳව වන ආයතනය) යන ආයතන දෙක නියැදි පරීක්ෂාව හා සහතික කිරීම සඳහා බලය පැවරෙන ආයතන වශයෙන් එකිනෙක විසින් පිළිගැනීම සඳහා මේ ගිවිසුම විධිවිධාන සලසයි. ඒ හැරුණු විට ප්‍රමිතීන් සඳහා අනුකූල වන අවස්ථාවලදී අනෙක් ආයතනය විසින් නිකුත් කරනු ලබන සෝදිසි හා පරීක්ෂණ වාර්තා පිළිගැනීම පිණිස ද එය විධිවිධාන සලසයි.

මේ ගිවිසුම 2006 සිට ක්‍රියාත්මකව පවතින නමුත් ගිවිසුමේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම උදෙසා ඉදිරියට යෑමක් සිදු වී නැති තරම් ය. ඒ හැරුණු විට, සහතික හා වාර්තා පිළිගැනීම ප්‍රමිතීන්හි අනුකූලතාව යන කොන්දේසියට යටත් වන නිසා ශ්‍රී ලාංකික අපනයනකරුවන් මුහුණ පා සිටින වර්තමාන අනුකූලතා ගැටලු විසඳීමට එය උපකාරී වන්නේ නැත. II වන පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරෙන පරිදි ප්‍රමිතීන් එකිනෙක හා අනුකූල බවට පත් කිරීම සංකීර්ණ මෙන් ම කාලය වැය වන ක්‍රියාවලියකි.

---

[15] 2014 ජනවාරි 9, අංක 1844 දරන ගැසට් පත්‍රය

[16] ආනයන (ප්‍රමිතකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි) (2013). http://www.slsi.lk/web/images/PDF_upload/ii-123%20items.pdf

# දෙවැනි පරිච්ඡේදය – අනුකූලතාව හා බැඳුණු තීරුබදු නොවන බාධක සම්බන්ධයෙන් යෝජිත විසඳුම්

ආනයනය සිදුවන අවස්ථාවේදී ආනයනික නිෂ්පාදනවල අනුකූලතාව තක්සේරු කරන, ආනයනය කරන රටේදී සිදුවන අනවශ්‍ය ප්‍රමාද සහ පිරිවැය නිසා අපනයනකරුවන් මුහුණ දෙන බාධක දුරලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දැක්වීම හා සාකච්ඡා කිරීම II වැනි කොටසේදී සිදු කරනු ලැබේ. එවැනි ප්‍රමාදයන් පහත දැක්වෙන යම් කරුණක් හේතු කොටගෙන ඇති විය හැකිය:

- ආනයන අධෛර්යමත් කිරීමේ අරමුණින්, වෙළෙඳාමට සැඟවුණු සීමා කිරීමක් බවට පත් වන සංකීර්ණ, පිරිවැය අධික සහ දීර්ඝ කාලයක් ගත වන ක්‍රියාවලියක් අනුගමනය කිරීමත හෝ
- වරාය ආසන්නයේ නිසි බලයලත් අනුකූලතා තක්සේරු ආයතන නොමැති වීම හෝ වාර්තා නිකුත් කිරීමේදී ප්‍රමාදයන්ට තුඩු දීමට හේතු වන අයුරින් අනුකූලතා තක්සේරු ආයතන තුළ සම්පත් නොමැති වීම වැනි ආනයනය කරන රට මුහුණ දෙන සැබෑ ගැටලු.

ආනයන සිදුකරන අවස්ථාවේදී ඇතිවන අනුකූලතාව සම්බන්ධ පිරිවැය හා ප්‍රමාදයන් ආහාර අපනයනය කරන්නන් පමණක් මුහුණ දෙන ගැටලු නොවන අතර ඒවා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමට පමණක් සුවිශේෂී වූ ඒවා ද නොවේ. මෙය බොහෝ රටවල් මෙන් ම විවිධ වර්ගවල නිෂ්පාදන අපනයනය කරන බොහෝ අපනයනකරුවන් ද මුහුණ දෙන අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි හා සබැඳි පොදු බාධකයකි. එබැවින්, මේ බාධකය ජය ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ලියැවුණු පොතපත විශාල සංඛ්‍යාවක් දැකිය හැකිය.[17] පොදුවේ ගත් කල, ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ ප්‍රායෝගිකත්වය පිළිබඳවත්, විශේෂයෙන් ම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමට ඒවායේ අදාළත්වය පදනම් කරගෙන අනුකූලතාව හා සම්බන්ධ තීරුබදු නොවන බාධක (NTBs) පිළිබඳ ගැටලුව විසඳීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග පිළිබඳවත් මේ කොටසේදී කෙටියෙන් විමර්ෂණය කරනු ලැබේ; එනම්,

- ප්‍රමිතීන් සුසංගත කිරීම
- සමානතා ගිවිසුම් සහ ප්‍රමිතීන් පිළිබඳ අන්‍යෝන්‍ය හඳුනාගැනීම්
- විදේශීය නිෂ්පාදකයාට බලය (ප්‍රතීතනය) ලබා දීම; සහ
- අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) අන්‍යොන්‍ය වශයෙන් පිළිගැනීම

ඉන්දියානු ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූලවීම හේතුවෙන් ශ්‍රී ලාංකික අපනයනකරුවන් මුහුණ දෙන පිරිවැය හා ප්‍රමාදයන් පිළිබඳ තීරුබදු නොවන බාධකය ඉවත් කිරීම සඳහා වඩාත් ම ප්‍රායෝගික විසඳුම

---

[17] ප්‍රමිති හා අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රයන් තුළ විදේශ වෙළෙඳාම සඳහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම : උපකරණ මෙවලම් කට්ටලයක්' යුරෝපීය ප්‍රජාව කොමිසම. 2001.
චෑෆර්, ජේ. පී. සහ මවුර්, ජේ. සී, සංවර්ධනය සඳහා වරණාත්මක වෙළෙඳ ගිවිසුම් : අත්පොතක්'', ලෝක බැංකුවල 2011.
එල්වෙස්ටැඩ්, සී. සහ වෙජිලෑන්ඩ්, එෆ්'' සමානතාව සහ අන්‍යොන්‍ය පිළිගැනීම පිළිබඳ ජාත්‍යන්තර වෙළෙඳ මාර්ගෝපදේශ'' නෝර්වේජියානු කෘෂිකර්ම පර්යේෂණ ආයතනය. 2005.

වශයෙන් අනුකූලතා ත්කසේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් හඳුනාගැනීමෙන් මේ පරිච්ඡේදය සමාප්ත කෙරෙනු ඇතග

## 2.1. ප්‍රමිතීන් සුසංගත කිරීම

*සුසංගත කිරීම* යනු රටවල් කණ්ඩායමක් එක්ව පොදු හෝ සමාන ප්‍රමිතීන් හා රෙගුලාසි එකතු කරගැනීමක් වශයෙන් සැලකිය හැකිය.[18]

*අරමුණ :* සුසංගත කිරීමේ අරමුණ වන්නේ යම් නිෂ්පාදනයක් හෝ සේවාවක් සම්බන්ධයෙන් එක ම ආකාරයේ අනිවාර්ය ප්‍රමිතීන් සියලුම රටවල් සතු කිරීම ය.[19] ප්‍රමිතීන් සුසංගත කිරීම, විවිධ අපනයන වෙළෙඳපොළවලදී එකිනෙකට වෙනස් ප්‍රමිතීන්ට අනුකූල වීමට සිදු වීමෙන් ඇති වන අනුකූලතා පිරිවැය දෙගුණ වීම අඩු කිරීමේ ඵලදායී ක්‍රමයකි. සිද්ධාන්තයක් වශයෙන්, ගනුදෙනු පිරිවැය අඩු කිරීම හා විනිවිදභාවය වැඩි දියුණු කිරීම හරහා ඒකීය ප්‍රමිති ගොඩනැගීම මගින් ජාත්‍යන්තර වෙළෙඳපොළ වඩා තරඟකාරී හා කාර්යක්ෂම එකක් බවට පත් කළ හැකිය.[20]

*ක්‍රියාත්මක කිරීම :* පොදුවේ අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිතියක් පිළිගැනීමට හෝ තමන්ගේම පොදු ප්‍රමිතියක් සකස් කර ගැනීමට හෝ වෙළෙඳ පාර්ශ්වකරුවන් එකඟ වීම මගින් ප්‍රමිතීන් සුසංගත කිරීම සිදු කළ හැකිය. 'ජාත්‍යන්තර ප්‍රමිතිකරණය' පිළිබඳ සංකල්පය ලෝක වෙළෙඳ සංවිධානයේ SPS ගිවිසුමේ ප්‍රකාශයට පත් කර ඇත.[21] විවිධ ප්‍රමිතීන් භාවිත කිරීමට එකඟ වීම සඳහා (විද්‍යාත්මක සාධාරණීකරණයක්) පිළිගත හැකි පදනමක් නොමැතිනම්, ජාත්‍යන්තර ප්‍රමිතීන්, මාර්ගෝපදේශ හෝ නිර්දේශ මත් ී ජී ක්‍රියාමාර්ග පදනම් කරගත යුතු යැයි මේ ගිවිසුම රාජ්‍යයන්ට පවසයි.[22] ඒ හැරුණු විට, රට තුළ අනුගමනය කරනු ලබන නිත්‍යානුකූල අරමුණු සපුරාලීම සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් ඵලදායී හෝ යෝග්‍ය නොවන්නේ නම් අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව තාක්ෂණික නියාමනයන් (රෙගුලාසි) යොදා ගත යුතු බවටද TBT ගිවිසුම රාජ්‍යයන් වෙතින් අපේක්ෂා කරයි.[23]

ප්‍රමිතීන් සුසංගත කිරීම රෙගුලාසි හා ප්‍රමිතීන් අතර මනා සම්බන්ධයක් ඇති කිරීමට ද ඉවහල් වේ. මේ යාන්ත්‍රණය මගින් රීති එක හා සමාන වන බව පැහැදිලි වන අතර එසේ හෙයින්ම, බලප්‍රදේශය කුමක් වුව ද එක ම රීති අදාළ වන බවටත්, විවිධ කලාප, ප්‍රදේශ අතර පරීක්ෂා කිරීම හා සහතික කිරීම දෙවරක් සිදු නොවන බවටත් විශ්වාසයක් ඇති කර ගැනීමට වෙළෙඳපොළට නිෂ්පාදනයන් ඉදිරිපත් කරන සැපයුම්කරුවකුට අවකාශ ලැබේග[24] කලාපය තුළ රටවල් අතර වෙළෙඳාම පහසු කරවීම සඳහා ප්‍රමිතීන් සුසංගත කර ඇති කලාපීය පොදු සංවිධාන දෙකක් වන්නේ යුරෝපීය සංගමය සහ ASEAN සංගමය ය.[25]

---

[18] බලප්‍රදේශයක් තුළ ප්‍රමිතීන් හා රෙගුලාසිවල විවිධත්වයන් එක් එක් රට සම්බන්ධයෙන් නිත්‍යානුකූල ප්‍රතිපත්ති අරමුණු නියෝජනය කරයි. කෙසේ වුවද, මේ වෙනස්කම් අපනයනකරුවන්ට ගැටලුවක් බවට පත් විය හැකිය. වෙළෙඳපොළෙන් වෙළෙඳපොළට ප්‍රමිතීන් වෙනස් වන ආකාරය සම්මුඛ සාකච්ඡාවට භාජන වූ අපනයනකරුවන්ගෙන් බොහෝ දෙනෙක් ම සඳහන් කළ හ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බහුවිධ ප්‍රමිතීන්ට අනුකූල වීමට සිදුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳුන්ට දැරීමට සිදුවන පිරිවැය අඩු කිරීම සඳහා රටවල් ද්විපාර්ශ්වික හා කලාපීය ගිවිසුම්වලට එළඹේ. ප්‍රමිතීන් අතර ගැලපීමක් ඇති කිරීම එවැනි එක් ක්‍රියාමාර්ගයකි.

[19] 'ප්‍රමිතීන් හා අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රයන් තුළ බාහිර වෙළෙඳාම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම' උපකරණ මෙවලම් කට්ටලයක්, යුරෝපීය ප්‍රජා කොමිසම. 2001.

[20] ඩෙවෙරොා.සී., ලෝරන්ස් ආර්. සහ වොට්කින්ස්, එම්. ඩී., 'එක්සත් ජනපද වෙළෙඳ සාකච්ඡා පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්: රීති සැදීම'' ජාත්‍යන්තර ආර්ථික ආයතනය. 2006.

[21] සනීපාරක්ෂක හා ශාක සනීපාරක්ෂක ක්‍රියාමාර්ග යොදා ගැනීම පිළිබඳ ලෝක වෙළෙඳ සංවිධාන ගිවිසුම

[22] SPS ගිවිසුමේ 3.1 වගන්තිය

[23] 'TBT ගිවිසුමේ 2.4 වගන්තිය.

[24] 'ප්‍රමිති හා අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රයන් තුළ බාහිර වෙළෙඳාම සඳහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම : උපකරණ මෙවලම් කට්ටලයක්' යුරෝපීය ප්‍රජා කොමිසම 2011, 1

[25] 'අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුම් පිළිබඳ TACD තොරතුරු පත්‍රිකාව' Trans Atlantic Consumer Dialogue, 2001

*සීමා :* ලෝක වෙළෙඳ සංවිධානය (උඹධ* ප්‍රමිතීන් සුසංගත කිරීම දිරිගැන්වූවත්, එසේ ම එය වඩාත් ම ඵලදායි විසඳුම වශයෙන් ඒ ගිවිසුම යෝජනා කරනු ලැබුවත්,[26] පහත දැක්වෙන හේතු නිසාවෙන් ප්‍රායෝගික තත්ත්වයේදී එය ඉටු කර ගැනීම, දුෂ්කර හා කාලය වැයවන අරමුණක් බව සනාථ වී තිබේ.

- *දීර්ඝ සාකච්ඡා :* දෙරට විසින් අනුගමනය කරනු ලබන ප්‍රමිතීන් බොහෝ සේ අසමාන නම් විවිධ අපනයන කාණ්ඩ සඳහා යෝග්‍ය ප්‍රමිති මට්ටමක් තීරණය කර ගැනීමට සැලකිය යුතු වතාවක් දෙපාර්ශවය අතර සාකච්ඡා හා අදහස් හුවමාරු කර ගැනීම අවශ්‍ය වනු ඇත. උදහරණයක් වශයෙන් එක් රටකට සිය ප්‍රමිතිය පහළ දැමීමට හෝ තවත් රටකට සිය ප්‍රමිතිය ඉහළ නැංවීමට හෝ සිදු විය හැකිය. නිෂ්පාදන ප්‍රමාණය විශාල වන අවස්ථාවලදී මෙය විශේෂයෙන් ම බැරෑරුම් කාර්යයක් වේ. 1980 දශකයේ මුල් භාගයේදී යුරෝපා ප්‍රජාවේ සියලු ම සාමාජිකයින් එක්ව සාකච්ඡා හා එකඟත්වය පදනම් වූ ක්‍රියාවලියක් මගින් යුරෝපය තුළ පොදු ප්‍රමිති ස්ථාපනය කිරීම සඳහා ප්‍රයත්නයක් දරන ලදී.[27] කෙසේ වුව ද සාමාජික රටවලට විවිධ අසමාන අවශ්‍යතා පැවතීම හේතුවෙන් එහි ප්‍රගතිය ඉතා මන්දගාමී විය.[28]

- *පිරිවැය අධික ගැලපීම්:* රීති එකිනෙක හා මනාව සුසංගත කිරීම සඳහා එක් පාර්ශ්වයක රීති තවත් පාර්ශ්වයක රීති හා සමාන තත්ත්වයකට ගෙන ඒමෙන් හෝ (ඉල්ලුම් කරන රටවල් සම්බන්ධයෙන් ගෙන) එසේ නැත්නම් සම්පූර්ණයෙන්ම අලුත් රීති සකස් කර ගැනීමෙන් නියාමන අනුකූලනය කිරීම අවශ්‍ය වේ. පරිපාලන කටයුතු අතින් මෙන්ම නව ප්‍රමිතීන්ට අනුකූල විය යුතු නිෂ්පාදන සැපයුම්කරුවන් අතින් ද සලකන විට ද එවැනි ක්‍රියාපටිපාටි මිල අධිකය. නව ප්‍රමිතීන් සඳහා පරීක්ෂාවන් සිදු කිරීමට හැකි වන පරිදි උපකරණ සඳහා සහ පුද්ගලයින් පුහුණු කිරීම සඳහා රජයට ආයෝජනය කිරීමට සිදුවනු ඇති නිසා ඒ සඳහා පිරිවැය අධික ගැලපීම් ද අවශ්‍ය වනු ඇත.

  මේ සඳහා ජාතික තත්ත්ව යටිතල ව්‍යුහය (QI) ජාත්‍යන්තර භාවිතයන් හා සැසඳෙන පරිදි සකස් කිරීමට ද අවශ්‍ය වේ.[29] තවද, සුසංගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වඩා ඉහළ ප්‍රමිතියකට අනුකූල වීමට දේශීය නිෂ්පාදකයින්ට සිදු විය හැකි හෙයින් එය පිරිවැය අධික වෙනස් කිරීමක් බවට ද පත් වනු ඇත.[30]

- *දේශීය ආණ්ඩුවල වරණය සීමා කරයි:* පාරිභෝගිකයන්ගේ විශේෂිත ආර්ථික, සමාජ හා පාරිසරික වුවමනාවන් හා දේශීය කර්මාන්තවල ධාරිතාව යන කරුණුවලට වඩා හොඳින් ගැලපෙන යෝග්‍ය මට්ටමේ ජාතික ප්‍රමිතීන් නියම කිරීමට රටක රජයක් සතු හැකියාව මේ සුසංගත කිරීම නිසා වැළකී යයි. [31]

- *සහතිකවල අන්‍යොන්‍ය පිළිගැනීම සිදු නොකරයි. :* අනුගමනය කරනු ලබන රීති වෙළෙඳ පාර්ශ්වකරුවන් අතර එක හා සමාන වන බවටත්, නොඑසේ නම් අඩු වශයෙන් තාක්ෂණික වශයෙන් හෝ එකිනෙකට ගැලපෙන බවට සහතික වීම සුසංගත කිරීම ගැලපීම මගින් සිදු වන අතර ම ප්‍රමිතීන් හා රෙගුලාසි සම්බන්ධයෙන් අනුකූලතාව සනාථ කරන පරිද්දෙන් සහතික කිරීම වෙළෙඳ පාර්ශ්වකරුවන් පිළිගනු ඇත යන්න සහතික වීමක් ඉන් සිදු නොවේ. රටවල් දෙකේ රීති එක හා සමාන

---

[26] WTO SPS ගිවිසුමේ 3.1 වගන්තිය
[27]-එම-
[28]-එම-
[29]මවුර්, ජේ. සී. සහ ෂෙෆර්ඩ් බී. 'වරණාත්මක ගිවිසුම්, කලාපීය සහයෝගිතාව සහ ප්‍රමිතීන්, ලෝක වෙළඳ සංවිධානය 2011
[30]ප්‍රමිති හා අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රයන් තුළ බාහිර වෙළෙඳාම සඳහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම" යුරෝපීය ප්‍රජා කොමිසම, 2011, 1.
[31] මවුර් ජේ සී, ෂෙෆර්ඩ්, බී 'වරණීය ගිවිසුම්, කලාපීය සහයෝගිතාව හා ප්‍රමිතීන්', ලෝක වෙළෙඳ සංවිධානය, 2011.

වන විටදී පවා එක් රටක් විසින් නිකුත් කරනු ලබන අනුකූලතා සහතිකය පිළිගැනීම පදනම් වන්නේ අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග (CAPs) සහ අනෙක් රටේ අනුකූලතා තක්සේරු ආයතනවල (CABs) ධාරිතාව කෙරෙහි ආනයනය කරන රටේ ඇති විශ්වාසය මත ය. එබැවින්, පූර්ණ ප්‍රතිලාභ ලැබීම සඳහා සුසංගත වීමේ ප්‍රමිතීන්, අනුකූලතා සහතික අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීමට අනුපූරක විය යුතුය.[32]

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ප්‍රමිතීන් සුසංගත කිරීම දිගුකාලීන ඉලක්කයක් වන හෙයින් එය අපනයනකරුවන් මුහුණ දී ඇති ආසන්න ගැටලු විසඳා නොදෙනු ඇත. 2006 දී මේ ආකාරයේ ගිවිසුමකට එළඹීමෙන් පසුව පවා,[33] එහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම අරභයා රටවල් දෙක ම ප්‍රගතියක් ලබා නොතිබීමෙන් ඒ බව සනාථ වේ. එසේ ම ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික ඉන්දියාව පිළිගනු ඇතැයි යන්න මේ විසඳුමෙන් අවශ්‍යයෙන්ම සහතික කෙරෙන්නේ නැත. 1.3.2 කොටසේ අපනයනකරුවන්ගේ සම්මුඛ සාකච්ඡාවල ඉස්මතු කර දක්වෙන වර්තමාන ගැටලු ප්‍රධාන වශයෙන්ම අදාළ වන්නේ ප්‍රමිතීන්ටම පමණක් නොව ප්‍රමිතීන් සපුරාලනු ලබන බවට පරීක්ෂා කිරීම සඳහා වන අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටීන්ට ද ය.

## 2.2. සමානතා ගිවිසුම්

නිෂ්පාදන පරාමිතියක් සඳහා එකිනෙකට වෙනස් ප්‍රමිතීන් හෝ නියාමන ක්‍රියාමාර්ග දෙකක් පවත්වාගෙන යැමටත්, එනමුත් ප්‍රමිතීන් දෙක ම ක්‍රියාත්මක කරනු ලබන්නේ එක ම අරමුණ සපුරා ගැනීම සඳහා වන හෙයින් ඒවා එක හා සමාන ලෙස සැලකීමටත්, *සමානතා ගිවිසුම්* රටවලට ඉඩ සලසයි.

*අරමුණ:* සැබවින් ම, එකිනෙකට විකල්ප වශයෙන් වෙනස් ප්‍රමිතීන් දෙකක් ක්‍රියාත්මක වීම සඳහා සමානතාව ඉඩ සලසයි. මිනුම් තමන්ගේ ම ඒවාට වඩා වෙනස් වුව ද අනෙකුත් සාමාජික රාජ්‍යවල සනීපාරක්ෂක සහ photosanitary මිනුම් සමාන ලෙස සැලකීමට SPS ගිවිසුම රටවල් දිරිගන්වයි. මිනුම්වල අරමුණු එකම ඒවා වන බව ප්‍රදර්ශනය කිරීමට රටවලට හැකි නම් ඒවා වෙනස් වුවද සමාන ලෙස සලකනු ලැබේ. [34] තාක්ෂණික රෙගුලාසි සම්බන්ධයෙන් ද මේ හා සමාන විධිවිධාන දක්නා ලැබේ.[35]

*ක්‍රියාත්මක කිරීම :* පළමුව, නියාමනයක අරමුණු දැක්විය යුතුය. ඊළඟට එකී අරමුණු සමාන බවට එකඟ විය යුතු අතර අවසානයේදී ඒවා අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීමේ හැකියාව පිළිබඳ එකඟත්වයකට එළඹිය යුතුය. මේ සඳහා අංශයෙන් අංශය සවිස්තරාත්මකව ගෙන කටයුතු කළ යුතු හෙයින් මෙය සංකීර්ණ ක්‍රියාවලියකි. අනෙකුත් රටවල් විසින් එළඹි සමානතා ගිවිසුම් පිළිබඳ උදාහරණවලට එ. ජ. - කොරියා කාබනික සමානතා ගිවිසුම (2014) සහ එ. ජ. - ජපාන කාබනික සමානතා ගිවිසුම (2013) ඇතුළත් කළ හැක.[36]

*සීමා :* භාවිතයේදී ප්‍රබල මෙවලමක් ලෙස ගිනිය හැකි හා ලෝක වෙළෙඳ සංවිධානයේ වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක පිළිබඳ ගිවිසුම (TBT) විසින් නිර්දේශිත මෙවලමක් ලෙස ගිනිය හැකි වුවද මේ යාන්ත්‍රණය ප්‍රායෝගික තත්ත්වයේදී තාක්ෂණිකව සංකීර්ණ විය හැකිය. ඊට අමතරව, තාක්ෂණික

---

[32]'ප්‍රමිතීන් හා අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රයන් තුළ බාහිර වෙළෙඳාම සඳහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම : උපකරණ මෙවලම් කට්ටලයක්', යුරෝපීය ප්‍රජා කොමිසම. 2001, 11.

[33]ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය අතර ද්විපාර්ශ්වික සහයෝගිතා ගිවිසුම. 2006.

[34] SPS ගිවිසුමේ 4.1 වගන්තිය

[35]වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක ගිවිසුමේ (TBT) 2.7 වගන්තිය

[36]https://ota.com/resources/global-market-opportunities/trade-access-barriers/trade-agreements/us-korea-equivalency
https://www.ota.com/resources/global-market-opportunities/trade-access-barriers/trade-agreements/us-japan-equivalency

ක්‍රියාමාර්ගවලට සිදු කරනු ලබන කවර හෝ සැලකිය යුතු සංශෝධනයක් හෝ යාවත්කාල කිරීමක් (උද : වශයෙන් තාක්ෂණික ප්‍රගතිය සැලකිල්ලට ගනු පිණිස), අවශ්‍ය සමානතාව නිශ්චය කිරීමක් හා පිළිගැනීමක් සිදු කිරීමට ඉඩ ඇත. එබැවින්, මේ සාපේක්ෂව සරල මූලධර්මය, පොදුවේ යොදා ගැනීමේ හැකියාව පිළිබඳ සලකා බැලීම අපහසු ය.[37]

පාර්ශ්වයන්හි නියාමන ස්වාධීනත්වයට පූර්ණ ලෙස ගරු කරන අතරම වෙළෙඳාම ද පහසු කරවන බැවින් සමානතා ගිවිසුමක් යනු වටිනා මෙවලමකි. [38] කෙසේ වුවද, අධිකරණ බල ප්‍රදේශවල නියාමන වෙනස්කම් අවම වන අවස්ථාවලදී සහ බෙහෙවින් සංකීර්ණ ගැටලු සම්බන්ධ නොවන අවස්ථාවලදී මෙන් ම සංවර්ධන මට්ටම් සහ ආදායම සැසඳිය හැකි අවස්ථාවලදී මේ ක්‍රමය වැඩි ශක්‍යතාවෙන් යුක්ත වීමට ඉඩ ඇත.[39]

## 2.3. විදේශීය නිෂ්පාදකයා ප්‍රතීතනය කිරීම (බලය පැවරීම)

විදේශීය නිෂ්පාදකයා බලය ලත් අයෙකු වශයෙන් පිළිගැනීම *(ප්‍රතීතනය)* සඳහා භාණ්ඩ අපනයනය කර යැවෙන රටේ ජාතික ප්‍රමිති ආයතනයෙන් විදේශ නිෂ්පාදකයා කෙළින් ම ප්‍රතීතනය ලබා ගත යුතුය.

*අරමුණ :* මේ ක්‍රමය මගින් එකී නියමිත රටට අපනයනය කරනු ලබන නිෂ්පාදන මත අදළ ජාතික ප්‍රමිති ලකුණ තැබීමට විදේශීය නිෂ්පාදකයාට හැකි වන අතර එමගින් වරායවලින් භාණ්ඩ වඩා කඩිනමින් මුදා හැරීමේ පහසුව ඇති වේ.

*ක්‍රියාත්මක කිරීම :* මේ සම්බන්ධයෙන්, ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය නිෂ්පාදන සහතික කිරීමේ ක්‍රමයක් පවත්වා ගෙන යයි. මේ ක්‍රමය මගින්, ඉන්දියානු ප්‍රමිතිවලට භාණ්ඩයේ අනුකූලතාව තහවුරු කිරීමෙන් පසු ඒ මත ඉන්දියානු ප්‍රමිති කාර්යාංශ ප්‍රමිතීන් යොදා ගැනීමට විදේශීය නිෂ්පාදකයෙකුට හැකියාව ලැබේ.[40] මේ ක්‍රියාවලිය පහසු කරවීම උදෙසා:

- ඉන්දීය ප්‍රමිති කාර්යාංශ පරීක්ෂකවරුන්, විදේශීය නිෂ්පාදකයාගේ වියදමින් නිෂ්පාදන පහසුකම් පරීක්ෂා කිරීම සඳහා අදාල රටට යනු ඇත.
- ඉන්දීය ප්‍රමිති කාර්යාංශ පරීක්ෂකවරුන්, සමාගම සහ එහි නිෂ්පාදන පද්ධතිය පිළිබඳ සෑහීමකට පත් වන්නේ නම්, එය පෙර-සහතික කොට, ඉන් පසුව අධීක්ෂණ හා අනුකූලතාව සිදු කිරීම හරහා සමාගම විශේෂිත ප්‍රමිති පවත්වාගෙන යන බව සහතික කිරීම පිණිස ස්වාධීන පරීක්ෂකවරයකු වෙත බලය පවරනු ඇත.
- අපනයනකරු / නිෂ්පාදකයා ඉන්දියාවේ පෙනී සිටීම හෝ, අවම වශයෙන්, ඉන්දියාව තුළ බලය ලත් නියෝජිතයෙකු නම් කිරිම හෝ සිදු කළ යුතුය. නිෂ්පාදකයා සහ ඉන්දීය ප්‍රමිති කාර්යාංශය අතර අත්සන් කෙරෙන ගිවිසුම ප්‍රකාරව, අදාල නිෂ්පාදනය ඉන්දීය ප්‍රමිති කාර්යාංශ විධිවිධානවලට අනුකූල බවට මේ නියෝජිතයා වගකිව යුතු ය.

*සීමා :* කෙසේ වුව ද, මේ සහතික කිරීමේ ක්‍රමය උපකාර වන්නේ එය ලබා ගැනීමට කටයුතු කළ හැකි රටක මහා පරිමාණ ව්‍යාපාර කිහිපයකට පමණි. අපනයනය කරන රටේ ජාතික ප්‍රමිති ආයතනය විසින් කරනු ලබන පරීක්ෂා කිරීම් සඳහා පහසුකම් සැපයීමේ පිරිවැය දරා ගත යුත්තේ ඒ ඒ අපනයනකරුවා විසිනි. ඊට අමතරව, අපනයනය කරන රට විසින් නියම කරනු ලබන ප්‍රමිතීන් සඳහා පරීක්ෂා කළ හැකි

---

[37]'ප්‍රමිති සහ අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රයන් තුළ බාහිර වෙළෙඳාම සඳහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම: උපකරණ මෙවලම් කට්ටලයක්' යුරෝපීය ප්‍රජා කොමිසම. 2001, 12.
[38]-එම-
[39] ඔස්බෝර්න්, කේ. ''ව්‍යාපාර පරිසරය වැඩි දියුණු කිරීම' 2002, 6.
[40]'විදේශීය නිෂ්පාදන සහතික යෝජනා ක්‍රමය යටතේ ඉන්දීය ප්‍රමිති කාර්යාංශ බලපත්‍රය ප්‍රදානය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිය' (FMCS)', ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය

වන පරිදි පහසුකම් සඳහා ආයෝජනය කළ යුතු වන්නේ ද අපනයනකරු ය. ඒ හැරුණු විට සම්මුඛ සාකච්ඡාවට භාජන කළ මහා පරිමාණ අපනයනකරුවකු පැවසුවේ ඉන්දීය ප්‍රමිති කාර්යාංශය විසින්, වාර්ෂික විගණන සහිතව, පවත්වාගෙන යනු ලබන මේ ක්‍රියාවලිය, දිගුකල් ගත වන, දුෂ්කර සහ කාලය වැයවන එකක් බවය.

## 2.4. අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල (CAPs) අන්‍යෝන්‍ය පිළිගැනීම

අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ *අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක්* යනු ආනයනය කරන රටේ ජාතික ප්‍රමිතීන්ට හා නියාමනයන්ට නිෂ්පාදනවල අනුකූලතාව තක්සේරු කිරීම සඳහා එකිනෙක රටේ අනුකූලතා තක්සේරු ආයතනවල (CABs) හැකියාව සහ ධාරිතාව පිළිගැනීමට හවුල්කාර රටවල් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන ගිවිසුමකි.

*අරමුණ :* තම තමන්ගේම ප්‍රමිතීන් හා නියාමනයන් පවත්වාගෙන යෑම සඳහා අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් වෙළෙඳ හවුල්කරුවන් දෙදෙනාට ඉඩ සලසයි. අපනයනය කරන රට තුළ නිකුත් කරනු ලබන අනුකූලතා සහතික ආනයනය කරන රට තුළ පිළිගැනීමට ඉඩ සැලසීම නිසා භාණ්ඩ නැව්ගත කිරීමට පෙර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි හා සම්බන්ධ කාලය හා පිරිවැය අපනයනය කරන රට වෙත යොමු කිරීම එමගින් සිදු වේ.

*ක්‍රියාත්මක කිරීම :* ආනයනය කරන රටේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව තමන්ගේම රට තුළ පිහිටි පිළිගත් බලය පැවරුණු (ප්‍රතීතනය වූ) ආයතනවලින් නිෂ්පාදන පරීක්ෂා කිරීමට හා සහතික කිරීමට අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකින් අපනයනය කරන පාර්ශ්වයට ඉඩ සැලසේ. අපනයනය කරන පාර්ශවය එකඟ වූ අනුකූලතා තක්සේරු ආයතන (CABs) විසින් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා, සහතික සහ අනුමත කිරීම් පිළිගැනීමට ආනයනය කරන එක් එක් පාර්ශ්වය එකඟතාව පළ කරයි. එමගින්, ආනයනය කරන අවස්ථාවේදී අමතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවලට භාජනය නොවී භාණ්ඩ අපනයනය කිරීමටත් ආනයනය කරන රටේ වෙළෙඳපොළට යැවීමටත් හැකියාව ලැබේ.[41]

ප්‍රමිති හා නියාමනයන් මුළුමනින් ම සුසංගත කිරීමෙන් තොරව විදේශීය නිෂ්පාදකයින්ට දේශීය වෙළෙඳපොළට ඇතුළු වීමට ඇති බාධක මෙවැනි අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලින් අවම කෙරේ.

ආනයනය කරන ස්ථානයේදී අනුකූලතාව තක්සේරු කිරීම සඳහා ආනයනය කරන රට විසින් අනුගමනය කරනු ලබන වර්තමාන ක්‍රියාපටිපාටිය අනනුකූල, අයුතු, ආයාසකර, පිරිවැය අධික සහ කාලය ගත වන එකක් වන්නේ නම් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් වෙළෙඳ හවුල්කරුවන්ට ප්‍රතිලාභ සලසන වැඩපිළිවෙලක් වනු ඇත. එවැනි ක්‍රියාමාර්ග පිළිබඳ උදහරණ කිහිපයක් පහත දක්වේ: ආනයනය කරනු ලබන ස්ථානයට දුරස්ථව පිහිටන රසායනාගාරවලට සාම්පල යවනු ලැබීම සහ / හෝ පරීක්ෂණ වාර්තාව ලබා දීමට රසායනාගාර සැලකිය යුතු කාලයක් ගැනීම; නිෂ්පාදනය විනාශ වන භාණ්ඩයක් වන නමුත් වරාය සතුව ශීත ගබඩා පහසුකම් නොමැතිවීම ; හෝ ගබඩා ගාස්තු ඉතා අධික වීම සහ පරීක්ෂාව සඳහා ආනයනය කරන රට අය කරන ගාස්තු අසාධාරණ ලෙස ඉහළ මට්ටමක පැවතීම ආදිය.

අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක ප්‍රතිලාභවලට ඇතුළත් වන්නේ,- [42]

---

[41] 'ප්‍රමිති හා අනුකූලතා තක්සේරු ක්ෂේත්‍රවල බාහිර වෙළෙඳාම සඳහා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම : උපකරණ මෙවලම් කට්ටලයක්' යුරෝපීය ප්‍රජා කොමිසම. 2001.

[42] ''අන්‍යෝන්‍ය පිළිගැනීමේ ක්‍රියාමාර්ගයක් / එකඟත්වයක් වැඩි දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ' ලෝක රේගු සංවිධානය. 2011.

- තිසි සහතිකය ඇත්නම්, ප්‍රවේශ ස්ථානයේදී නිෂ්පාදන නැවත පරීක්ෂා කිරීම අනවශ්‍ය හෙයින්, භාණ්ඩ අපනයනය හා සම්බන්ධ කාලය හා වියදම් අඩු වීම;
- තමාගේ භූමි ප්‍රදේශයේ සිට වෙළෙඳ හවුල්කරුගේ භූමි ප්‍රදේශයට භාණ්ඩ ගෙන යෑමේදී, පුරෝකථනය කිරීමේ හැකියාව සහ නිරවද්‍යතාව වර්ධනය වීම;
- ප්‍රවේශ ස්ථානයේදී සහතිකය පිළිගැනීම සඳහා වෙළෙඳ හවුල්කරුවා අනුකූල විය යුතු ක්‍රියාමාර්ගයන් ගිවිසුමේ පැහැදිලිව සඳහන් කළ යුතු හෙයින් විනිවිදභාවය ඉහළ යෑම;
- ධාරිතාව තක්සේරු කිරීම හා අනුකූලතාව සහතික කිරීම සඳහා හවුල්කාර රටවල අනුකූලතා තක්සේරු ආයතන එකිනෙක සමග කටයුතු කළ යුතු වීම; හවුල්කාර රටවල අනුකූලතා තක්සේරු ආයතන අතර වර්ධනය වූ සන්නිවේදනයට හා ක්‍රියාකාරීත්වයන් සම්බන්ධීකරණයට මේ සහයෝගිතාව තුඩු දෙන හෙයින් අනුකූලතාව හා සම්බන්ධ ගැටලු කඩිනමින් විසඳීම සඳහා එය පෙරළා උපකාරී වීම

අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟත්ව සංකල්පය නව ප්‍රපංචයක් නොවන අතරම ලේඛනවල දක්වෙන පරිදි විවිධ රටවල විවිධ අංශ ඒ සඳහා පහසුකම් සලසා තිබේ. [43] ප්‍රමිතීන් අතර වෙනස්කම් ඉහළ මට්ටමක පවතින හා රටවල් දෙකේ ආදයම් මට්ටම් නොසැසඳෙන අවස්ථාවලදී අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට එළඹීම වඩා ප්‍රායෝගිකය. මේ විසඳුම සඳහා ප්‍රමිතීන් අතර සුසංගත බවක් අවශ්‍ය නොවන නිසා සාපේක්ෂ වශයෙන් කෙටි කාලසීමාවක් තුළ මේ ගිවිසුම ක්‍රියාත්මක කළ හැකිය.

රටවල් අතර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම අතින් ද අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් ප්‍රයෝජනවත් මෙවලමක් බව ඒ පිළිබඳව වන සාක්ෂි පෙන්වා දෙයි. අනෙකුත් (යුරෝපීය සංගම් නොවන) රටවල් සමග අනුකූලතා තක්සේරු කිරීම් ඇතුළත් වන යුරෝපීය අනුකූලතා තක්සේරු ගිවිසුම්වල බලපෑම් පිළිබඳ අධ්‍යයනයක් චෙන් සහ මැටූ (2008) විසින් සිදු කරනු ලැබ ඇත.[44] අනුකූලතා තක්සේරු අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් පාර්ශ්ව අතර වෙළෙඳාම සමාන ලෙස ප්‍රවර්ධනය කරන බව මේ අධ්‍යයනය මගින් සොයාගනු ලැබිණ. වඩා පුළුල් පරාසයක රටවල් සම්බන්ධයෙන් ද මේ ප්‍රතිඵලය යෙදෙන බව බැලර් විසින් (2007) සනාථ කරන ලදී.[45] ඇන් සහ මැස්කස් (2009) විසින් සිදු කළ අධ්‍යයනයටද සමාන සාධක භාවිත කරන ලද අතර, ජාත්‍යන්තර වශයෙන් ප්‍රමිතීන් සුසංගත කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභී බලපෑම්වලට වඩා වැඩි ප්‍රබල ප්‍රතිලාභයක් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලින් සංවර්ධනය වන රටවල අපනයනකරුවන්ටද ලැබෙන බව එහිදී තහවුරු කෙරිණි. [46] ආසියා ශාන්තිකර ආර්ථික සහයෝගිතාවේ (APEC) රටවල් අටේ සාමාජිකයන් අතර ආහාර නිෂ්පාදන වෙළෙඳාම පහසු කරවීම සඳහා APEC රටවල් ආහාර හා ආහාර නිෂ්පාදන පිළිබඳ අනුකූලතා තක්සේරුව පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාවෙහි යොදවා ඇත. ආනයනය කරන රටේ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවලින් ප්‍රමාද ඇති වන අවස්ථාවලදී සහ අපනයනකරුගේ පිරිවැය වැඩි කරන අවස්ථාවලදී අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් ප්‍රයෝජනවත් මෙවලමක් බවට පත් වේ.

*සීමා :* අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වල අවධානය යොමු වන්නේ ආනයනය කරන රට විසින් ප්‍රමිතීන් හා රෙගුලාසි පනවනු ලැබීමෙන් පසු අනුකූලතාව තක්සේරු කිරීමේ වගකීම ආනයනය කරන රටේ සිට අපනයනය කරන රටට පැවරීම කෙරෙහි පමණි. එය ආනයනය කරන රටේ ප්‍රමිතීන්හි හෝ නියාමනයන්හි (රෙගුලාසිවල) වලංගුභාවය අභියෝගයට ලක් නොකරයි. ඒ නිසා, ආනයනය කරන රට සෑහීමකට පත් වන පරිදි අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි සිදු කිරීමේ ධාරිතාව හා විශ්වාසනීයත්වය අපනයනය කරන

---

[43] උදාහරණ වශයෙන් වෙනත් රටවල් අතර අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් සඳහා 'ඇ' ඇමුණුම බලන්න

[44] චැෆර්, ජේ.පී සහ මවුර් ජේ. සී' සංවර්ධනය උදෙසා වරණාත්මක වෙළෙඳ ගිවිසුම් අත්පොතක්', ලෝක බැංකුව, 2011.

[45] -එම-

[46] -එම-

රටේ අනුකූලතා තක්සේරු ආයතන සතු වේ නම් පමණක් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් අපනයනකරුවන්ට ප්‍රතිලාභ සලසයි. ඉන් අදහස් වන්නේ අවශ්‍ය උපකරණ සහ තාක්ෂණික හැකියාව අනුකූලතා තක්සේරු ආයතන සතු විය යුතු බවත්, ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට හා නියාමනයන්ට අනුකූලතාව තක්සේරු කිරීම සඳහා හැකියාව ඇති එකක් වශයෙන් තුන්වැනි පාර්ශ්වයක් විසින් ප්‍රතීතනය කරනු ලබන බවත් ය.

තවද, අපනයනය කරන රටේ අනුකූලතා තක්සේරු ආයතන කාර්යක්ෂම, අනුකූල, විනිවිද පෙනෙන සහ සාධාරණ වන අවස්ථාවලට අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම සීමා වන අතර වැය වන කාලය සහ වියදම ආනයනය කරන රටේ වැය වන කාලයට හා පිරිවැයට වඩා සාපේක්ෂ වශයෙන් අඩු ය. අපනයනය කරන රටේ රසායනාගාර වරායට ආසන්නයේ පිහිටි, පරීක්ෂණ වාර්තා දිනක් ඇතුළත (හෝ පැය කිහිපයක් ඇතුළත) ලබා දෙන, ප්‍රමාදයන් වේ නම් ප්‍රමාදයට හේතු අපනයනකරුවන්ට ලබා දෙන සහ / හෝ වැය වන පිරිවැය ආනයනය කරන රටේ පිරිවැයට වඩා අඩු අවස්ථාවලදී මෙය දැකිය හැකිය.

යෝජිත විසඳුම් තුනෙන් ක්‍රියාත්මක කිරීමට වඩාත් ම පහසු වන්නේ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක්ය යන්න මේ අධ්‍යයනයේ නිගමනය වේ. සාකච්ඡා කරන ලද ක්‍රියාමාර්ග සහ ඒවායේ ප්‍රබලතා හා දුර්වලතා 3 වැනි රූප සටහනේ දක්වේ. තවද, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාම සැලකීමේදී අනුකූලතා ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් වඩාත් ම ප්‍රායෝගික වන්නේ ඇයිද යන්න තුන්වැනි පරිච්ඡේදයේදී සාකච්ඡා කරනු ඇත.

**3 වැනි රූපසටහන : අඩුපාඩු මඟහැරීම සඳහා යෝජිත විසඳුම්වල ප්‍රබලතා හා දුර්වලතා**

| විසඳුම | වාසි | අභියෝග |
|---|---|---|
| සුසංගත කිරීම | • රටවල් අතර ප්‍රමිතිවල සමානතාව සුරකියි<br>• ලෝ. වෙ. සං SPS ගිවිසුමෙන් දිරිගන්වනු ලබයි<br>• දෙවරක් පරීක්ෂා කිරීම වළක්වයි | • එකඟතාවන් පිළිබඳ සාකච්ඡා කල්ගත වෙයි<br>• නියාමකයින්ට හා නිෂ්පාදකයින්ට පිරිවැය අධික ගැලපීම් හමු වෙයි<br>• රටට විශේෂ වූ ප්‍රමිති සීමා කෙරෙයි |
| සමානතා ගිවිසුම් | • වෙළෙඳ හවුල්කරුවන්ගේ නියාමන ස්වාධීනත්වය පවත්වා ගනී<br>• දෙවරක් පරීක්ෂා කිරීම වළක්වයි | • ක්‍රියාත්මක කිරීමේදී තාක්ෂණික වශයෙන් සංකීර්ණ ය |
| විදේශ නිෂ්පාදන ප්‍රතීතනය | ආනයනය කරන රටේ ප්‍රමිති ආයතනය විසින් නිෂ්පාදන සහතික කරනු ලැබේ. | • පිරිවැය අධිකය<br>• කර්මාන්තය අංශයෙන් විසඳුමක් නොවේ |
| අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ CAPs අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් (MRA) | • අඩු කාලය හා පිරිවැයකි<br>• විනිවිදභාවය ඉහළ ය<br>• සන්නිවේදනය හා සම්බන්ධීකරණය වර්ධනය වේ | • දෙවරක් පරීක්ෂා කිරීම නොවළක්වයි<br>• ප්‍රමිති සඳහා පරීක්ෂා කිරීමට අනුකූලතා තක්සේරු ආයතනවල ධාරිතාව සහ විශ්වසනීයත්වය ලැබේ |

# තුන්වැනි පරිච්ඡේදය - ඉදිරිමග

ඉන්දියාවට භාණ්ඩ අපනයනය කරන ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට, තීරුබදු නොවන බාධකයක් ලෙස සක්‍රීයව ක්‍රියාත්මක වන, කල්ගත වන හා පිරිවැය අධික අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් ඇති විසඳුම් මීට පෙර කොටසේදී පෙන්වා දෙන ලදී. අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA on CAPs) ඉතා ම ප්‍රායෝගික විසඳුම වන්නේ කෙසේද යන්නත්, එවැනි වැඩ පිළිවෙලක් සාර්ථක වීම සඳහා එවැනි ගිවිසුමකට පහසුකම් සැලසීම අවශ්‍ය වන්නේ කෙසේද යන්නත් මේ පරිච්ඡේදයේදී සංක්ෂිප්ත කර දක්වනු ඇත. මෙහි සාකච්ඡා කෙරෙන මූලික ක්ෂේත්‍රයන් වන්නේ :

- ඉන්දියාව සමඟ අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් 'හොඳම' විසඳුම වන්නේ ඇයි?
- CAPs පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක වන්නේ කෙසේද ?
- ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ
  - යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමෙන් (CEPA) අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුම වෙන් කිරීම
  - ක්‍රියාත්මක කිරීම සඳහා අදියර වශයෙන් වූ ප්‍රවේශයක් අනුගමනය කිරීම
    - ප්‍රමුඛතා නිෂ්පාදන තෝරා ගැනීම
    - අදාළ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) සහ අනුකූලතා තක්සේරු ආයතන (CABs) හඳුනා ගැනීම
    - අවශ්‍ය CAPs සිදු කිරීමට සහ MRA ක්‍රියාත්මක කිරීමට CABs සතු ධාරිතාව හා විශ්වසනීයත්වය තහවුරු කිරීම
  - අපනයන පරීක්ෂණ යෝජනා ක්‍රමයක් / ආයතනයක් ස්ථාපනය කිරීම

## 3.1. ඉන්දියාව සමඟ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) 'හොඳම' විසඳුම වන්නේ ඇයි?

ඉන්දියානු වෙළෙඳපොළට භාණ්ඩ අපනයනය කරන ශ්‍රී ලාංකික අපනයනකරුවන් මුහුණ දෙන අනුකූලතා ගැටලුවට ඉතාම ප්‍රායෝගික විසඳුම වන්නේ ඉන්දියාව සමඟ CAP පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට එළඹීම බව මෙම වාර්තාවේ පූර්ව පරිච්ඡේද ඉතා පැහැදිලිව පෙන්වා දී ඇත. ප්‍රමිතීන් සුසංගත කිරීම අවශ්‍ය වන ගිවිසුමක් හා සැසඳීමේදී CAP පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම වඩා පහසු ය. ඊට හේතුව තමන්ගේම ප්‍රමිතීන් පවත්වා ගැනීමට එය එක් එක් රටට ඉඩ සලසන නිසාය. එක ම අවශ්‍යතාව වන්නේ එක් එක් රටවල්, අපනයනය කරන රටේ පිළිගත්, බලය ලත් හා ප්‍රතීතනය වූ අනුකූලතා තක්සේරු ආයතන (CABs) විසින් නිකුත් කරනු ලබන අනුකූලතා සහතික පිළිගැනීමට එකඟ වීම පමණි. ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට සහ නියාමනයන්ට නිෂ්පාදනය අනුකූල වන බව සහතිකය සනාථ කරයි. අපනයනය කරන ස්ථානයේදී අනුකූලතා තක්සේරුව හා සනාථ කිරීම සිදු වන නිසා ආනයන ස්ථානයේදී අනුකූලතාව සනාථ කිරීමේ අපහසුවට මුහුණ දීමට අපනයනකරුට සිදු නොවේ. (4 වැනි රූපසටහන).

ඊට අමතරව, පහත දැක්වෙන හේතු නිසා ද ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක ශක්‍යතාව පැහැදිලි වේ:

(අ) අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා විධිවිධාන ඉන්දියාවේ නව වෙළෙඳ ගිවිසුම්වලට දැනටමත් ඇතුළත් වී තිබේ

ශ්‍රී ලංකාව සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමට එළඹීමෙන් පසු ඉන්දියාව නිදහස් වෙළෙඳ ගිවිසුම් රාශියකට එළඹ තිබේ.[47] තෝරාගත් නිෂ්පාදන පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා පැහැදිලි විධිවිධාන මේ ගිවිසුම්වල ඇතුළත් වී තිබේ. උදාහරණ වශයෙන්, ඉන්දියා- ජපාන ගිවිසුමේ 55 වැනි වගන්තිය,[48] ඉන්දියා-සිංගප්පූරු ගිවිසුමේ 5.1 වගන්තිය,[49] ඉන්දියා-මැලේසියා ගිවිසුමේ 7.2 වගන්තිය[50] සහ ඉන්දියා - කොරියා ගිවිසුමේ 2.28 [51] වගන්තිය අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් ගැන සඳහන් කොට ඇත.[52]

(ආ) නිදහස් වෙළෙඳ ගිවිසුමකින් තොරව පවා ඉන්දියාව වෙළෙඳ හවුල්කරුවන් සමඟ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලට එළඹ තිබේ.

එකිනෙක රටේ ප්‍රමිතීන්ට සහ නියාමනයන්ට අනුකූලතාව පහසු කරවීමේ එකඟත්වයකට ඉන්දියාව හා චීනය එළඹ තිබේ. 'ඉන්දියාවේ අපනයන පරීක්ෂණ සභාව (EIC) සහ චීන මහජන සමූහාණ්ඩුවේ තත්ත්ව අධීක්ෂණය, පරීක්ෂාව සහ නිරෝධායනය පිළිබඳ පොදු පරිපාලනය (AQSIQ)' යනුවෙන් හැඳින්වෙන ගිවිසුමට 2013 මැයි මාසයේදී අත්සන් කරනු ලැබ ඇත. ඉන්දියාවේ අපනයන පරීක්ෂණ සභාවට EIC සහ AQSIQ විසින් අපනයන සහතික නිකුත් කිරීම හා දෙපාර්ශ්වයේ ම නෛතික අවශ්‍යතා ප්‍රකාරව සත්‍යාපනය (verification) සිදු කිරීම සඳහා නිසි බලධාරියෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා එකිනෙකා පිළිගැනීමට මේ ගිවිසුම විධිවිධාන සලසයි.[53]

(ඇ) ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමේද ඃකැජ්* අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට එස් එළඹීම සඳහා විධිවිධාන ඇතුළත් වේ.

ඉන්දු - ශ්‍රී ලංකා CEPA ගිවිසුම පළමුව යෝජනා කරන ලද්දේ 2002 දීය. ගිවිසුම පිළිබඳ ඒකාබද්ධ අධ්‍යයන වාර්තාවක් 2003 දී නිකුත් කරන ලද අතර 2005 දී තාක්ෂණික එකඟතා පිළිබඳ සාකච්ඡා ආරම්භ විය. කෙසේ වුව ද, අවසාන වරට 2008 දී ඇතුළුව අවසන් කාලසීමා කිහිපයක් ම මඟ හැරී යෑමෙන් පසු ගිවිසුම තවමත් පවතින්නේ අවසන් සැලසුම් අදියරේය. ඇමුණුමක් වශයෙන් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ද ගිවිසුමට ඇතුළත් වීමට නියමිතව තිබුණි. එය ඇතුළත් කිරීමෙන් පෙනෙන්නේ වෙළෙඳාමට ඇති අනුකූලතාව හා බැඳුණු බාධක පිටුදැකීමේ ඉදිරි මඟක් වශයෙන් දෙරට අතර අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් තිබීමේ වැදගත්කම දෙරටම දැනටමත් හඳුනාගෙන ඇති බව ය.

---

[47] http://commerce.nic.in/MOC/international_trade_agreements.asp

[48] ඉන්දීය ජනරජය සහ ජපානය අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම - 2011.

[49] ඉන්දීය ජනරජය සහ සිංගප්පූරු ජනරජය අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමේ 5 ආ ඇමුණුම. 2005.

[50] ඉන්දීය ජනරජ ආණ්ඩුව සහ මැලේසියානු රජය අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම උදෙසා වන එකඟත්වය. 2011.

[51] ඉන්දියා - කොරියා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම 2009

[52] ඉන්දියා - සිංගප්පූරු සහ ඉන්දියා - මැලේසියා ගිවිසුම්වල විස්තර සඳහන් 'ඇ' ඇමුණුම බලන්න.


[53] ඉන්දීය රජයේ වාණිජ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ඉන්දියා අපනයන පරීක්ෂණ සභාව සහ චීන මහජන සමූහාණ්ඩුවේ තත්ත්ව අධීක්ෂණය, පරීක්ෂාව සහ නිරෝධායනය පිළිබඳ පොදු පරිපාලනය අතර ආහාර සහ ආහාරවල අඩංගු ද්‍රව්‍ය පිළිබඳ වෙළෙඳාම හා සුරක්ෂිතතාව පිළිබඳ ගිවිසුමේ 2 වැනි වගන්තිය ආහාර හා ආහාරවල අඩංගු ද්‍රව්‍ය වෙළෙඳාම හා සුරක්ෂිතතාව සම්බන්ධ අන්‍යෝන්‍ය සහයෝගිතාව ශක්තිත් කිරීමත් ඒවා සම්බන්ධ සුරක්ෂිතතාව හා සනීපාරක්ෂාව සහ ශාක නිරොධායන අවශ්‍යතා පිළිබඳ නියාමන අවශ්‍යතා සපුරාලීමත් ගිවිසුමෙන් අපේක්ෂා කරනු ලැබිණ.

## 3.2. අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක වන්නේ කෙසේද?

ගිවිසුම යටතට ගැනෙන නිෂ්පාදිත විශේෂිතව දැක්වෙන අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට ඉන්දියාව හා ශ්‍රී ලංකාව අත්සන් තබනු ඇත. ගිවිසුමේ හඳුනාගනු ලබන නිෂ්පාදිත පරීක්ෂා කිරීම සඳහා අනුකූලතා තක්සේරු ආයතනවලට බලය පැවරීම සඳහා එක් එක් රටේ වගකිව යුතු බලධාරීන් කවරේදැයි ගිවිසුම විසින් හඳුනා ගනු ඇත. වෙළෙඳ හවුල්කරුගේ ප්‍රමිති හා නියාමන සඳහා පරීක්ෂා කිරීමේ බලය අනුකූලතා තක්සේරු ආයතනවලට පැවරෙනු ඇත.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳව අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක වන ආකාරය 4 වැනි රූපසටහනේ විස්තර කොට ඇතග.

**4** වැනි රූප සටහන **: ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමේ යෝජිත ව්‍යුහය**




ගිවිසුම යටතට ගැනෙන නිෂ්පාදිත අපනයනය කිරීමට ශ්‍රී ලංකාවේ අපනයනකරුවෙකු අපේක්ෂා කරන්නේ නම්, එකී විශේෂිත නිෂ්පාදිතයට අදාළ ඉන්දියානු ප්‍රමිතිවලට හා නියාමනයන්ට ඇති අනුකූලතාව සනාථ කිරීම සඳහා බලයලත් (ප්‍රතීතනය වූ) අනුකූලතා තක්සේරු ආයතනයක් (CAB) (උදා : අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුම ප්‍රකාරව ප්‍රතීතනය වූ) මගින් නිෂ්පාදිතය පරීක්ෂා කරවා ගැනීමට අපනයනකරුට සිදු වේ. ඉන් පසුව අදාළ සහතිකය ද සමඟ නිෂ්පාදිතය ඉන්දියාවට යවනු ලැබේ. ප්‍රවේශ ස්ථානයේදී, හැම භාණ්ඩ තොගයක් ම අනුකූලතාව සහතික කිරීම සඳහා වෙන වෙනම පරීක්ෂාවන්ට භාජන නොකොට නිෂ්පාදිත කෙළින්ම ඉන්දියානු වෙළෙඳපොළට යැවිය හැකිය. ශ්‍රී ලාංකික වෙළෙඳපොළට එන ඉන්දියානු අපනයන සම්බන්ධයෙන් ද ඒ ක්‍රියාවලියම අනුගමනය කරනු ලැබේ.

ප්‍රවේශ ස්ථානයේදී එක් එක් වෙළෙඳ හවුල්කරු විසින් සිදු කළ හැකි අහඹු පරීක්ෂාවන් කොතරම් කාලයකට වරක් සිදු කළ යුතුද යන්න ගිවිසුමේ විශේෂයෙන් සඳහන් කළ හැකිය.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් පහත දැක්වෙන හේතු නිසා සාධ්‍ය විසඳුම වේ:

- ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය සහ ඉන්දියානු අපනයන පරීක්ෂණ සභාව (EIC) අතර දැනට ඇති ගිවිසුමෙන් ඉන්දීය අපනයනකරුවන්ට පමණක් ප්‍රතිලාභ සැලසෙන නමුත් මේ ගිවිසුම 'අන්‍යෝන්‍ය' වන අතර දෙරටේ ම අපනයනකරුවන්ට ප්‍රතිලාභ සලසනු ඇත;
- දෙරට අතර ප්‍රමිතීන්ගේ ගැලපීමක් අවශ්‍ය වන ගිවිසුම් වෙන් කොටගන්නා බැවින් මේ ගිවිසුමේදී දුෂ්කර, දීර්ඝ, සහ කාලය වැය වන සාකච්ඡා සඳහා වන අවශ්‍යතාව වැළකේ.
- ඉන්දියානු ප්‍රමිති කාර්යාංශයේ (BIS) විදේශීය නිෂ්පාදන භාවිතය ලබාගැනීමට සිදු වීමෙන් සමාගම්වලට තනි තනිව දරන්නට සිදුවන පිරිවැය අඩුවන අතර BIS ප්‍රතීතන ප්‍රතිලාභය ලබා ගැනීමේ වියදම් දැරිය නොහැකි සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට ඉන් ප්‍රතිලාභ සැලසේ;
- BIS සහ SLSI ප්‍රමිතීන්ට අමතරව, දෙරටේම විවිධ බලධාරීන් විසින් පනවනු ලබන වෙනත් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට ද අපනයනකරුවන්ට සිදු වේ.[54] දැනට ක්‍රියාත්මකව පවතින යාන්ත්‍රණය අවධානය යොමු කරන්නේ BIS සහ SLSI ප්‍රමිති සහතිකය කෙරෙහි පමණි. අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට අදාළ සියලුම ප්‍රමිතීන් හා නියාමනයන් ඇතුළත් වන වඩා පුළුල් විෂය සීමාවක් වන අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි වෙළෙඳාමට අනවශ්‍ය බාධකයක් ලෙස ක්‍රියාත්මක වේ.

## 3.3. ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ

අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ යෝජිත ගිවිසුම හුදෙක් කඩදාසියක ලියැවුණු ගිවිසුමකට වඩා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන කාර්යයන් සිදු කළ යුතු බවට මේ අධ්‍යයනය නිර්දේශ කරයි:

### 3.3.1. යෝජිත CEPA ගිවිසුමෙන් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (MRA) වෙන් කිරීම

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර යෝජිත CEPA ගිවිසුමෙන් අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම වෙන් කිරීමේ ප්‍රබල අවශ්‍යතාව මතු කරන හේතු කිහිපයකි.

පළමුව, එය ''භාණ්ඩ වෙළෙඳාම'' හා සම්බන්ධ ගැටලුවක් වන අතර භාණ්ඩ පිළිබඳ නිදහස් වෙළෙඳ ගිවිසුමක් දැනටමත් දෙරට සතුව පවතී. අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් අත්සන් කිරීම සඳහා CEPA ගිවිසුමක් තිබීම අවශ්‍යම නැත. අත්සන් කරන ලද ගිවිසුම්වලට භාණ්ඩ සේවා, වෙළෙඳාම සහ ආයෝජනය යන දේවල් එක් වරම ඇතුළත් වන නිසා විස්තීර්ණ ගිවිසුම් විෂය පථය යටතේ ඉන්දියාව අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්වලට එළඹ තිබේ. අනෙක් අතට ඉන්දියාව ශ්‍රී ලංකාව සමඟ දැනටමත් නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹී සිටී. ඉන්දියාවේ අනෙකුත් ගිවිසුම් මෙන් නොව යෝජිත ඉන්දියා - ශ්‍රී ලංකා CEPA ගිවිසුමේ අරමුණ වන්නේ සේවා මෙන්ම ආයෝජන ද ඇතුළත් වන පරිදි වර්තමාන නිදහස් වෙළෙඳ ගිවිසුම පුළුල් කිරීම ය.

---

[54] ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන ආයතන ලැයිස්තුවක් සඳහා 'අ' සහ 'ආ' ඇමුණුම් බලන්න.


දෙවනුව, දෙරටම නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹ ඇති අතර දෙරට අතර වෙළෙඳාම ව්‍යාප්ත කිරීමේ අරමුණින් තීරුබදු සහන ද පුළුල් කර තිබේ. එබැවින්, ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවන්ගෙන් පැනනගින අමතර පිරිවැය හා ප්‍රමාදයන් ඉවත් කිරීම සඳහා අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම වැනි පියවර ගැනීම ගිවිසුමේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට උපකාරී වනු ඇත.

තෙවනුව, මේ අංශ වැඩිදුරටත් ලිබරල්කරණය කිරීම සම්බන්ධයෙන් දැනටමත් හටගෙන ඇති සමාජ - ආර්ථික හා දේශපාලන සංවේදීතාවන් නිසා, සේවා හා ආයෝජනය ඇතුළත් වන විස්තීර්ණ ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා කිරීමට දිගු කාලයක් ගත විය හැකිය. CEPA පළමු යෝජනාව ඉදිරිපත් වී වසර 12කට ආසන්න කාලයක් ගත වී ඇති නමුත් ගිවිසුම තවමත් ඇත්තේ අවධානය අඩු තත්ත්වයකය. අනෙක් අතට, අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම එතරම් ප්‍රමාදයක් නැතිව ක්‍රියාත්මක කළ හැකි සාපේක්ෂ වශයෙන් සෘජු ගිවිසුමකි. ඒ නිසා CEPA ගිවිසුමෙන් ආනයනය පිළිගැනීමේ ගිවිසුම වෙන් කිරීම එය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට හේතුවනු ඇති අතර එය දෙරටේ ම වෙළෙඳුන්ට ප්‍රතිලාභ සලසනු ඇත.

අවසාන වශයෙන්, අපනයන කෙරෙහි තීරුබදු නොවන බාධකවල සෘණාත්මක බලපෑම සහ ගැටලුව විසඳීම සඳහා රාජ්‍යයන් දෙක විසින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ගයේ දුර්වලතා නිසා CEPA ගිවිසුමකට එළඹීමේ ප්‍රතිඵලයක් වශයෙන් දෙරට අතර වෙළෙඳාම හා ආයෝජනය වැඩිදුරටත් ලිබරල්කරණයෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ශ්‍රී ලාංකික අපනයනකරුවන් තුළ සැකයක් ඇති වී තිබේ. එබැවින්, තීරුබදු නොවන  බාධක දුරලීම සඳහා අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම වැනි ක්‍රියාමාර්ග, නිදහස් වෙළෙඳ ගිවිසුමේ ප්‍රතිලාභ කෙරෙහි විශ්වාසයක් ගොඩනැගීමටත් CEPA පිළිබඳ නිර්මාණාත්මක සංවාදයක් ඇති කිරීම සඳහා වඩා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමටත් උපකාරී වනු ඇත.

### 3.3.2. ක්‍රියාත්මක කිරීම සඳහා අදියර වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රවේශයක් අනුගමනය කිරීම

**5 වැනි රූපසටහන : ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් සඳහා අදියර වශයෙන් වූ ප්‍රවේශය**



අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා 5 වැනි රූපසටහනේ දැක්වෙන ආකාරයේ අදියරගත ප්‍රවේශයක් අනුගමනය කිරීම ඉතා සුදුසු ය. එක් එක් රටේ අනුකූලතා තක්සේරු ආයතනවලට ශක්‍යතාව හා විශ්වසනීයත්වය සහිත වන, ආනයනය කරන රටේ ප්‍රමිතීන් සඳහා අනුකූල වන ප්‍රමුඛතා නිෂ්පාදිත ගිවිසුමට පළමුවෙන් ම ඇතුළත් වනු ඇත. කාලානුරූපව නිෂ්පාදිත එකතු කිරීමට හැකි වන පරිදි විධිවිධාන / නම්‍යතාව ගිවිසුම සතු විය යුතුය.

අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම සඳහා සරල පියවර පහක ක්‍රියාවලියක් 6 වැනි රූපසටහනේ දක්වා ඇත.

**6 වැනි රූප සටහන : ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේ පියවරෙන් පියවර ක්‍රියාමාර්ගය**




### 3.3.2.1. 1 වැනි පියවර : ප්‍රමුඛතා නිෂ්පාදිත තෝරා ගැනීම

දෙරටම එකිනෙක සමඟ, නිෂ්පාදිත විශාල සංඛ්‍යාවක් වෙළෙඳාමේ යෙදී සිටී. කෙසේ වුව ද, අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) නිසා සියලු ම නිෂ්පාදිතවලට එක හා සමාන අහිතකර බලපෑම් ඇති වන්නේ නැත. වෙළෙඳාමට පහසුකම් සැලසීම හා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා ගිවිසුම එලදායී කරනු පිණිස ප්‍රමුඛතා නිෂ්පාදිත හඳුනාගැනීම අත්‍යවශ්‍ය ය. ප්‍රමුඛතා නිෂ්පාදිත හඳුනාගැනීම සඳහා නිර්ණායක තුනක් භාවිතා කළ හැකිය. ඒවා නම් (අ) අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල බලපෑම (ආ) තීරුබදුවල බලපෑම සහ (ඇ) අපනයන විභව්‍යතාව ය.

(අ) අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල බලපෑම

අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමකට ඇතුළත් විය යුත්තේ, අපනයනයන්ට, අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි සැලකිය යුතු අවහිරයක් ඇති කරන නිෂ්පාදිතයන්ය. මෙය ආකාර කිහිපයකින් මැනිය හැකිය. අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵලයක් වශයෙන් පිරිවැය හා කාලය අතින් වැඩියෙන් ම බලපෑමට ලක් වන්නේ කුමන නිෂ්පාදිත ද යන්න හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන කරුණු පිළිබඳ අපනයනකරුවන්ගෙන් / ආනයනකරුවන්ගෙන් ලැබෙන සමීක්ෂණ දත්ත /තොරතුරු භාවිත කළ හැකිය.

(ආ) තීරුබදු බලපෑම

මින් අදහස් වන්නේ වෙළෙඳාමට බාධකයක් වශයෙන් තීරුබදුවල බලපෑමේ ප්‍රමාණයයි. අපනයනකරුවන් ගෙවිය යුතු තීරු බද්ද ඉහළ යත්ම එහි බලපෑම ද ඉහළ යයි. උදහරණයක් වශයෙන්,

නිදහස් වෙළෙඳ ගිවිසුමේ තීරු බද්ද (ධනාත්මක ලැයිස්තුවේ නිෂ්පාදිත සඳහා) හෝ වඩාත්ම අනුග්‍රහ ලැබෙන ජාතියේ තීරුබද්ද (ඍණ ලැයිස්තුවේ නිෂ්පාදිත සඳහා) 5% කට වඩා අඩු නම්, එවිට වෙළෙඳාමට සැලකිය යුතු බාධකයක් වශයෙන් ඒ ක්‍රියා නොකරයි. එබැවින්, ආනයන වෙළෙඳපොලේ දේශීය ඉල්ලුම සහ සැපයුම් තත්ත්වයන් පිළිබඳ තක්සේරුවක් සහිතව, තීරුබදු ගණන් පදනම් කරගත් තීරුබදු බලපෑම පිළිබඳ ආරම්භක තක්සේරුවක් මනා ලෙස සකස් කර ගැනීම අවශ්‍ය වේ.

(ඇ) අපනයන විභව්‍යතාව

අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටියේ බලපෑම සහ තීරුබදු බලපෑම් පදනම් කරගෙන නිෂ්පාදිත ප්‍රමුඛතාගත කළ පසු, ඒවායේ අපනයන විභව්‍යතාව තක්සේරු කිරීම වැදගත් ය. අපනයනය කරන රටේ ප්‍රමිතින්ට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා උපකරණ හා පුහුණුව සඳහා ආයෝජනය කිරීමට අපනයනය කරන රටේ ආණ්ඩුවලට / අනුකූලතා තක්සේරු ආයතනවලට සිදු විය හැකි ය. අපනයන වඩා ඉහළ යෑම හේතුවෙන් රටට ලැබෙන ප්‍රතිලාභවලට සාපේක්ෂව එවැනි ආයෝජනවල පිරිවැය තක්සේරු කළ යුතුය. උදහරණයක් වශයෙන්, නිෂ්පාදිතයක් සතුව ඇත්තේ ඉතා අඩු අපනයන විභව්‍යතාවක් නම්, එකී නිෂ්පාදනයට හිතකර වන පරිදි වර්තමාන යටිතල ව්‍යුහය වැඩි දියුණු කිරීම සඳහා විශාල ලෙස ආයෝජනය කිරීම ප්‍රඥාගෝචර නොවිය හැකි ය. අපනයන විභව්‍යතාව තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි දර්ශක දෙකක්, (අනාවරණය වූ තුලනාත්මක වාසිය පිළිබඳ බැලැස්සා දර්ශකය (Balassa Index) සහ සාපේක්ෂ සූචක වෙළෙඳ විභව්‍යතා දර්ශකය (Relative Indicative Trade Potential), 'ඉ' ඇමුණුමේ විස්තර වේ.

අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් යටතේ ගැනීමට නියමිත ප්‍රමුඛතා නිෂ්පාදිත තක්සේරු කිරීම සඳහා ඉහත නිර්ණායක සාමූහික වශයෙන් භාවිතා කළ හැකි ආකාරය 7 වැනි රූපසටහන මගින් පැහැදිලි කර ඇත.

**7 වැනි රූප සටහන : වෙළෙඳාම සඳහා ප්‍රමුඛතා නිෂ්පාදිත තේරීමේ නිර්ණායක**



### 3.3.2.2. 2 සහ 3 වැනි පියවර : අදාළ CAPs සහ CABs හඳුනා ගැනීම

ප්‍රමිතීන්ගේ හා නියාමනවල වෙනස්කම් අනුව එක එක් රටේ අනුකූලතා තක්සේරු අවශ්‍යතා / ක්‍රමවේද වෙනස් වනු ඇත. ඒ හේතුවෙන්, නිෂ්පාදනවල ප්‍රමුඛතා ලැයිස්තුව හඳුනා ගැනීමෙන් පසු අනුකූලතාව තක්සේරු කිරීමේ වගකීම පැවරෙන එක් එක් රටේ අදළ ප්‍රමිති සහ රෙගුලාසි මෙන්ම CAPs හා බලධාරීන් ද හඳුනා ගත යුතුය. .[55] විවිධ ආහාර නිෂ්පාදිත සඳහා ඇති අනුකූලතා ක්‍රියාපටිපාටි වර්ග සහ වගකීම පැවරෙන ආයතන පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ:

(අ) ශ්‍රී ලංකාව තුළ

**1 වන වගුව - ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදිත සඳහා අදාළ වන ප්‍රමිති සහ රෙගුලාසි**

| | ප්‍රමිති සහ රෙගුලාසි | ආයතනය |
|---|---|---|
| සියලුම ආහාර නිෂ්පාදන | ආහාර පනතේ සම්මත කරන ලද රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නියම කරනු ලබන ප්‍රමිති | ආහාර අධිකාරිය - සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| ශාක හා රෝපණ ද්‍රව්‍ය | ශාක ආරක්ෂණ පනත යටතේ සම්මත කරන ලද රෙගුලාසි සහ ආනයන බලපත්‍රවල දැක්වෙන විශේෂිත අවශ්‍යතා | ජාතික ශාක නිරෝධායන සේවය - කෘෂිකර්ම අමාත්‍යාංශය |
| පශු සම්පත් නිෂ්පාදන | පශු සම්පත් නිෂ්පාදන සඳහා වන බලපත්‍රයේ දැක්වෙන විශේෂිත අවශ්‍යතා | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| වෙනත් නිෂ්පාදන | කර්මාන්තයට විශේෂිත රෙගුලාසි | අදාළ කර්මාන්තය |

(ආ) ඉන්දියාව තුළ

**2 වන වගුව - ඉන්දියාවේ ආහාර නිෂ්පාදිතවලට අදාළ ප්‍රමිති හා රෙගුලාසි**

| | ප්‍රමිති හා රෙගුලාසි | ආයතනය |
|---|---|---|
| සියලු ම ආහාර නිෂ්පාදන | බීඉස් සහ ඒෆ්එස්එස්ඒඅයි විසින් සම්මත කරන ලද ප්‍රමිති හා රෙගුලාසි | ඉන්දීය ප්‍රමිති කාර්යාංශය (BIS) සහ ආහාර සුරක්ෂිතතා ප්‍රමිති අධිකාරී ආයතනය (FSSAI) |
| ශාක හා රෝපණ ද්‍රව්‍ය | බීජ, ශාක හා රෝපණ ද්‍රව්‍ය ආනයනය සඳහා නිකුත් කරන ලද ආනයන බලපත්‍ර | ශාක ආරක්ෂණය, නිරෝධායනය සහ ගබඩා කිරීම පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාලයය - කෘෂිකර්ම අමාත්‍යාංශය |
| පශු සම්පත් නිෂ්පාදිත | සනීපාරක්ෂක ආනයන බලපත්‍ර | ඉන්දියානු රජයේ සත්ත්ව පාලන දෙපාර්තමේන්තුව |

[55] ඉන්දියාවේ හා ශ්‍රීලංකාවේ ආහාර නිෂ්පාදිත පිළිබඳ අනුකූලතා ක්‍රියාමාර්ගවලට සම්බන්ධ ආයතන පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුවක් 'අ' සහ 'ආ' ඇමුණුම්වල දැක්වේ.

### 3.3.2.3. 4 සහ 5 වැනි පියවර : ප්‍රමුඛතා නිෂ්පාදිත සඳහා අවශ්‍ය අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි (CAPs) සාධනය සඳහා සහ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අනුකූලතා තක්සේරු ආයතනවල ශක්‍යතාව සහ විශ්වසනියත්වය තහවුරු කිරීම

ශක්‍යතාව යන්නෙන් අදහස් වන්නේ අවශ්‍ය අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටිය සිදු කිරීම සඳහා ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ අනුකූලතා තක්සේරු ආයතන සතු උපකරණ හා තාක්ෂණික හැකියාව ය. විශ්වසනීයත්වය යන්නෙන් අදහස් වන්නේ අවශ්‍ය පරීක්ෂණ / ක්‍රියා පටිපාටි සිදු කිරීම සඳහා ඒ ඒ අනුකූලතා තක්සේරු ආයතනයේ හැකියාව තෙවැනි පාර්ශ්වයක් විසින් සහතික කරනු ලැබ තිබේද යන්නය.

අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් ආරම්භ වන අදියරගත ප්‍රවේශය හේතුවෙන් අනුකූලතා තක්සේරු ආයතනය සතුව දැනටමත් ශක්‍යතාව හා විශ්වසනීයත්වය පවතින බැවින් ප්‍රමාදයකින් තොරව කටයුතු කළ හැකි ප්‍රමුඛතා නිෂ්පාදිත සම්බන්ධයෙන් එකී ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකය පිළිගැනීම ක්ෂණිකව ම ආරම්භ කිරීමට රටවලට හැකියාවක් ලැබේ.

### 3.3.3. අපනයන පරීක්ෂණ යෝජනාක්‍රමයක් / මණ්ඩලයක් ස්ථාපනය කිරීම

එක් එක් රට සතුව ජාතික ප්‍රමිති ආයතනයක් තිබුණත් නිෂ්පාදිතවල ප්‍රමිතීන් සම්බන්ධ රීති හා රෙගුලාසි මෙන් ම අනුකූලතාව සඳහා පරීක්ෂා කිරීම ආයතන විශාල සංඛ්‍යාවක් විසින් සිදු කරනු ලැබේ.[56] එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදිත හා රෙගුලාසි අනුව, අනුකූලතාව තක්සේරු කිරීමේ වගකීම පැවරෙන ආයතන ද වෙනස් වේ. අදාළ සියලු ම බලධාරීන් එකී ගිවිසුමේ පාර්ශ්වකරුවන් විය යුතු හෙයින් ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් මේ නිසා ගැටලුවක් ඇති වේ. රටේ අදාළ සියලු ම අනුකූලතා තක්සේරු ආයතන සමග සම්බන්ධව කටයුතු කරන සහ එකී නියෝජිත ආයතන විසින් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා / අනුකූලතා වාර්තා සඳහා සහතික කිරීමේ ආයතනය වශයෙන් කටයුතු කරන අපනයන පරීක්ෂණ මණ්ඩලයකට, ගිවිසුම ක්‍රියාත්මක කිරීම සහ ඵලදායිත්වය වැඩි දියුණු කිරීම කඩිනම් කිරීම සඳහා උපකාරී විය හැකිය (8 වැනි රූපසටහන බලන්න).


ඉන්දියාව දැනටමත් ආනයන පරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවා ඇත. වෙනත් කාර්යයන් රැසක් සමග ඉන්දියානු අපනයන පරීක්ෂණ සභාව (EIC), රටේ අනෙකුත් අදාළ අනුකූලතා තක්සේරු ආයතන සමග එක්ව කටයුතු කරන සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වෙමින්, නිෂ්පාදිත ආනයන රටේ ප්‍රමිතීන්ට අනුකූල වන බවට සහතික කරයි. අපනයන පරීක්ෂණ සභාව (EIC), ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට අදාලව අපනයන භාණ්ඩවල ගුණාත්මක භාවය පිළිබඳ සහතික කිරීමේ වගකීම පැවරී ඇති අපනයන පරීක්ෂණ නියෝජිත ආයතන (EIAs) පිටවීමේ වරායවල (චෙන්නායි, දිල්ලිය, කොච්, කල්කටාව සහ බොම්බාය) පවත්වාගෙන යයි.

අපනයන ඒකකවලදී ක්‍රියාත්මක වන තත්ත්ව සහතික ක්‍රම සහ ආහාර සුරක්ෂිතතා කළමනාකරණ ක්‍රම මගින් මෙන් ම නැව්බඩු වශයෙන් සිදු කරන පරීක්ෂණ මගින් ද මෙය සිදු කරනු ලැබේ.

---

[56] ආහාර නිෂ්පාදිත සම්බන්ධ ප්‍රමිති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන ආයතන පිළිබඳ විස්තර සඳහා 'අ' සහ 'ආ' ඇමුණුම් බලන්න.

**8 වැනි රූප සටහන : අපනයන පරීක්ෂණ නියෝජිත ආයතන දෙකක් අතර අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (EIC)පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) ක්‍රියාත්මක වීම**




අපනයන පරීක්ෂණ මණ්ඩලයක් (EIB) ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කිරීමෙන් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුවක් වනු පමණක් නොව තවත් අමතර ප්‍රතිලාභ කිහිපයක් ද එමගින් ඇති වේ. එනම් :

- අනෙකුත් රටවල් සමඟ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් ඇති කර ගැනීමට උපකාරී වීමටත්, ඒ හා සමඟ අනාගතයේදී වැඩි වැඩියෙන් නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම සඳහා වූ ශ්‍රී ලංකාවේ සැලසුම්වලට උපකාර වීමටත් හැකි වීම.
- සම්බන්ධ වීමේ තනි ඒකකයක් පමණක් තිබීම හේතුවෙන් ප්‍රමිති හා නියාමන අනුකූලතා සම්බන්ධයෙන් රටවල් අතර ඇති ආරාවුල් කඩිනමින් විසඳීම සඳහා උපකාරී වීමට හැකි වීම.
- ශ්‍රී ලාංකික අපනයනවල ගුණාත්මකභාවය පිළිබඳව ආනයනකරුවන් / ගැනුම්කරුවන් අතර විශ්වාසය ගොඩනැගීමට ද අපනයන පරීක්ෂණ මණ්ඩලයක් උපකාරී වේ. යම් ගැනුම්කරුවෙකු තුළ නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය පිළිබඳ සැක ඇති වේ නම්, ස්වකීය අවශ්‍යතාවලට නිෂ්පාදිතය අනුකූල වන බවට සනාථ කරන සහතිකයක් නිකුත් කරන ලෙස EIB වෙතින් ඉල්ලා සිටීමට ඔහුට හැකි ය.
- වංචනික අපනයනකරුවන් හේතුවෙන් අව්‍යාජ අපනයනකරුවන් අහිතකර ලෙස බලපෑමට ලක් වීම වැළකේ. උදා : ගම්මිරිස් ඇට ලෙස දක්වා පැපොල් ඇට අපනයනයන් වැළැක්වීමට අපනයන පරීක්ෂණ මණ්ඩලයට හැකි වේ.
- LF&VPPEA හිදි කරන ලද කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවලදී අනාවරණය වූ පරිදි ශ්‍රී ලංකාව දැනටමත් නිෂ්පාදිත විශේෂිත වූ අපනයන පරීක්ෂණ යෝජනාක්‍රමවලට ඇතුළත් වී තිබේ. උදා : ලංකා තේ

මණ්ඩලය සමග Ceylon tea සමාගම ද, අපනයන සංවර්ධන මණ්ඩලය සමග Ceylon Cinnamon සමාගම ද දැක්විය හැකිය. දැනට පවත්නා යෝජනා ක්‍රමවල ඉලක්කය වන්නේ එකී නිෂ්පාදනවල ශ්‍රී ලාංකික සන්නාම වර්ධනය කිරීමට සහාය වීම ය. එසේම අනෙකුත් නිෂ්පාදිත සඳහා ද අපනයන පරීක්ෂණ මණ්ඩලයක් තිබීම එකී නිෂ්පාදන සඳහා ද සන්නාම ප්‍රතිරූපයක් ගොඩනැගීමට උපකාරී වනු ඇත.

කෙසේ වුව ද, එවැනි පරීක්ෂණ යෝජනාක්‍රමයක් ස්වේච්ඡාවෙන් සහ ඉල්ලුම අනුව ගොඩනැගෙන ක්‍රමයක් වීම වැදගත් ය. එවැනි යෝජනා ක්‍රමයකින් වටිනාකම සැපයෙන්නේ නම් සහ අපනයනවලට තවත් නිලධාරීවාදී බාධකයක් ඇති නොවන්නේ නම් පමණක් අපනයනකරුවන් එවැන්නක් භාවිතා කරනු ඇත. අපනයනය කරනු ලබන භාණ්ඩ කෙරෙහි ගැනුම්කරුගේ විශ්වාසය වැඩිවීම අපනයන ඇණවුම් ලබාගැනීමට ඔවුන් සතු හැකියාව වැඩි වීම සහ ප්‍රවේශ වරායේදී අනුකූලතා පරීක්ෂාවන් නිසා වන පිරිවැය හා ප්‍රමාදයන් අඩු වීම යන මේ සියලු සාධක නැව්ගත කිරීමට පෙර පරීක්ෂාවට භාජන වීමට අපනයනකරුවන් සතු කැමැත්ත නිගමනය කරන සාධකයන් ය. තමන්ගේ අපේක්ෂාවන්ට භාණ්ඩ තොග අනුකූල වන බවට සහතික කිරීම සඳහා නියෝජිත ආයතනයෙන් සෘජුවම සහතිකයක් ඉල්ලා සිටිය හැකි ආනයනකරුවන්ට / ගැනුම්කරුවන්ට ද මෙ සේවය භාවිතා කළ හැකි වේ.

ගෝලීය වෙළෙඳපොළ තුළ පිරිවැය අනුව තවදුරටත් තරග නොකළ හැකි රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ගුණාත්මකභාවය සහ සන්නම් ප්‍රතිරූපය, අපනයන හා ගැනුම්කරුවන් රඳවා ගැනීමේදී ඉතා වැදගත් වේ. මේ සම්බන්ධයෙන් අපනයන පරීක්ෂණ මණ්ඩලයකට කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කළ හැකිය. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) වැනි ආනයන ප්‍රවර්ධන නියෝජිත ආයතනවල කාර්යභාරය ගැන ශ්‍රී ලංකාවට නැවත සිතීමට කාලය පැමිණ ඇත. අපනයන නගා සිටුවීම සඳහා මෙවැනි ආකාරයේ නව වගකීම් අපනයන සංවර්ධන මණ්ඩලයට පැවරීම සහ එහි නිපුණතා සහ පද්ධති උත්ශ්‍රේණිගත කිරීම එහි විශ්වසනීයත්වය සහ ඵලදායීත්වය වර්ධනය කරනු ඇත.

# නිගමනය

තීරුබදු නොවන බාධක (NTBs) වෙළෙඳාමට සැලකිය යුතු සංරෝධයක් වන අතරම මේ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා හැකි අවස්ථාවලදී සුදුසු පියවර ගැනීම ශ්‍රී ලංකාවට වැදගත්ය. දීර්ඝ කාලයක් ගතවන සහ පිරිවැය අධික අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (NTBs) හේතුවෙන් පැනනගින අනුකූලතාව හා සබැඳි තීරුබදු නොවන බාධක කෙරෙහි මේ වාර්තාව අවධානය යොමු කරයි. තම රටට ඇතුළු වන නිෂ්පාදිත එරට අනුගමනය කරන අදාළ ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා රටවල් විසින් එවැනි ක්‍රියාමාර්ග භාවිත කරනු ලැබේ. ප්‍රමිති හා රෙගුලාසි යනු පාරිභෝගිකයින්, පරිසරය හා සත්ත්ව සහ මිනිස් ජීවිත ආරක්ෂා කිරීම වැනි රාජ්‍ය ප්‍රතිපත්ති අරමුණු සපුරා ගැනීමේ වැදගත් මාර්ගයක් වන අතරම එකී ක්‍රියාමාර්ගය සමග අනුකූලතාව තක්සේරු කිරීම සඳහා භාවිත කරනු ලබන ක්‍රියාමාර්ගයන් සහ සබැඳි පිරිවැය හා කාලසීමාවන් අසාධාරණ වේ නම් එය වෙළෙඳාමට බාධකයක් බවට පත් වේ.

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ඉන්දියාවට අපනයනයන් සිදු කිරීමේදී තරගකාරී වාසියක් පැවතියේ වුව ද, අනුකූලතාව හා සබැඳි තීරුබදු නොවන බාධක අපනයනවලට අවහිරයක් විය හැකි වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කිරීම සඳහා මේ වාර්තාව ඉන්දියාවට සිදු කරනු ලබන ආහාර අපනයන පිළිබඳ ප්‍රත්‍යක්ෂය භාවිතයට ගනී. ඒ හැරුණු විට, 2002 දී සහ 2006 දී දෙරට සම්මත කරගෙන සිටි ගිවිසුම් ශ්‍රී ලාංකික අපනයනකරුවන් මුහුණ දෙන සංරෝධයන් නිසි පරිදි මඟ හැරීමට අසමත් වී තිබේ.

අනුකූලතාව හා බැඳුණු තීරුබදු නොවන බාධක, ආහාර වෙළෙඳාමට පමණක් සුවිශේෂී සංරෝධයක් නොවන අතර ම ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාමට ද සුවිශේෂී වූවක් නොවේ. මේ බාධකය ජයගැනීම සඳහා වෙනත් රටවල් විසින් අනුගමනය කරනු ලැබ ඇති සහ ලෝක වෙළෙඳ සංවිධාන ගිවිසුම් විසින් යෝජිත විවිධ ක්‍රියාමාර්ග තිබේ. එකී ක්‍රියාමාර්ග විග්‍රහ කරන මේ වාර්තාව මෙකී තීරුබදු නොවන බාධකවලට විසඳුමක් වශයෙන් අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි (CAPs) පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් (MRA) යෝජනා කරයි. අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් යනු, පිළිගත් නිසි බලය ඇති සහ ප්‍රතීතනය වූ රසායනාගාර හා පරීක්ෂා කිරීමේ ස්ථාන විසින් නිකුත් කරනු ලබන, ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට අනුකූලතාව පිළිබඳ සහතික පිළිගැනීමට පාර්ශ්වකරුවන් එකඟ වන, ගිවිසුමකි. වෙළෙඳ පාර්ශ්වකරුගේ ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූලතා වීම සඳහා ආරම්භක රටේ පරීක්ෂා කිරීමේ ස්ථානවලින් නිෂ්පාදිත පරීක්ෂා කරවා ගැනීමට මේ ගිවිසුම මගින් රාජ්‍යයන්ට හැකියාව ලැබේ. ඉන් පසුව, අදාළ සහතිකය සහිතව නිෂ්පාදිත යැවීමට රාජ්‍යයට හැකිවන අතර පිටවීමේ ස්ථානයේදී එක් එක් නැව් බඩු තොගය පරීක්ෂා කිරීමෙන් තොරව භාණ්ඩ නිෂ්කාශනය කරනු ලැබේ.

අවශ්‍ය පරිසරය දැනටමත් සකසනු ලැබ ඇති පරිදි, අනුකූලතා තක්සේරු ක්‍රියා පටිපාටි හේතුවෙන් ඇතිවන තීරුබදු නොවන බාධක පිළිබඳ ගැටලුව ඉතා ම ප්‍රායෝගික විසඳුමක් වන්නේ අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමය. CAPs සම්බන්ධ අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් පිළිබඳ සංකල්පය ඉන්දියාව සඳහා නව විසඳුමක් නොවන අතර ඉන්දියාව සිය වඩා මෑතකාලීන වෙළෙඳ ගිවිසුම්වල අන්‍යොන්‍ය පිළිගැනීමේ එකඟත්වයන් සඳහා දැනටමත් විධිවිධාන සලසා තිබේ. ඒ හැරුණු විට, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර යෝජිත CEPA ගිවිසුමේ ද අන්‍යොන්‍ය පිළිගැනීමේ එකඟත්වයක් සඳහා විධිවිධාන තිබේ. අනුකූලතාව හා සබැඳි තීරුබදු නොවන බාධක ජයගැනීම සඳහා වෙනත් බොහෝ රටවල් විසින් එය යොදාගැනීම එයට පක්ෂව ඇති තර්කයට රුකුලක් වී තිබේ. ශ්‍රී ලංකාව මේ අත ළඟින් ම එල්ලෙමින් තිබෙන පලතුරේ වාසිය ලබා ගත යුතුය.

කෙසේ වුවද අන්‍යොන්‍ය පිළිගැනීමේ එකඟත්වයට අත්සන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව සිහි තබා ගත යුතුය. අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීම සඳහා හවුල්කාර රටේ පරීක්ෂා කිරීමේ ස්ථානවල ධාරිතාව

හා විශ්වසනීයත්වය කෙරෙහි ඇති විශ්වාසය ගොඩනැගීමට හැකිවීම රටවලට වැදගත්ය. මේ සම්බන්ධයෙන් සැලකීමේදී එකී විශ්වාසය ගොඩනැගීම සඳහා රජයට ගත හැකි කිසියම් පියවර කිහිපයක් තිබේ. ඒවා නම්,

(i) අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම CEPA ගිවිසුමෙන් ඉවත් කිරීම;
(ii) අදියනේ අදියර පදනමක් මත අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟත්වය ක්‍රියාත්මක කිරීම
(iii) ශ්‍රී ලාංකික රසායනාගාරවල සහ පරීක්ෂණ ස්ථානවල ධාරිතාව වැඩි කිරීම සහ
(iv) අපනයන පිරික්සුම් යෝජනා ක්‍රමයක් / මණ්ඩලයක් ස්ථාපනය කිරීම

විශේෂයෙන් ම පෝක් සමුද්‍ර සන්ධියේ දෙපාර්ශ්වය අතර ම විශ්වාසය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන හා ආර්ථික සන්දර්භය තුළ අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟත්වයක් යනු අපට ලැබී ඇති අවස්ථාවකි. ඉන්දියානු වරායවලින් ශ්‍රී ලාංකික නිෂ්පාදිත මුදාහැරීමේ පහසුකම් සැලසීමෙන් ප්‍රධාන පෙළේ විභව්‍ය අපනයන අන්තයක් වශයෙන් ඉන්දියාව දෙස බැලීමට දේශීය පෞද්ගලික අංශය දිරිගැන්වෙනු ඇති අතර ම යෝජිත CEPA ගිවිසුමෙන් අපේක්ෂිත පරිදි වැඩිදුරටත් අනුකලනය වීම සඳහා උපකාරී වනු ඇත. අනාගත ද්විපාර්ශ්වික වෙළෙඳ කාර්යයන්හිදී ඉන්දියානු ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් සහ නියාමන බලධාරීන්ගෙන් තවදුරටත් සහයෝගය දිරිගැන්වීමටත් එය හේතු වනු ඇත.

# විමර්ශන


'A Briefing for Government and Regulators.' *European Co-operation for Accreditation.* 2013. Accessed 16th July 2015. http://www.european-accreditation.org/brochure/a-briefing-for-government-and-regulators

'Doing Business in India: 2012 Country Commercial Guide for U.S. Companies. '*International Trade Administration, Department of Commerce of USA.* 2012. http://export.gov/india/build/groups/public/@eg_in/documents/webcontent/eg_in_049379.pdf

'Free Trade Agreements'. *ADB Asia Regional Integration Center – Tracking Asian Integration*. http://aric.adb.org/fta-country

'Guidelines for developing a mutual recognition arrangement/agreement.' *World Customs Organisation*. 2011. http://www.wcoomd.org/en/topics/facilitation/instrument-and-tools/tools/~/media/29AC477114AC4D1C91356F6F40758625.ashx

'Implementing policy for external trade in the fields of standards and conformity assessment: A tool box of instruments.' *Commission of the European Communities*. 2001.

'Lanka in first mutual recognition agreement trade call with biggest global supplier.' *Daily FT.* 13th August 2014.http://www.ft.lk/article/336740/Lanka-in-first-mutual-recognition-agreement-trade-call-with-biggest-global-supplier

'Manual on Food Import Clearance System (FICS)', Food Safety and Standards Authority of India. 2013. http://www.fssai.gov.in/Portals/0/Pdf/Import_Manual%20(17.10.13).pdf

'NDDB says FSSAI is being aligned to global standards.' *Business Standard*. 19th February 2015. http://www.business-standard.com/article/pti-stories/nddb-says-fssai-is-being-aligned-to-global-standards-115021900838_1.html

'TACD Briefing Paper on Mutual Recognition Agreements'. *Trans Atlantic Consumer Dialogue*. 2001.

'Trade Agreements'. *Department of Commerce of the Government of India.*http://commerce.nic.in/MOC/international_trade_agreements.asp

'Standards.' *International Standards Organisations.*http://www.iso.org/iso/home/standards.htm.

'U.S.-Korea Equivalency Agreement'. *Organic Trade Association*. https://ota.com/resources/global-market-opportunities/trade-access-barriers/trade-agreements/us-korea-equivalency

'US-Japan Equivalency Agreement'. *Organic Trade Association*. https://www.ota.com/resources/global-market-opportunities/trade-access-barriers/trade-agreements/us-japan-equivalency

Agreement on Technical Barriers to Trade. 1995.

Agreement on Trade and Safety of Feed and Feed Ingredients between the Export Inspection Council of India, Ministry of Commerce and Industry, Government of India and The General Administration of Quality Supervision, Inspection and Quarantine of People's Republic of China. 2013.

Bureau of Indian Standards Act No. 63 of 1986

Chaffour, J. P. and Maur, J. C., 'Preferential Trade Agreements for Development: A Handbook.' *World Bank*, 2011. https://openknowledge.worldbank.org/bitstream/handle/10986/2329/634040PUB0Pref00Box0361517B0PUBLIC0.pdf?sequence=4

Comprehensive Economic Cooperation Agreement between the Government of Malaysia and the Government of the Republic of India. 2011.

Deb Pal, B. 'Non-Tariff Barriers Between India and Sri Lanka.' *Institute for Social and Economic Change*. 2015. http://www.slideshare.net/supriyaisec/ntb-45883142.

Devereaux, C., Lawrence, R. and Watkins, M. D., 'Case Studies in US Trade Negotiations: Making the Rules.' *Institute of International Economics.* 2006.

Elvestad, C. and Veggeland, F., 'International Trade and Guidelines on Equivalence and Mutual Recognition'. *Norwegian Agricultural Research Institute*. 2005.

Gazette Notification No. 1844/9 of 08th January 2014. http://www.slsi.lk/web/images/PDF_upload/ii-123%20items.pdf

Giang, L.E., 'ASEAN Regional Approaches to Standardization and Conformity Assessment Procedures and Their Impact on Trade'. *Bureau of Economic Integration, ASEAN Secretariat.* 2006. http://siteresources.worldbank.org/INTEAPREGTOPINTECOTRA/Resources/579386-1152907302538/Le_Chau_Giang.pdf

Helmers, C. and Pasteels, J-M. 'Assessing Bilateral Trade Potential at the Commodity Level: An Operational Approach.' *International Trade Centre.* 2006. http://legacy.intracen.org/mas/pdfs/pubs/2006-11-itc-wp-bilateral-trade-potential.pdf

Jayasuriya, S. 'World Accreditation Day.' *Daily News*. 12th June 2012, http://archives.dailynews.lk/2012/06/12/bus32.asp

Maur, J. C and Shepherd, B. 'Preferential agreements, regional cooperation and standards.' *World Trade Organisation.* 2011. https://www.wto.org/english/res_e/publications_e/wtr11_forum_e/wtr11_22feb11_e.htm

Osbourne, K. 'Improving the Business Environment.' 2002. http://www.apec.org.au/docs/fta2osb.pdf

Procedure for grant and operation of BIS License under foreign manufacturers certification scheme (FMCS)', Bureau of Indian Standards. http://www.bis.org.in/cert/fm.htm

Sri Lanka Standards Institution Act No. 6 of 1984

The Agreement on the Application of Sanitary and Phytosanitary Measures. 199

# 'අ' ඇමුණුම

## ශ්‍රී ලංකාවේ ප්‍රමිති හා රෙගුලාසි සමග අනුකූලතාව තක්සේරු කිරීමේ වගකීම පැවරෙන ප්‍රධාන ආයතන

| බලධාරියා | නිෂ්පාදිත | කාර්යය |
|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශය - ආහාර අධිකාරිය | සියලු ආහාර නිෂ්පාදිත | මේ පනත යටතේ සම්මත කරන ලද රෙගුලාසි වලට අනුකූල නොවන කිසිදු ආහාරයක් නිෂ්පාදනය කිරීමට, ආනයනය කිරීමට හෝ බෙදා හැරීමට කිසිදු පුද්ගලයෙකුට නොහැකි බවට 1980 අංක 26 දරන ආහාර පනත විධිවිධාන සලසා තිබේ. (ආහාර පනතේ 2 වැනි වගන්තිය)<br><br>- ආහාරවල අඩංගු වන ද්‍රව්‍ය<br>- ලේබල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ අවශ්‍යතා<br>- ආහාරයේ ප්‍රමිතිය, පවිත්‍රතාව, තත්ත්වය හෝ වෙනත් ලක්ෂණ සහ<br>- ආහාර අපනයනය<br>සම්බන්ධ රෙගුලාසි සෑදීමට අමාත්‍යවරයාට බලය ඇත.<br>ආහාරපාන යටතේ සම්මත වී ඇති රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරීම සඳහා සෞඛ්‍ය බලධාරීහු රට තුළට ඇතුළු වන ආහාර නිෂ්පාදිත පරීක්ෂාවට ලක් කරති. |
| ජාතික ශාක නිරෝධායන සේවය (NPQS) | කිසියම් හෝ වර්ධන අවධියක පසුවන සජීවී කෘමීන්, කුරුල්ලන් හෝ වෙනත් සතුන් හෝ කවර හෝ දිලීර වර්ධක වයිරස්, බැක්ටීරියා (සත්ව නිරෝධායනයට පොදුවේ ඇතුළත් වන සතුන් හැර) | ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ශාකයක හෝ ශාක නිෂ්පාදිතවල යම් පලිබෝධකයෙකු හෝ පලිබෝධ ඇත්දැයි පරීක්ෂා කිරීමේ වගකීම NPQS සේවය වෙත පැවරේ.<br>1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනතේ මූලධර්ම සහ එම පනත යටතේ සම්මත වී ඇති රෙගුලාසි ක්‍රියාත්මක කරයි.<br>ආනයනකරු විසින් ආනයන බලපත්‍රයක් සහ ශාක සනීපාරක්ෂක සහතිකයක් ලබා ගෙන තිබුණත් සංක්‍රාන්ති කාලසීමාව තුළ පලිබෝධ මගින් දූෂණය වීමේ හැකියාව පවතින හෙයින් සියලු ම ශාක ද්‍රව්‍ය ප්‍රවේශ වරායේදී නිරෝධායන පරීක්ෂණයට භාජන කරනු ලැබේ. |
| සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) | පශු සම්පත් හා පශු නිෂ්පාදිත | 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත -<br>1. සජීවී සත්ත්ව නිෂ්පාදන ආනයනය / අපනයනය සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම<br>2. ආනයන අවස්ථාවේදී, සත්ත්ව නිරෝධායන සහ පරීක්ෂණ නිලධාරියෙකු සහ සෞඛ්‍ය බලධාරී ආයතන නිලධාරී විසින් සත්ත්ව නිෂ්පාදිත භාණ්ඩ තොග පිළිබඳ ඒකාබද්ධ පරීක්ෂණයක් ඉටු කිරීම පිළිබඳ වගකීම දරයි. |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ආනයන පරීක්ෂණ යෝජනා ක්‍රමය යටතට ගැනෙන නිෂ්පාදිත. | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමිති ආයතනය වේ. නිෂ්පාදන සඳහා ප්‍රමිතීන් නියම කිරීම එහි වගකීම ය.<br>ඊට අමතරව, එය ආනයන පරීක්ෂණ යෝජනාක්‍රමය ද පවත්වාගෙන යන අතර මේ යෝජනා ක්‍රමය යටතට එන නිෂ්පාදිත අනුකූලතාව සඳහා SLSI විසින් පරීක්ෂා කරනු ලැබේ.<br>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙනත් ආනයන යෝජනා ක්‍රම ද පවත්වාගෙන යයි. මේ යෝජනාක්‍රමය යටතේ ආනයනකරුවන්ගෙන් ලැබෙන නිෂ්පාදිතවල අනුකූලතාව සහතික කිරීමේ වගකීම ඊට පැවරේ. |

## ඉන්දියාව තුළ ප්‍රමිති හා රෙගුලාසි සහිත නිෂ්පාදිතවල අනුකූලතාව තක්සේරු කිරීමේ වගකීම පැවරෙන ප්‍රධාන ආයතන

| බලධාරියා | නිෂ්පාදිත | කාර්යය |
|---|---|---|
| ඉන්දියානු ආහාර සුරක්ෂිතතා සහ ප්‍රමිති අධිකාරිය (FSSAI) | සියලු ම ආහාර නිෂ්පාදිත | ආහාර ද්‍රව්‍ය සඳහා ප්‍රමිති නියම කිරීම, ආහාර නිෂ්පාදනය, සැකසුම් කිරීම්, බෙදා හැරීම, අලෙවිය සහ ආනයනය පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලය වන්නේ FSSAI ආයතනයයි. එය සෞඛ්‍ය හා පවුල් සුභසාධන අමාත්‍යාංශය යටතේ පවතින අතර, එහි රීති හා රෙගුලාසිවලට අනුකූලව, ආහාර සුරක්ෂිතතාව පිළිබඳ කොමසාරිස්වරයෙක් එක් එක් ප්‍රාන්තයේ සිටී.<br>පහත දැක්වෙන කාර්යයන් එය සතු ය :<br>▪ ආහාර ද්‍රව්‍ය සඳහා ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ සම්බන්ධ රෙගුලාසි පැනවීම සහ ඒවා බලාත්මක කිරීම සඳහා වන ක්‍රමවේද ක්‍රියාවේ යෙදවීම<br>▪ ව්‍යාපාරවල ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති (FSMS) සහතික කරන ප්‍රතීතන සහතික ක්‍රියාමාර්ග සඳහා යාන්ත්‍රණයන් හා මාර්ගෝපදේශ සකස් කිරීම<br>▪ රසායනාගාර ප්‍රතීතනය සඳහා ක්‍රියාපටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම<br>▪ ආහාර සුරක්ෂිතතාව සහ අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ තොරතුරු මහජනතාවට සැපයීම<br>පනත සහ රෙගුලාසි යටතේ නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන නිෂ්පාදිත අනුමත කිරීමේ වගකීම ද FSSAI වෙත පැවරේ. තව ද, ආහාර ද්‍රව්‍ය ආනයන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම ද ඊට පැවරේ. |
| ඉන්දීය ප්‍රමිති කාර්යාංශය (BIS) | 1986 ඉන්දියානු ප්‍රමිති කාර්යාංශ පනත යටතේ නිෂ්පාදිත | BIS යනු පාරිභෝගික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඉන්දියානු ජාතික ප්‍රමිති මණ්ඩලය වන අතර ඉන්දියානු ප්‍රමිති ප්‍රවර්ධනය එමගින් සිදු කරනු ලැබේ. BIS නිෂ්පාදිත 90 ක් සම්බන්ධයෙන් අනිවාර්ය ප්‍රමිති බලාත්මක කරන අතර ඉන්දියාවේ ආනයන ප්‍රතිපත්තිය යටතේ ඇති ආහාර නිෂ්පාදිත 13ක් ඊට ඇතුළත් වේ. BIS හි ප්‍රධාන කාර්යයන් මෙසේය :<br>▪ ප්‍රමිති සකස් කිරීම<br>▪ සහතික කිරීම: නිෂ්පාදිත, ප්‍රමිති ලාංඡන සහ පද්ධති සකස් කිරීම<br>▪ විදේශීය නිෂ්පාදන යෝජනා ක්‍රම<br>▪ පරීක්ෂාව සහ ක්‍රමාංකන සේවා |
| ශාක ආරක්ෂාව, නිෂේධායනය සහ ගබඩා කිරීම, කෘෂිකර්ම සහ | පරිභෝජනය සඳහා ශාක සහ ශාක ද්‍රව්‍ය වැනි ශාක නිරෝධායනය යටතේ නිෂ්පාදිත (ඉන්දියාව තුළට ආනයන නියාමනය) පිළිබඳ නියෝගය, 2013 | 1914 DIP පනත සහ ඉන්පසුව නිකුත් කරන ලද ශාක නිරෝධායන (ඉන්දියාව තුළට ආනයන නියාමනය) නියෝගය, 2003 මගින් ඉන්දියානු සත්ත්ව හා ශාක ද්‍රව්‍යවලට හානිකර විදේශීය පළිබෝධ හා රෝග හඳුන්වාදීම වැළැක්වීම සඳහා ආනයනික කෘෂිකාර්මික භාණ්ඩ පරීක්ෂා කිරීමේ වගකීම අධ්‍යක්ෂ කාර්යාලය |

| | | |
|---|---|---|
| සහයෝගිතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කාර්යාලය | | සතුය. එසේ ම, පළිබෝධ රහිත වෙළෙඳාම පහසු කරවීම පිළිබඳ 1951 ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතිය යටතේ වන අවශ්‍යතා ප්‍රකාරව අපනයනය සඳහා අපේක්ෂිත ශාක ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ වගකීම ද ඊට පැවරී ඇත. ශාක ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශාක ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳ ජාතික ප්‍රමිතීන් අධ්‍යක්ෂ කාර්යාලය විසින් අනුගමනය කරනු ලැබේ.<br>ශාක නිරෝධායනයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වයන් මෙසේ යඃ<br>▪ කෘෂිකාර්මික නිෂ්පාදිත සුරක්ෂිත ලෙස ආනයනය පහසු කරවීම සඳහා අතිරේක ප්‍රකාශන සහ විශේෂ කොන්දේසි සහිතව ආනයන බලපත්‍ර නිකුත් කිරීම<br>▪ හඳුනාගන්නා ලද ශාක ද්‍රව්‍ය පිළිබඳ පශ්චාත් ප්‍රවේශ නිරෝධායන පරීක්ෂාව සිදු කිරීම<br>▪ ශාක ආරක්ෂණ සහතික කිරීම පිළිබඳ කටයුතු සිදු කිරීම (ශාක ආරක්ෂණ සහතික නිකුත් කිරීම සඳහා) |
| සත්ත්ව නිරෝධායන හා සහතික කිරීමේ සේවා (AQCS), සත්ත්ව පාලන, පශු පාලන සහ ධීවර | 1898 පශු සම්පත් ආනයන පනත සහ 2011 පශු සම්පත් ආනයන (සංශෝධන) පනත යටතේ මස් හා මස් නිෂ්පාදන, බිත්තර, කිරි සහ වෙනත් නිෂ්පාදන ඇතුළු සත්ත්ව නිෂ්පාදන | AQCS හි මූලික අරමුණ වන්නේ පශු සම්පත් ආනයන පනත සහ රෙගුලාසි සම්බන්ධ නියෝග සහ ඒ යටතේ නිකුත් කර ඇති SPS ප්‍රමිතීන් ප්‍රකාරව ඉන්දියාවට ආගන්තුක පශු සම්පත් හා කුකුළු රෝග රට තුළට ඒම වැළැක්වීම ය. සත්ත්ව නිෂ්පාදන ආනයනය සඳහා විරුද්ධත්වය ප්‍රකාශ නොකිරීමේ සහතිකය හා පශු සම්පත් නිෂ්පාදිත සඳහා ආනයනය හා අපනයනය පිළිබඳ සහතිකය AQCS විසින් නිකුත් කරනු ලැබේ. |

# 'ඇ' ඇමුණුම

## වෙනත් රටවල් විසින් ක්‍රියාත්මක කරනු ලබන අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්

- **යුරෝපීය ප්‍රජාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ගිවිසුම (1998)**

  එක්සත් ජනපදය සහ යුරෝපීය ප්‍රජාව වෙළෙඳාමට භාජන වන නිෂ්පාදිත මාලාවක් සඳහා පරීක්ෂාව, පරීක්ෂණ පැවැත්වීම සහ සහතික කිරීමේ අවශ්‍යතා පිළිගැනීම සඳහා 1998 දී අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් කිහිපයකට ම ඇතුළත් විය. ඒ අනුව අංශ 6 ක් සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම අත්සන් කරනු ලැබිණ. ඒවා නම්, වෛද්‍ය උපකරණ, ඖෂධ නිෂ්පාදන, ක්‍රීඩා සහ විනෝදාස්වාද භාණ්ඩ, විදුලි සංදේශ, විද්‍යුත් චුම්බක සංගතතා (EMC) පරීක්ෂා කිරීමේ සේවා සහ විදුලි උපකරණ ය.

  එක්සත් ජනපද හා යුරෝපීය ප්‍රජාවේ රටවල් තමන්ගේ ම අභ්‍යන්තර ප්‍රමිති මාලාවක් පවත්වාගෙන යන අතර යුරෝපීය ප්‍රමිති සඳහා එ. ජ. තුළ ද, එ.ජ ප්‍රමිති සඳහා යුරෝපය තුළ ද නිෂ්පාදිත පරීක්ෂා කිරීම සඳහා නිෂ්පාදකයින්ට ගිවිසුමෙන් ඉඩ සැලසේ. එක් එක් කාර්මික අංශය සඳහා වෙන වෙන ම සාකච්ඡා පවත්වා ඇත. අන්‍යෝන්‍ය අනුකූලතා තක්සේරු ක්‍රියාමාර්ග පිළිගැනීම පිළිබඳ සාකච්ඡා පැවැත්වීමට උනන්දුව ඇති වූයේ රෙගුලාසි සංගත කිරීම අනුගමනය කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයක් අසාර්ථක වීමෙන් පසු ය.

- **ඕස්ට්‍රේලියානු රජය සහ සිංගප්පූරු ජනරජයේ ආණ්ඩුව අතර අනුකූලතා තක්සේරුව පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (2001)**

  2001 දී බලාත්මක වූ ඕස්ට්‍රේලියා - සිංගප්පූරු අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම මගින්, දෙරට අතර වෙළෙඳාමට බාධක වන තීරුබදු නොවන බාධක (තාක්ෂණික හා නියාමනික) අඩු කිරීම වෙනුවෙන් අනෙක් පාර්ශ්වයේ භූමි ප්‍රදේශයට අපනයනය කිරීමට අපේක්ෂිත නිෂ්පාදිත හා ඒවා නිෂ්පාදනය කරන්නන් සම්බන්ධයෙන් අපනයනය කරන රටේදී අනුකූලතා තක්සේරුව (පරීක්ෂා කිරීම, පරීක්ෂා කොට සහතික කිරීම) සඳහා විධිවිධාන සලසන ලදී. අනුකූලතා තක්සේරු මණ්ඩල (CABs) විසින් නිකුත් කරනු ලබන පිරික්සුම් වාර්තා හා සහතික දෙරටේ ම නියාමන බලධාරීන් විසින් පිළිගැනීම සඳහා මේ ගිවිසුමින් විධිවිධාන සලසා ඇත.

  අංශ දෙකක, එනම් (1) විදුලි හා විද්‍යුත් උපකරණ අංශය, සහ (2) විදුලි සංදේශ උපකරණ අංශය, නිෂ්පාදිත මේ ගිවිසුමේ කරුණුවලට ඇතුළත් විය. ඊට අමතරව, නිෂ්පාදිතවලට වඩා ඖෂධීය නිෂ්පාදිත අංශයේ නිෂ්පාදිත සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය ද ඊට ඇතුළත් ව ඇත.

- **කැනඩාව සහ යුරෝපීය ප්‍රජාව අතර අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම (1998)**

  කැනඩා - යුරෝපීය ප්‍රජා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම 1998 දී අත්සන් කරන ලද අතර, කැනේඩියානු නීතිය අනුව අවශ්‍ය වන අනුකූලතාව පිළිබඳ සහතික ඇතුළු අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල සහ මේ ගිවිසුම ප්‍රකාරව යුරෝපීය ප්‍රජාවේ තක්සේරු මණ්ඩල හෝ බලධාරීන් විසින් පිළිගනු ලබන රෙගුලාසි, කැනේඩියානු රජය විසිනුත් එසේ ම අනෙක් පාර්ශ්වය විසිනුත් පිළිගැනීම සඳහා එමගින් විධිවිධාන සලසන ලදී. ක්ෂේත්‍ර හයක් සඳහා ආංශික ඇමුණුම් (Sectoral Annexes) අත්සන් කරන ලදී. විදුලි සංදේශ පර්යන්ත උපකරණ, විද්‍යුත් චුම්බක සංගතතාව (EMC) විදුලිය සුරක්ෂිතතාව, ක්‍රීඩා සහ විනෝදාස්වාද භාණ්ඩ, භාණ්ඩ නිෂ්පාදන භාවිතයන් සහ වෛද්‍ය උපකරණ.

# 'ඇ' ඇමුණුම

## සිංගප්පූරුව සහ මැලේසියාව සමඟ ඉන්දියාවේ වෙළෙඳ ගිවිසුම්වල ඇති අනුකූලතා තක්සේරු ක්‍රියාපටිපාටි සම්බන්ධ අන්‍යොන්‍ය පිළිගැනීම සඳහා වන විධිවිධාන

- **ඉන්දියා - සිංගප්පූරු විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම** (2005)

  ආංශික ඇමුණුම්වල විශේෂිතව දැක්වෙන භාණ්ඩ වෙළෙඳාම සම්බන්ධයෙන් අන්‍යොන්‍ය පිළිගැනීමේ මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා 5 වැනි පරිච්ඡේදයේදී විධිවිධාන යොදා ඇත. 5.1 වගන්තිය අනුව 'අන්‍යොන්‍ය පිළිගැනීම' යන්නෙන් අදහස් වන්නේ අනෙක් පාර්ශ්වය විසින් අන්‍යොන්‍ය ආකාරයෙන් සැලකීම ලබා දී ඇති ප්‍රමාණය අනුව එක් එක් පාර්ශ්වය, පාර්ශ්වය විසින් නියම කරනු ලබන අනිවාර්ය අවශ්‍යතාවලට නිෂ්පාදිතවල අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රති-පාර්ශ්වයේ අනුකූලතා තක්සේරු ක්‍රියාකාරිත්වයන්ගේ ප්‍රතිඵල පිළිබඳ නිරීක්ෂණ වාර්තා සහ සහතිකය පිළිගන්නා බවය. ගිවිසුමේ ආංශික ඇමුණුම් වන 5 'අ' ඇමුණුම (විදුලි සංදේශ උපකරණ), 5 'ආ' ඇමුණුම (ආහාර නිෂ්පාදන) සහ 5 'ඇ' ඇමුණුම (ඉලෙක්ට්‍රොනික් සහ විද්‍යුත් උපකරණ) අංශ මගින් විශේෂිත නිෂ්පාදිත සම්බන්ධ විස්තර සහිත ක්‍රියාත්මක කිරීමේ සැකැස්ම සඳහා විධිවිධාන සලසයි. මේ අංශ සම්බන්ධයෙන් වන සැකැස්ම ක්‍රියාවේ යොදවන අතරතුර අනෙකුත් නිෂ්පාදන අංශ සම්බන්ධ ආංශික ඇමුණුම් අවසන් කිරීමට පාර්ශ්වයන්ට හැකි ය.

- **ඉන්දියා - මැලේසියා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම** (2011)

  'අනුකූලතා තක්සේරු පටිපාටිවල ප්‍රතිඵල පිළිගැනීම පහසු කරවීම උදෙසා යෝග්‍ය යාන්ත්‍රණයන් සමූහයක් මගින් පිරිවැය සාඵල්‍යතාව සහතික කිරීම, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, කාර්ය ද්විගුණනය වැළැක්වීම" සඳහා වන අවශ්‍යතාව 7 වැනි වගන්තියෙන් සාකච්ඡා වේ. මේ සඳහා ප්‍රතීතන ක්‍රියාමාර්ග [57] භාවිත කිරීම, අනුකූලතා තක්සේරු පටිපාටිවල ප්‍රතිඵල හඳුනාගැනීම සහ පිළිගැනීම [58] සහ සිය භූමි ප්‍රදේශයන්හි අනුකූලතා තක්සේරු මණ්ඩල අතර එකඟත්වයන් මගින් එකිනෙකාගේ තක්සේරු පටිපාටිවල ප්‍රතිඵල සඳහා පහසුකම් සැලසීම සහ පිළිගැනීම [59] ඇතුළත් වේ. CECA ගිවිසුමේ 7.9 වගන්තිය, රාජ්‍යයන් දෙක විසින් තීරණය කරනු ලබන අංශවල අන්‍යොන්‍ය පිළිගැනීමේ ගිවිසුමක් අවසන් කිරීම සඳහා විධිවිධාන සලසයි.

---

[57] ඉන්දියාව හා මැලේසියාව අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමේ 7, 8, 1(a) වගන්තිය

[58] ඉන්දියාව හා මැලේසියාව අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමේ 7, 8, 1(b)සහ (c)වගන්ති

[59] ඉන්දියාව හා මැලේසියාව අතර විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමේ 7, 8, 1(e)වගන්තිය

# 'ඉ' ඇමුණුම

## අපනයන විභව්‍ය දර්ශක

අනුකූලතා තක්සේරු පටිපාටි බලපෑම සහ තීරුබදු බලපෑම පදනම් කරගෙන නිෂ්පාදිත ප්‍රමුඛතාගත කිරීමෙන් පසු ඒවායේ අපනයන විභව්‍යතාව තක්සේරු කිරීම වැදගත්ය. ආනයනය කරන රටේ ප්‍රමිතීන්ට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා අපනයනය කරන රටේ ආණ්ඩුවල අනුකූලතා තක්සේරු මණ්ඩල විසින් උපකරණ හා පුහුණුව සඳහා ආයෝජනය කිරීම අවශ්‍ය විය හැකි ය. එවැනි ආයෝජනවල පිරිවැය, වඩා ඉහළ ආයෝජන ප්‍රකාරව රටට ඇතිවන ප්‍රතිලාභ අනුව තක්සේරු කිරීම අවශ්‍ය ය. උදාහරණයක් වශයෙන් යම් නිෂ්පාදිතයක ඇත්තේ ඉතා අඩු අපනයන විභව්‍යතාවයක් නම් එකී නිෂ්පාදිතය දියුණු කිරීම සඳහා වර්තමාන යටිතල ව්‍යුහය ඉහළ නැංවීම සඳහා විශාල ආයෝජනයක් සිදු කිරීම ප්‍රඥාගෝචර නොවිය හැකි ය. පහත දැක්වෙන්නේ අපනයන විභව්‍යතාව තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි දර්ශක දෙකකි.

### I. අනාවරණය වූ තුලනාත්මක වාසිය පිළිබඳ බැලස්සා දර්ශකය (Balassa Index of Revealed Comparative Advantage) (RCA)

යම් නිෂ්පාදිතයක් සම්බන්ධ අපනයන සඳහා රටක් කොතරම් දුරකට විශේෂායනය වී තිබේද යන්න RCA මගින් මනිනු ලැබේ. P නමැති රටක් X නමැති නිෂ්පාදනය අපනයනය කරන්නේ යැයි සිතමු.

එවිට

$$RCA = \frac{\text{P රටේ X නිෂ්පාදිත අපනයනයන් / P රටේ මුළු අපනයන}}{\text{ලෝකයේ X නිෂ්පාදිත අපනයනයන්/ලෝකයේ මුළු අපනයන}}$$

උදාහරණ : "P" රටේ "X" නිෂ්පාදිතයේ RCA

| P රට | ඇ.ඩො.මි | ලෝකය | ඇ.ඩො.මි |
|---|---|---|---|
| X නිෂ්පාදිත අපනයන | 2 | X නිෂ්පාදිත අපනයන | 4,000 |
| මුළු අපනයන | 1,000 | මුළු අපනයන | 15,000,000 |

X නිෂ්පාදනය සම්බන්ධයෙන් P රටේ අනාවරණය වූ තුලනාත්මක වාසිය ගණනය කරන්නේ මෙසේය :

$$RCA = \frac{2}{4000} \Big/ \frac{1000}{15000000} = 7.5$$

මෙයින් අදහස් වන්නේ ලෝකයේ X නිෂ්පාදිත අපනයනයට වඩා P රට 7.5 ගුණයක් X නිෂ්පාදිත අපනයනය තුළ විශේෂායනය ලබා ඇති බවය. $RCA > 1$, වේ නම් ඉන් අදහස් වන්නේ ලෝකයට වඩා තුලනාත්මක වාසියක් (උදා : වැඩියෙන් විශේෂායනය) රටට තිබෙන බවය. දර්ශක අගය ඉහළ යන්නට යන්නට වාසිය වැඩිය. $RCA < 1$, වේ නම්, ඉන් අදහස් වන්නේ ලෝකයට වඩා තුලනාත්මක අවාසියක් (අඩු විශේෂායනයක්) රටට තිනෙ බවය. දර්ශක අගය කුඩා වන්නට වන්නට අවාසිය වැඩිය.

කෙසේ වුව ද, නිෂ්පාදනය කරන රට අපනයය කරන රටක් ද වන අවස්ථාවලට මේ දර්ශකය සීමා වේ. රටක් අපනයනය සඳහා නොව දේශීය පරිභෝජනය සඳහා නිෂ්පාදනය කරන අවස්ථාවලදී RCA නිෂ්පාදනයක් සම්බන්ධයෙන් රටේ තුලනාත්මක වාසිය අවතක්සේරු කරයි.

## II. සාපේක්ෂ සූචක වෙළෙඳ විභව්‍යතාව (Relative Indicative Trade Potential) (RITP)

වෙළෙඳ හවුල්කරුවන් අතර වැඩිදුර වෙළෙඳාම සඳහා ඉහළම විභව්‍යතාවක් තිබෙන නිෂ්පාදිත හඳුනාගැනීම සඳහා RITP භාවිත කළ හැකිය.[60]

RITP = min (P රටේ x නිෂ්පාදිත අපනයනය, Q රටේ x නිෂ්පාදිත ආනයනය) - P රටේ x Q නිෂ්පාදිතය Q රටට අපනයනය කිරීම්
P රටේ X නිෂ්පාදිතය අපනයනය කිරීම සඳහා P රටේ වෙළෙඳ විභව්‍යතාව

උදාහරණය :"Q" රටට "X" නිෂ්පාදිතය අපනයනය කිරීම සඳහා "P" රටේ වෙළෙඳ විභව්‍යතාව

| P රට | ඇ.ඩො.මි. | Q රට | ඇ.ඩො.මි. |
|---|---|---|---|
| X නිෂ්පාදිතය ලෝකයට අපනයනය | 2 | X නිෂ්පාදිතය ආනයනය | 5 |
| X නිෂ්පාදිතය Q රටට අපනයනය | 1 | | |

RITP = min (ඇ.ඩො.මි. 2, ඇ.ඩො.මි.5) - ඇ.ඩො.මි. 1 = ඇ.ඩො.මි. 2 - ඇ.ඩො.මි. 1 = 0.5
ඇ.ඩො.මි.2 ඇ.ඩො.මි.2

මින් අදහස් වන්නේ P රටේ සමස්ත X නිෂ්පාදිත අපනයනවලින් අමතර 50% ක් අවශෝෂණය කර ගැනීමේ විභව්‍යතාව Q රටට ඇති බවය. RITP අගය 0 ට ළං වන තරමට P රටේ X නිෂ්පාදිත අවශෝෂණය කර ගැනීම සඳහා Q රටට ඇති විභව්‍යතාව අඩු වන අතර X නිෂ්පාදිතයේ අපනයන අන්තයක් වශයෙන් P රට Q රට මත යැපෙන ප්‍රමාණය වැඩි වේ. RITP 1 ට ආසන්න වන තරමට X නිෂ්පාදිතය තවදුරටත් වෙළෙඳාම් කිරීම සඳහා ඇති විභව්‍යතාව වැඩියෙන් පවතී. නව සහ පවත්නා වෙළෙඳපොළවල නිෂ්පාදිත ව්‍යාප්තිය තක්සේරු කිරීම සඳහා මේ මිම්ම ප්‍රයෝජනවත් වේ.

දර්ශකයේ දුර්වලතාව නම්, සිද්ධාන්තයක් වශයෙන්, අපනයනය කරන රටේ අතිරික්ත අපනයන සඳහා හොඳ ම ආදේශකයක් බවට ආනයනය කරන රට පත් විය හැකි යැයි ද එය ම අනෙක් පැත්තටත් සිදු විය හැකි යැයි ද යනුවෙන් ඇති ප්‍රබල උපකල්පනයයි. තව ද, RCA දර්ශකයේදී මෙන් අඩු RITP අගයක් තිබීමෙන්, රටවල් දෙක අතර වෙළෙඳ විභව්‍යතාවක් නැත යන්න අවශ්‍යයෙන් ම අදහස් නොවේ. ඊට හේතුව වෙළෙඳ ද්‍රව්‍යය අපනයනය නොකොට නිෂ්පාදනය කරනු ලැබිය හැකි වීම ය. එබැවින්, ප්‍රතිඵල යනු හුදෙක් නිෂ්පාදිතවල අපනයන විභව්‍යතාවට හිමි ස්ථානය (තරාව) දක්වන මාර්ගෝපදේශයක් පමණි.

---

60 හෙල්මර්ස්, සී. සහ පැස්ටීල්ස් ජේ. "වෙළඳ භාණ්ඩ මට්ටමේදී ද්විපාර්ශ්වික වෙළෙඳ විභව්‍යතාව තක්සේරු කිරීම : කාර්යක්මක ප්‍රවේශය" ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය, 2006.